ISSN 2420-7381

# සමාජ සංඛ්‍යානය ශාස්ත්‍රීය සංග්‍රහය

# 2019

හයවන වෙළුම, පළමු වන කලාපය

# Journal of Social Statistics

# 2019

**Volume 06, Issue 01**

ප්‍රකාශනය
සමාජ සංඛ්‍යානය විෂය ශිෂ්‍ය සංගමය
සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව

සමාජ සංඛ්‍යානය ශාස්ත්‍රීය සංග්‍රහය 2019 - සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශයේ සමාජ සංඛ්‍යානය විෂය ශිෂ්‍ය සංගම් වාර්ෂික ප්‍රකාශනය

මුද්‍රණය 2019 නොවැම්බර්

ISSN 2420-7381

සංස්කාරක : සහකාර කථිකාචාර්ය ලෂිනි ලියනගේ

සහාය සංස්කාරක : සහකාර කථිකාචාර්ය පී. ජී. ටී. එන්. පෙරේරා

ආර්. ආර්. ඒ. එල්. ඩබ්. රණතුංග

එම්. කේ. අයි. ඒ. බණ්ඩාර

ඩී. එච්. බෝපිටිය

කවර නිර්මාණය : රුමාල් වින්දුල

හයවන වෙළුම, පළමු වන කලාපය

මෙම ශාස්ත්‍රීය සංග්‍රහයේ ඇතුළත් ශාස්ත්‍රීය ලිපිවල අන්තර්ගත කරුණු සම්බන්ධ වගකීම කර්තෘන් සතුවන අතර, ඒ සඳහා සංස්කාරක මණ්ඩලය වගකීමක් නොදරයි.

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශයේ සමාජ සංඛ්‍යානය විෂය ශිෂ්‍ය සංගමය විසින් ප්‍රකාශයට පත් කරන සමාජ සංඛ්‍යානය ශාස්ත්‍රීය සංග්‍රහයෙහි හයවන වෙළුම, පළමු වන කලාපය ප්‍රකාශන අනුග්‍රහය

# සඟරා ලිපි විමර්ශන මණ්ඩලය


- මහාචාර්ය එම්. එම්. ගුණතිලක මයා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)
  *B.A. (Kel'ya), M.A. (S.J'pura), Ph.D (Kel'ya)*

- මහාචාර්ය එච්. ආර්. අනුලාවතී මැණිකේ මිය (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)
  *B.A. (Kel'ya), M.A. (S.J'pura), Ph.D (Pune)*

- ආචාර්ය මංජුල ගුණරත්න මයා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)
  *B.A. (Kel'ya), M.S.Sc (Kel'ya), Ph.D (UMS)*

- ආචාර්ය එච්. ආර්. එස්. සුලෝචනී මිය (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)
  *B.A. (Kel'ya), M.A.(ROK), Ph.D (SNU)*

- අපේක්ෂා ඇඹුල්දෙණිය මිය (ආධුනික කථිකාචාර්ය)
  *B.A. (Kel'ya), PQHRM (IPM)*

- දිලුෂි කොඩිතුවක්කු මෙය (ආධුනික කථිකාචාර්ය)
  *B.A. (Kel'ya)*

# Message from the Vice Chancellor

# University of Kelaniya



It is a great honour for me to give this congratulatory message for the "$6^{th}$ Journal of Social Statistics (JSS) – 2019", which publishes under STATICA – 2019, organized by the Social Statistics Students' Association, Department of Social Statistics, University of Kelaniya.

Throughout the last six years, Department of Social Statistics has been a great pillar for the students, who are willing to share their research findings with others. Obviously, university itself encourage those who participate in this kind of work, and we hope that these research findings will do a great service to the future undergraduates also to improve their knowledge.

University contains a culture, which is combined with researches, and research culture is a part when these undergraduates continue their post graduate studies. Therefore "JSS- the $6^{th}$ Journal of Social Statistics – 2019" will lead the new researchers on their way, in a correct path.

As the vice chancellor of University of Kelaniya, I would like to wish the Social Statistics Students' Association members, organizing committee, and all the participants' success on their work.

**Professor D. M. Semasinghe**

Vice Chancellor

University of Kelaniya

# Message from the Deputy Vice Chancellor

# University of Kelaniya



It is indeed a great pleasure for me to give my congratulatory note on "6th Journal of Social Statistics (JSS) – 2019". The journal publishes by the Social Statistics Students' Association, Department of Social Statistics, is held under the "STATICA" program.

As the university we are very grateful, to the Social Statistics Students' Association, Department of Social Statistics for organizing such a meaningful program, where undergraduates can open the opportunities to enter the world of research. Moreover, university is always willing to help those who have a favor on this kind of work. On the other hand, these organizing committees also help the university to uplift research works. Therefore, organizing committee of the "STATICA" is always invited to ask for any help, regarding their program's improvement.

Obviously, we encourage, Department of Social Statistics to continue this program in the future and give vital opportunities to more undergraduates. All the undergraduates are invited to take the advantage of this valuable program by sending your research findings.

I heartily wish the Social Statistics Students' Association members, organizing committee, and all the participants' to be success on their work and I appreciate this tremendous effort of them.

**Senior Professor Lakshman Senevirathne**

Deputy Vice Chancellor

University of Kelaniya

# Message from the Dean
# Faculty of Social Sciences



It is with great pleasure that I issue this message on the occasion of the "6th Journal of Social Statistics (JSS) – 2019", organized by the Social Statistics Students' Association, Department of Social Statistics, University of Kelaniya.

Training undergraduates to engage in high quality research is very important, as they are our future researchers. It is not only conducting research, but also publishing the research findings in reputed journals is equally important in order to use them for the enhancement of knowledge and national development.

Therefore, the faculty of Social Sciences always encourage the researchers to take the best opportunities to have the best experiences which can make their carrier a success. Therefore "JSS-2019" will be a platform to those who are willing to develop their research skills.

I congratulate head of the department, organizing committee and all the undergraduates who participate to the program and wish them every success.

**Professor A. H. M. H. Abayarathne**

Dean

Faculty of Social Sciences

University of Kelaniya

# Message from the Head

# Department of Social Statistics



It is a great privilege for me to convey a message on the "6th Journal of Social Statistics (JSS) – 2019", organized by the Social Statistics Students' Association, Department of Social Statistics, University of Kelaniya. This is organized under the STATICA major program.

The Journal of Social Statistics, is an immense support for the young researchers to develop their research skills and academic writing as well. As the Department we always dedicate in motivating researchers to publish adequate research findings. Throughout the previous occasions, Department of Social Statistics has opened many chances to young researchers to improve their knowledge on research culture. On this purpose, I believe, JSS-2019 will be simply remarkable among the others.

I would like to offer my sincere gratitude to the Vice Chancellor, University of Kelaniya for his financial support towards this event. Finally, I wish all the members of organizing committee and all the participants their work a success.

**Dr. Manjula Gunarathna**

Head of the Department

Department of Social Statistics

University of Kelaniya

# Message from the Chairman
# Research Council
# University of Kelaniya



It is with great pleasure that I convey this message to the "Journal of Social Statistics (JSS) – 2019" which is published under STATICA Program by the Social Statistics Students' Association, Department of Social Statistics, University of Kelaniya.

Training undergraduates to engage in high quality research is very significant as they are our future researchers. It is not only conducting research, but also publishing it in a journal is equally important in order to use them for the enhancement of knowledge and national development.

I congratulate the coordinator and the organizing committee for publishing the "Journal of social Statistics (JSS) 2019" successfully.


**Senior Professor N.P. Sunil-Chandra**

Chairman of the Research Council

University of Kelaniya

# Message from the Editor

# Journal of Social Statistics (JSS)



The Journal of Social Statistics (JSS), will be published its 6th volume in 2019 by the Social Statistics Students' Association, Department of Social Statistics, University of Kelaniya.

The aim of JSS is to provide a forum for the dissemination of original research, which publishes bi-annually in the multidisciplinary areas of research. We are keen to encourage publication of high quality evidence-based researches in all the categories of academia in a broad sense with a quantitative perspective, by authors who are doing their bachelor's degree in Social Statistics at University of Kelaniya. This helps young researchers to develop their research skills and academic writing skills too.

I would like to express my heartiest gratitude to Dr. K. M. L. M. Manjula Gunarathna, Head, Department of Social Statistics for his enormous guide and support for this event. As well as I would like to thank all the Senior Professors, Professors, Senior Lecturers and Lecturers for reviewing articles and their guidance in this event. And I thank all our submitting authors, who have toiled in the production of their work.

Finally, I would like to thank all those who helped us to make this event a success and I strongly encourage you to submit novel and enlightening manuscripts to educate and support the growing academic world and I wish all the participants to have a successful future.

**Ms. Lashini Liyanage**
Assistant Lecturer
Department of Social Statistics
University of Kelaniya

# සමාජ සංඛ්‍යානය විෂය ශිෂ්‍ය සංගමය

# නිලධාරී මණ්ඩලය

| | |
|---|---|
| සභාපති | එම්. කේ. අයි. ඒ. බණ්ඩාර |
| උප සභාපති | ඒ. ඩී. සේනාරත්න |
| ලේකම් | ඩී. යූ. පී. දසනායක |
| සම ලේකම් | කේ. පී. වයි. ක්‍රිෂානි |
| භාණ්ඩගාරික | එස්. එන්. කේ. කරුණාරත්න |
| සඟරා සංස්කාරක | ආර්. ආර්. ඒ. එල්. ඩබ්. රණතුංග |
| කමිටු සාමාජිකයන් | බී. ජී. ටී. ඩී. බණ්ඩාර |
| | ඩී. එස්. අබේසිංහ |
| | ඊ. පී. පී. හර්ෂණි |
| | එස්. ඒ. එස්. ඩී. ජයතිලක |
| | එච්. ඩබ්. කේ. එම්. එල්. චන්ද්‍රසේන |
| | එම්. කේ. ඩී. විතානවසම් |

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික | අපේක්ෂා ඇඹුල්දෙණිය |
| | (ආධුනික කථිකාචාර්ය) |

## පටුන

ශ්‍රී ලංකාවේ ජන සංයුතියෙහි ව්‍යුහාත්මක වෙනස්කම් ……………………...…. 1

දෙමව්පියන් විදේශගත වීම පවුලේ ආර්ථිකය හා දරුවන් කෙරෙහි ඇති කරන බලපෑම………………………………………………………………....13

Time to First Employment ………………………………………………25

ශ්‍රී ලංකාවේ ජනගහනයේ මෑත කාලීන උපනතීන් ……………………………39

ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිය හා මෑත කාලීනව සිදුව පවතින වෙනස්කම් ….... 49

The Relationship between Job Satisfaction and Employee Performance..... 59

අ.පො.ස. (උ.පෙළ) 13 වැනි ශ්‍රේණියේ සිසුන්ගේ පාසල් නොපැමිණීම ........…. 69

විකුණුම් කාර්යය සාධනයට අනුව පාරිභෝගිකයා මත පදනම් වූ සන්නාම කොටස් වල බලපෑම ……………………………………………………...….. 81

# ශ්‍රී ලංකාවේ ජන සංයුතියෙහි ව්‍යුහාත්මක වෙනස්කම්

කේ. එම්. ජී. එම්. ඩයස්[1]

***සංක්ෂේපය***

*කිසියම් රටක ජන සංයුතියෙහි පවතින ව්‍යුහය පිළිබඳව අධ්‍යයනය කරන විට ජන සංඛ්‍යාවේ වයස් ව්‍යුහය, පුමිතිරි භාවය, ජනගහන වර්ධන වේගය, ජන සංඛ්‍යාවේ ඝනත්වය හා ජන වාර්ගික සංයුතිය ආදී අංශයන් කෙරෙහි අවධානය යොමු කල යුතු ය. ශ්‍රී ලංකාවේ ජන සංයුතිය ද ප්‍රධාන වශයෙන් කොටස් හතරක් යටතේ සාකච්ඡා කළ හැකි ය. එනම් වයස් කාණ්ඩ අනුව, ජාතීන් අනුව, පුමිතිරි බව අනුව සහ ආගම අනුව වේ. මෙම අධ්‍යයනය මගින් පසුගිය වර්ෂ කිහිපයක් තුළ ශ්‍රී ලංකාවේ ජන සංයුතියෙහි සිදු වී ඇති ව්‍යුහාත්මක වෙනස්කම් කෙබඳු වේද යන්න සොයා බලා ඇත. ඒ සඳහා ප්‍රධාන වශයෙන් ඉහත සඳහන් කරන ලද කොටස් හතර යටතේ දත්ත විශ්ලේෂණය සිදු කොට ඇත. මෙම පර්යේෂණය සඳහා ද්විතීක දත්ත භාවිත කළ අතර ඒ සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තා, ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තා, පුවත්පත්, සඟරා සහ පර්යේෂණ ලිපි ආදිය මගින් දත්ත ලබා ගන්නා ලදී. එසේ ලබා ගත් දත්ත විශ්ලේෂණය කිරීමට විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම යොදා ගෙන ඇත. මෙම අධ්‍යයනය මගින් 1981 වසරෙහි පැවති පිරමීඩාකාර වයස් ව්‍යුහය කාලයත් සමඟ ක්‍රම ක්‍රමයෙන් සිලින්ඩරාකාර ස්වරූපයකට පරිවර්තනය වෙමින් පවතින බවත්, පසුගිය කාලය තුළ ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනය අට ගුණයකින් පමණ වර්ධනය වී ඇති බවත් හඳුනා ගත හැකි ය. එසේම අනෙකුත් සියලුම ජාතීන්ට සාපේක්ෂව මුස්ලිම් ජන ප්‍රතිශතයෙහි වර්ධනයක් දැකිය හැකි අතර අනෙකුත් සියලුම ජාතීන්ගේ වර්ධන ප්‍රතිශතය පහළ ගොස් ඇති බවට හඳුනා ගත හැකි විය. මෙම ජන සංයුතියෙහි ව්‍යුහාත්මක වෙනස්කම් හොඳින් හඳුනා ගෙන ඒවාට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට කටයුතු කිරීම යෝජනා කළ හැකි ය.*

***මුඛ්‍ය පද : ජාතීන්, ජන සංයුතිය, පුමිතිරි බව, වයස් කාණ්ඩ***

## 1. හැඳින්වීම

කිසියම් රටක පවතින්නා වූ ජන සංයුතිය එම රටෙහි සෑම ක්‍රියාවක් සඳහාම සෘජුවම හෝ වක්‍රව බලපානු ලබයි. මෙම ජන සංයුතිය පිළිබඳව විවිධ පුද්ගලයින් විවිධ අදහස් දක්වා ඇත. එනම් තවමත් සංවර්ධනය වෙත යොමු නොවූ විශාල සම්පතක් ලෝකය සතුව පවතින බවත් එය මානව සම්පත බවත් ය. එසේම 1970 දශකයේ ලෝකවාසීන්ගේ දෘෂ්ටිය වූයේ හිඟකම සම්බන්ධ ගැටලුව උග්‍ර වීමට ජනගහන වර්ධනය අහිතකර ලෙස බලපාන බවයි. 1992 දී පැවති මිහිතල සමුළුවේදී ප්‍රකාශ කොට ඇති ආකාරයට ශ්‍රී ලංකාව යනු අඩු ඒක පුද්ගල ආදායම් තත්ත්වයක් යටතේ වුවද මෑත වර්ෂ වලදී ඉතා කෙටි කාලයක් තුළ ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තියේ ඉහළ හා පරිණත අවස්ථාවන්ට අවතීර්ණ වූ රාජ්‍යයකි.

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
diasmanuri@gmail.com

ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ලබා ගත හැකි ප්‍රධාන සහ වඩාත් පිළිගත හැකි මූලාශ්‍රය ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංගණන වාර්තා වේ. දස වසරකට වරක් ජන සංගණනයක් සිදුවන බැවින් එම කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජ හා දේශපාලනික පරිවර්තනයන් සිදු වේ. මෙකී තත්ත්වයන් තුළ ශ්‍රී ලංකාවේ ජන සංයුතියෙහි වෙනස්කම් අධ්‍යයනය කිරීම කාලීන අවශ්‍යතාවක් වී ඇත.

### *1.1 පර්යේෂණ අරමුණු*

ශ්‍රී ලංකාවේ ජන සංයුතියෙහි වෙනස්කම් අධ්‍යයනය කිරීමේ දී ජනගහනයේ පුමිතිරි බව, ජනවාර්ගික සංයුතිය, ජනගහන වර්ධන අනුපාතය, ජනගහනයේ වයස් ව්‍යුහය හා ජන ඝණත්වය ආදී අංශ වලට අවධානය යොමු කළ යුතු ය. පසුගිය කාලය තුළ ලංකාවේ මෙම සංරචක වල සිදු වී ඇති වෙනස්කම් කෙබඳු වේද යන්න මෙම අධ්‍යයනය තුළින් විමසා බලා ඇත.

## 2. සාහිත්‍ය විමර්ශනය

මැණිකේ (2017), විසින් 1871-2012 කාලය තුළ ශ්‍රී ලංකාවේ ජන සංයුතියේ ව්‍යුහාත්මක වෙනස්කම් පිළිබඳ අධ්‍යයනයක් සිදු කොට ඇති අතර පසුගිය ශත වර්ෂ එකහමාර තුළ ශ්‍රී ලංකාවේ ජනගහන සංයුතියෙහි සිදු වී ඇති වෙනස්කම් සොයා බැලීම මූලික අරමුණ වේ. එමගින් ජනගහන සංයුතියේ ගැඹුරු ව්‍යුහාත්මක වෙනස්කම් සිදු වී ඇති බව නිගමනය කොට ඇත. ඒ සඳහා 1871-2012 දක්වා කාලය තුළ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සිදු කරන ලද සංගණන වාර්තා, ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා යොදා ගෙන ඇති අතර දත්ත විශ්ලේෂණය සඳහා වගු, ප්‍රස්තාර, රේඛාංකික සිතියම් සහ සාපේක්ෂ සංඛ්‍යාතීන් භාවිතයට ගෙන ඇත. එම අධ්‍යයනය මගින් යම්කිසි ජන කාණ්ඩයක සමාජ-දේශපාලනික අවශ්‍යතාවයන් පිරිමැසීමෙහිලා අවශ්‍ය භාණ්ඩ හා සේවා ඉල්ලුම සහ සැපයුම තීරණය කිරීමේදී එම කාල පරිච්ඡේදය තුළ එකී ජන කාණ්ඩයේ විශාලත්වය, සංයුතිය සහ අවකාශීය ව්‍යාප්තිය යන සාධක පිළිබද අවධානය යොමු කළ යුතු බවත්, නව සහස්‍රකයේ නව බලාපොරොත්තු සමඟ උද්දීපනය වන ශ්‍රී ලාංකීය ආර්ථිකය හා සමාජය, එකී බලාපොරොත්තු සඵල කර ගැනීමට නම්, එම අනාගත ආර්ථිකයේ කොටස්කරුවන් වන ජනගහනයේ ලක්ෂණ හඳුනා ගෙන එම ජනගහන අවශ්‍යතාවන්ට සරිලන ප්‍රතිපත්ති සම්පාදනය කළ යුතු බවත් මෙය ප්‍රමාද වුවහොත් එම ප්‍රමාදයේ අනිසි ප්‍රතිඵල තවත් පරම්පරා ගණනාවක් විසින් අත් විඳිනු ඇත යන්නත් නිගමනය කොට ඇත.

ද සිල්වා (2012), විසින් ශ්‍රී ලංකාවේ වයස් ව්‍යුහ සංක්‍රාන්තිය සහ ජන විකාශන ලාභාංශ පිළිබඳ අධ්‍යයනයක් සිදු කොට ඇත. මෙම අධ්‍යයනය මගින් ජනගහන දත්ත යොදා ගෙන ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට වයස් ව්‍යුහ සංක්‍රාන්තිය බලපාන ආකාරය හඳුනා ගැනීම සිදු කර ඇත.

## 3. පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා ද්විතීක දත්ත පමණක් යොදා ගත් අතර එම දත්ත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තා, ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තා, පුවත්පත්, සඟරා සහ පර්යේෂණ ලිපි ආදිය මගින් දත්ත ලබා ගන්නා ලදී. දත්ත විශ්ලේෂණය සහ ඉදිරිපත් කිරීම සඳහා විස්තරාත්මක සංඛ්‍යාන විශ්ලේෂණ ක්‍රම යොදා ගෙන ඇත.

## 4. දත්ත විශ්ලේෂණය

### *4.1 වයස් ව්‍යුහය*

වයස් ව්‍යුහය අනුව ජන සංඛ්‍යාවේ සංයුතිය විග්‍රහ කිරීම බහුලව කරනු ලබයි. රටක වයස් ව්‍යුහය යනු යම් නිශ්චිත කාලයකදී විවිධ වයස් කාණ්ඩ වලට අයත් ස්ත්‍රී සහ පුරුෂ ජනගහනය ප්‍රමාණාත්මකව හෝ ප්‍රතිශතාත්මක ආකාරයෙන් දැක්වීමයි (ද සිල්වා, 2004).

වගු අංක 01: ශ්‍රී ලංකාවේ 1981 සිට 2071 දක්වා වයස් ව්‍යුහයේ වෙනස් වීම


| වර්ෂය | වයස් කාණ්ඩ (අවුරුදු) | | |
|---|---|---|---|
| | 0-14 | 15-59 | 60ට වැඩි |
| 1981 | 35.3 | 58.1 | 6.6 |
| 2001 | 26.3 | 64.5 | 9.2 |
| 2006 | 24.4 | 65.1 | 10.5 |
| 2011 | 22.8 | 64.7 | 12.5 |
| 2016 | 21.4 | 64.2 | 14.5 |
| 2021 | 19.4 | 63.9 | 16.7 |
| 2026 | 17.5 | 63.6 | 18.9 |
| 2031 | 16.1 | 63.2 | 20.7 |
| 2036 | 15.4 | 62.3 | 22.3 |
| 2041 | 15.2 | 60.0 | 24.8 |
| 2046 | 15.1 | 57.7 | 27.2 |
| 2051 | 14.9 | 56.2 | 28.8 |
| 2056 | 14.6 | 55.2 | 30.2 |
| 2061 | 14.4 | 54.3 | 31.3 |
| 2066 | 14.5 | 53.2 | 32.3 |
| 2071 | 14.8 | 52.0 | 33.3 |

*මූලාශ්‍රය : ද සිල්වා (2012)*

වයස් සංයුතිය අවුරුදු 15 ට අඩු (ළමා), අවුරුදු 15 - 59 (වැඩ කරන ජනගහනය) හා අවුරුදු 60 හා ඊට වැඩි (වයස්ගත ජනගහනය) ලෙස පුළුල් වයස් කාණ්ඩ වලට බෙදිය හැක. මෙම වයස් ව්‍යුහය රටේ සමාජ ආර්ථික වර්ධනය සඳහා බලපෑමක් ඇති කරයි. ඉහත වගුවට අනුව වයස අවුරුදු 0-14 අතර සිටින ජනගහනය 1981ට සාපේක්ෂව 2071 වන විට ඉතා සීඝ්‍ර ලෙස පහළ ගොස් ඇත. එනම් 1981 දී 35.3%ක් වූ ජනගහන ප්‍රතිශතය 2071 වන විට 14.8%ක් දක්වා පහළ ගොස් ඇත. එයට හේතුව ශ්‍රී ලංකාවේ සාඵල්‍යතාවය දීර්ඝ කලක සිට අඩු වීම බව 2012 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව මගින් හඳුනා ගත හැකි ය. එසේම වයස අවුරුදු 15-59ත් අතර ජනගහනය ගත් විට 1981 දී 58.1%ක් වූ අතර 2041 වසර දක්වා ජනගහනය වර්ධනය වී නැවත එම ප්‍රතිශතය පහළ ගොස් ඇත. වයස අවුරුදු 60ට වැඩි ජනගහනය ගත් විට ඉතාමත් සීඝ්‍රව වර්ධනය වී ඇත. එනම් 1981 දී 6.6% ක් වූ ජනගහන ප්‍රතිශතය 2071 වන විට 33.3% ක් දක්වා වර්ධනය වී ඇති බව හඳුනා ගත හැකි ය. මෙයට හේතුව සාඵල්‍යතාවය පහළ යාමත් සමග ආයු අපේක්ෂාව ඉහළ යාමයි.

2011 දී ශ්‍රී ලංකාවේ සාමාන්‍ය ආයු අපේක්ෂාව වයස අවුරුදු 74.9කි. මෙලෙස රටක වයස්ගත ජනගහනය ඉහළ යාම නිසා අනාගතයේ රටෙහි සුභසාධන වියදම් ඉහළ යනු ඇත. නමුත් වයස අවුරුදු 18ට වැඩි ජනගහනය වර්ධනය වීම හරහා අනාගතයේ දී රටක ශ්‍රම බලකාය ඉහළ යන අතර එය රටක ආර්ථික වර්ධනයට යහපත් වේ.

ප්‍රස්තාර අංක 01: පුළුල් වයස් කාණ්ඩ අනුව ජනගහනය 1981 සහ 2012





*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2012)*

1981 දී ළමා ජනගහනය ප්‍රතිශතයක් ලෙස ගත් විට සියයට 35.3 ක් වූ අතර 2012 වන විට මෙම අගය සියයට 25.2 ක් දක්වා සැලකිය යුතු ප්‍රමාණයකින් පහළ බැස ඇත. 1981 දී වැඩිහිටි ජනගහනය 6.6% ක් වූ අතර 2012 වන විට එය දෙගුණයක් පමණ වෙමින් 12.4% ක් දක්වා වැඩි වී ඇත. 1981 දී වැඩ කරන ජනගහනය 58.1%ක් වූ අතර 2012 වන විට එය 62.4% ක් දක්වා වැඩි වීමක් සිදු විය. වැඩ කරන වයසේ ජනගහනය වර්ධනය වන අතරතුර ළමා ජනගහනය අඩු වීම හා වයස්ගත ජනගහනයේ ප්‍රමාණය කළමනාකරණය කළ හැකි මට්ටමක පවතින විට ආර්ථික සංවර්ධනයට හිතකර ප්‍රජා විද්‍යා පාරිතෝෂිකයක් (Demographic dividend) ශ්‍රී ලංකාවට හිමි වී ඇත.

ප්‍රජා විද්‍යා පාරිතෝෂිකය යනු වැඩ කරන වයසේ ජනගහනයට සාපේක්ෂව ළමා ජනගහනයේ අඩු වර්ධනයක් ඇති අවස්ථාවේ දී ලබා ගත හැකි සීඝ්‍ර ආර්ථික වර්ධනයයි. මේ අවස්ථාවේ දී වැඩ කරන ජනගහනයට රැක බලා ගැනීමට සිටින යැපෙන්නන්ගේ ප්‍රමාණය අඩු වීම නිසා සුදුසු ආර්ථික හා සමාජයීය ප්‍රතිපත්ති මඟින් රටේ දියුණුව සලසා ගත හැකි නව කවුළුවක් විවෘත කර ගත හැකිය. වියපත් වීම වැඩි වන විට වැඩ කරන වයසේ ජනගහනය අඩු වීම නිසා ප්‍රජා විද්‍යා පාරිතෝෂිකය ඍණ අගයක් ගනී. ඒ අනුව ප්‍රජා විද්‍යා පාරිතෝෂිකය සංක්‍රාන්ති අවස්ථාවකි. ශ්‍රී ලංකාවට මෙම ප්‍රජා විද්‍යා සංක්‍රාන්තිය උදා වී ඇති අතර එය 1990 දශකයේ මුල් වසර වල සිට 2030 දශකයේ මුල් වර්ෂ අතර වසර 40 ක පමණ කාලය තුළ පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.


වයස් පිරමීඩය මඟින් දැක්වෙන්නේ එකිනෙකට වෙනස් වූ වර්ෂවල ජනගහනයේ වයස් සංයුතිය උපත්, මරණ සහ සංක්‍රමණ රටා අනුව වෙනස්වන ආකාරයයි. මෙම තත්ත්වය ශ්‍රී ලංකාවට අදාළ පහත දැක්වෙන විවිධ හැඩැති ජන සංඛ්‍යා පිරමීඩ මඟින් පැහැදිලි වේ. මෙම වයස් පිරමීඩයට අනුව 1963 දී පිරමීඩයේ පහළම කොටස පුළුල් වී ඇත. එයට හේතුව ළමා ජනගහනය ඉහළ යාමයි. 2012 වසරෙහි වයස් පිරමීඩයට අනුව ළමා ජනගහනයට සාපේක්ෂව වැඩ කරන වයසේ ජනගහනය වැඩි වී ඇත. 2021 වන විට වැඩිහිටි හෙවත් වියපත් ජනගහනය වර්ධනය වෙමින් වයස් පිරමීඩයේ හැඩය බැරලයක හැඩයට වෙනස් වී ඇත.

ප්‍රස්තාර අංක 02: 1963 වර්ෂය සඳහා වයස් විශේෂිත පිරමීඩ





*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2012)*

ප්‍රස්තාර අංක 03: 2012 වර්ෂය සඳහා වයස් විශේෂිත පිරමීඩ




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2012)*

ප්‍රස්තාර අංක 04: 2021 වර්ෂය සඳහා වයස් විශේෂිත පිරමීඩ





*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2012)*

### *4.2 පුම්තිරි සංයුතිය*

පුම්තිරි බව අනුව ද ජන සංඛ්‍යාවේ සංයුතිය විග්‍රහ කිරීම බහුලව දැකිය හැකිය. කිසියම් ජන සංඛ්‍යාවක ස්ත්‍රී පුරුෂ වශයෙන් බෙදී ඇත්තේ කුමන ආකාරයකින්ද යන්න ජනගහනයේ පුම්තිරි සංයුතිය වේ. පුම්තිරි අනුපාතය යනු යම් ජන සංඛ්‍යාවක කාන්තාවන් 100 දෙනෙකුට අනුපාතිකව සිටින පුරුෂයින් සංඛ්‍යාව කොපමණද යන්නයි (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012).

ප්‍රස්තාර අංක 05: පුමිතිරි අනුපාතය 1971-2012





*මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2012)*
*සටහන: දිස්ත්‍රික්ක 18ක දත්ත පමණයි*

2012 සංගණනය අනුව ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ජනගහනය පිරිමි ජනගහනයට වඩා 646,000 කින් පමණ වැඩි වේ. පසුගිය ජන සංගණන වර්ෂ වල දී පුමිතිරි අනුපාතය ක්‍රමයෙන් පහත බැස 2012 දී එය සියයට 93.8 ක් ලෙස වාර්තා වී ඇත. පුරුෂයන් හා සැසඳීමේ දී ස්ත්‍රීන් ඉහළ ආයු අපේක්ෂාවක් ලබා ගැනීම මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත.

### *4.3 ජාතීන් අනුව*

සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් සහ මැලේ යන ජන වර්ගයන්ගේ සංයුතියක් ලෙස ශ්‍රී ලංකාවේ ජන සංයුතිය දැකිය හැකි ය. එසේම සංක්‍රමණය වන සහ වෙනත් ජන වර්ග ද මෙම ජන සංයුතියට අයත් වේ.

ප්‍රස්තාර අංක 06: ජන වර්ගය අනුව සංයුතිය - 2012





*මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2012)*

ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් 74.9% ක් එනම් ජනගහනයෙන් හතරෙන් තුනක් සිංහල ජාතිකයන්ය. ඉතිරි ජනගහනයෙන් 11.2% ක් ශ්‍රී ලංකා දෙමළ ද, 9.3% ක් ශ්‍රී ලංකා යෝනක ද, 4.1% ක් ඉන්දියානු දෙමළ ද වන අතර 0.5% වෙනත් ජනයන් වේ (*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012).*

1981 වසරෙහි සිට ජාතීන් අනුව ජන සංයුතිය ගත් විට කිසියම් රටාවකට ජන වර්ගයන්ගේ වෙනස් වීම් හඳුනා ගත හැකි ය. 2001 වසර ගත් විට ජන සංයුතියෙහි කැපී පෙනෙන වෙනසක් දැක ගත හැකි ය. එයට හේතුව එකල පැවති යුධමය වාතාවරණය නිසා උතුරු නැගෙනහිර ප්‍රදේශ අත්හැර දිස්ත්‍රික්ක 18ක පමණක් සංගණන පැවැත්වීමයි. ඒ අනුව 2001 වසරෙහි සිංහල ජන වර්ගයෙහි වර්ධනයක් දැකගත හැකි අතර දෙමළ ජන වර්ගයෙහි පහළ බැසීමක් හඳුනාගත හැකි ය. එනම් යුධමය වාතාවරණය පැවති උතුරු නැගෙනහිර ප්‍රදේශවල වැඩි වශයෙන් දෙමළ ජනයා සිට ඇති අතර ඔවුන් මෙම සංගණන වලට හසු නොවීම එයට හේතු වේ. තවද සමස්තයක් ලෙස ගත් විට සිංහල ජන ප්‍රතිශතය ඉහළ අගයක් ගනු ලබන අතර 1921 දක්වා සිංහල ජන ප්‍රතිශතය වර්ධනය වී 1931 දී නැවත එම ප්‍රතිශතය පහළ වැටී ඇති බව හඳුනාගත හැකි ය. දෙමළ ජන සංයුතිය ගත් විට 1981-1901 දක්වා කාලයේ දී ශ්‍රී ලංකා දෙමළ හා ඉන්දියානු දෙමළ ජන සංයුතිය සමාන වන අතර 1921 සිට ශ්‍රී ලංකා දෙමළ සංයුතිය වර්ධනයන් සහ පහත වැටීම් හඳුනාගත හැකි අතර ඉන්දියානු දෙමළ ජන සංයුතිය ද 1911-1931 දක්වා වර්ධනය වී නැවත පහළ බැස ඇත. බර්ගර්, මැලේ සහ වෙනත් යන ජන වර්ග ගත් විට ඒවායේ වර්ධනයෙහි පහළ බැස්මක් හඳුනා ගත හැකි ය.

ප්‍රස්තාර අංක 07: ජන වර්ගය අනුව සංයුතිය - 1981 සහ 2012





*මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2012)*

1981 - 2012 කාලය තුළ දී සිංහල ජන වර්ගය ප්‍රතිශත ඒකක 0.9 කින් සහ යෝනක ජන වර්ගය ප්‍රතිශත ඒකක 2.3 කින් වැඩි වී ඇත. එහෙත් ශ්‍රී ලංකා දෙමළ ජන වර්ගය ප්‍රතිශත ඒකක 1.5 කින් සහ ඉන්දියානු දෙමළ ජන වර්ගය ප්‍රතිශත ඒකක 1.4 කින් අඩු වී ඇත.

### 4.4 ආගම අනුව

ශ්‍රී ලංකාවේ ආගම් අනුව ජන සංයුතිය බෞද්ධ, හින්දු, ඉස්ලාම්, රෝමානු කතෝලික, ක්‍රිස්තියානි සහ වෙනත් යන ආගම් වලින් සංයුක්ත වේ.

ප්‍රස්තාර අංක 08: ආගම් අනුව ජන සංයුතිය - 2012




*මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2012)*

ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් 70.1% ක් බෞද්ධයන් වන අතර 12.6% ක් හින්දු ද 9.7% ක් ඉස්ලාම් සහ 6.2% ක් රෝමානු කතෝලික වන අතර ඉතිරි 1.4% ක් වෙනත් ක්‍රිස්තියානි වේ.

වගු අංක 02: ආගම අනුව ජනගහනය (2012)

| සංගණන වර්ෂය | මුළු ජනගහනය'000 | ආගම අනුව (%) | | | | |
|---|---|---|---|---|---|---|
| | | බෞද්ධ | හින්දු | ඉස්ලාම් | ක්‍රිස්තියානි | වෙනත් |
| 1881 | 2,759.7 | 61.5 | 21.5 | 7.2 | 9.7 | 0.1 |
| 1891 | 3,007.8 | 62.4 | 20.5 | 7.0 | 10.0 | ... |
| 1901 | 3,566.0 | 60.1 | 23.2 | 6.9 | 9.8 | 0.1 |
| 1911 | 4,106.4 | 60.3 | 22.8 | 6.9 | 10.0 | ... |
| 1921 | 4,498.6 | 61.6 | 21.8 | 6.7 | 9.9 | ... |
| 1931 | 5,306.9 | 61.6 | 22.0 | 6.7 | 9.8 | ... |
| 1946 | 6,657.3 | 64.5 | 19.8 | 6.6 | 9.1 | ... |
| 1953 | 8,097.9 | 64.3 | 19.9 | 6.7 | 8.9 | 0.1 |
| 1963 | 10,582.0 | 66.2 | 18.5 | 6.8 | 8.4 | 0.1 |
| 1971 | 12,689.8 | 67.3 | 17.6 | 7.1 | 7.9 | 0.1 |
| 1981 | 14,846.8 | 69.3 | 15.5 | 7.5 | 7.6 | 0.1 |
| 2001 | 18,797.3 | 76.7 | 7.8 | 8.5 | 7.0 | ... |
| 2012 | 20,359.4 | 70.1 | 12.6 | 9.7 | 7.6 | ... |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව (2018)*

මෙම දත්ත වලට අනුව අනෙකුත් ආගම් වලට සාපේක්ෂව බෞද්ධ ආගම අදහන ජනගහනය වැඩි වශයෙන් සිටින බව පැහැදිලිව හඳුනාගත හැකි ය. හින්දු ආගම අදහන ජන සංඛ්‍යාව ගත් විට 1881 සිට 2012 කාල සීමාව තුළ ජනගහනයේ වර්ධනයන් හා පහත වැටීම් බොහොමයක් පවතින බව දැක ගත හැකි ය. විශේෂයෙන්ම 2001 වසරෙහි හින්දු ආගම අදහන ජන සංඛ්‍යාවේ විශාල පහත වැටීමක් පවතී. එයට හේතුව ඉහත ජාතීන් අනුව ජන සංයුතියෙහි පරිදිම එකල පැවති යුධමය වාතාවරණයයි. එනම් යුධමය කටයුතු පැවති උතුරු නැගෙනහිර ප්‍රදේශයේ වැඩි වශයෙන් හින්දු ආගම අදහන ජනතාව සිටීමත් එම ප්‍රදේශ අත්හැර දිස්ත්‍රික්ක 18ක පමණක් සංගණන පැවැත්වීමත්ය. කෙසේ වෙතත් ඉස්ලාම් ආගම අදහන ජනගහනයෙහි වර්ධනයක් ඇති බව දැකිය හැකි  අතර ක්‍රිස්තියානි ජනගහනය සුළු වර්ධනයක් දැකගත හැකි ය.

## 5. සමාලෝචනය

කිසියම් රටක ජන සංයුතිය එම රටෙහි සමාජ, ආර්ථික සහ දේශපාලනික කටයුතු හේතුවෙන් වෙනස් වීම් වලට ලක්වනු ඇත. එම ජන සංයුතියෙහි වෙනස් වීම පිළිබඳව අධ්‍යයනය කිරීමේදී සාධක කිහිපයක් පිළිබඳව අවධානය යොමු කළ යුතු ය. ඒ අනුව මෙම අධ්‍යයනය තුලදී ශ්‍රී ලංකාවේ වයස් ව්‍යුහය, පුම්තිරි ව්‍යුහය, ආගම් සහ ජාතීන් අනුව සමස්ත ජන සංයුතියෙහි වසර කිහිපයක් තුලදී සිදුවී ඇති වෙනස්කම් පිළිබඳව අවධානය යොමු කර ඇත. එහිදී අධ්‍යනයට හසු කළ කාල සීමාව තුළදී ඉහත සඳහන් කරන ලද සාධක එනම් වයස් ව්‍යුහය, පුම්තිරි ව්‍යුහය, ආගම් සහ ජාතීන් යන සාධකයන්ගේ ජනගහනයෙහි ප්‍රමාණය විවිධාකාරයෙන් උච්ඡාවචනය වී ඇති බව පැහැදිලිව හඳුනාගත හැකි ය. විවිධ වූ ස්වභාවික සාධක සහ වෙනත් මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් මෙම වෙනස්වීම් හඳුනාගත හැකි ය. තවද මෙම අධ්‍යනය මගින් ශ්‍රී ලංකාවේ වියපත් ජනගහනය ළමා සහ තරුණ ජනගහනයට සාපේක්ෂව ඉහළ යන බව ගම්‍ය වේ. ඒ අනුව වැඩිහිටි යැපෙන්නන් වැඩි වීම රටේ ආර්ථිකයට බරපතල අභියෝගයක් විය හැකි ය. එයට විසඳුම් ලෙස වැඩිහිටි ජනතාව ආර්ථික කටයුතුවලට සම්බන්ධ කර ගැනීම, විශ්‍රාම සැලසුම් වැනි වැඩසටහන් යෝජනා කළ හැකි ය. පුම්තිරි ව්‍යුහය ගත් විට ස්ත්‍රී අනුපාතය පුරුෂ අනුපාතයට සාපේක්ෂව ඉහළ අගයක් ගන්නා බව තහවුරු වූ අතර එම නිසා කාන්තාවන් සඳහා වැඩි රැකියා ප්‍රමාණයක් උත්පාදනය කළ යුතු බව යෝජනා කළ හැකි ය. නැතහොත් එය රටේ ආර්ථික වර්ධනයට සෘණාත්මකව බලපානු ඇත. ආගම් සහ ජාතීන් අනුව ගත් විට සිංහල බෞද්ධ ජනගහනය වැඩි වශයෙන් සිටින බව තහවුරු විය. එසේම මුස්ලිම් ජන වර්ගය ගත් විට ඔවුන්ගේ ජන සංයුතියේ වර්ධනයක් ද හඳුනාගත හැකි විය. මේ අනුව රටේ පවතින ජන සංඛ්‍යා සංයුතියෙහි පවතින වෙනස්කම් හඳුනා ගෙන ඒවාට අදාල විසඳුම් ලබා දීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කළ යුතු වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**


ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව. (2012). *ජන හා නිවාස සංගණනයේ ප්‍රධාන තොරතුරු, ලබා ගැනීම* http:// www.statistics.gov.lk/PopHouSat/CPH2011/Pages/Activities/Reports/CPH_2012_5Per_Rpt.pdf

ද සිල්වා, ඩබ්. අයි. (2004). *ජනගහන අධ්‍යයනය - ශ්‍රී ලංකාව ඇසුරින්,* කර්තෘ ප්‍රකාශන

ශ්‍රී ලංකා මහ බැංකුව. (2018). *ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන, ලබා ගැනීම* https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/statistics/otherpub/economic_and_social_statistics_of_SL_2018_s.pdf

De Silva W. I. (2012) The age structure transition and the demographic dividend: An opportunity for rapid economic take-off in Sri Lanka *Sri Lanka Journal of Advanced Social Studies*, 2 (1), 03-46

Menike, H. R. A. (2017). Structural Changes in the Population Composition of Sri Lanka during the Period 1871-2012, *International Journal of Social Science and Humanity*, 7(3), 188 – 191

# දෙමව්පියන් විදේශගත වීම පවුලේ ආර්ථිකය සහ දරුවන් කෙරෙහි ඇති කරන බලපෑම

ආර්. ආර්. ඒ. එල්. ඩබ්. රණතුංග[1], ඩී. ඩී. වයි. එන්. ගුණරත්න, ඩී. ඩී. ඩබ්. එන්. ගුණරත්න, කේ. ඩී. ලියනගේ, කේ. එම්. ජී. එම්. ඩයස්

***සංක්ෂේපය***

*ශ්‍රී ලාංකීය පවුල් සංස්ථාව බිඳවැටීමට අතීතයේ සිටම විවිධ සාධක ගණනාවක් හේතු විය. විවෘත ආර්ථිකයේ බලපෑමත් සමඟ විදේශ රටවල් කරා ඇදී ගිය ශ්‍රම සංක්‍රමණික ප්‍රවාහය ඉතා විශාල විය. මේ හේතුවෙන් දෙමාපියන් විදේශගත වීම නිසා පවුලේ ආර්ථිකයට සහ දරුවන්ගේ අධ්‍යාපනයට වන බලපෑම කෙබඳුදැයි විමසීම අප අධ්‍යයනයේ මූලික අරමුණ විය. ඒ සඳහා ශ්‍රී ලංකාවේ සමස්ත විදේශ සේවා නියුක්ති සංගහනයෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ ජා ඇල සහ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකෙහි තෝරාගත් ග්‍රාම සේවා වසම් අටක පවුල් හතලිහක් නියැදිය ලෙස තෝරාගෙන ඇත. සම්භාවිතා නොවන නියැදි ක්‍රමයක් වන හිමබොල නියැදි ක්‍රමය පදනම් කරගෙන තෝරාගත් නියදිය තුළින් රැස් කරගත් දත්ත සඳහා කල්පිත පරීක්ෂාවන් යොදා ගනිමින් පර්යේෂණය කර ඇත. ප්‍රමාණාත්මක දත්ත රැස් කිරීමේ ක්‍රම ලෙස තෝරාගත් නියදිය වෙතට ප්‍රශ්නමාලාවක් ඉදිරිපත් කිරීමෙන් දත්ත රැස් කරන ලදී. දෙමාපියන් විදේශගත වීම පවුලේ ආර්ථිකයට සහ දරුවන්ගේ අධ්‍යාපනයට සෘජුවම බලපෑම් කිරීම හෙවත්, දෙමාපියන් විදේශගත වූ පවුල්වල පෙර හා පසු ආර්ථික තත්ත්වය සමාන වේ යන කල්පිතය, රැස් කරගත් දත්ත මත ප්‍රතික්ෂේප වූ අතර විදේශගත වීමට පෙර ආදායමට වඩා පසු ආදායම සාමන්‍යයෙන් දෙගුණයකට ආසන්න ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇත. ඒ නිසා පවුලේ ආර්ථිකය යහපත් වී ඇත. එම බලපෑම් ආර්ථික වශයෙන් යහපත් වූවද දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් අයහපත් ප්‍රතිඵල වැඩි වී ඇත. මේ අනුව දෙමාපියන් විදේශගත වූ පවුල්වල දරුවන් කෙරෙහි පාසල් මට්ටමින් විශේෂ අවධානයක් ලැබිය යුතු අතර, ඔවුන්ගේ අධ්‍යාපන කුසලතා ඔප්නැංවීම සඳහා වෘත්තීමය සානුබල ඔවුන්ට ලබා දිය යුතු ය.*

***මුඛ්‍ය පද : දරුවන්ගේ අධ්‍යාපනය, දෙමාපියන්, පවුලේ ආර්ථිකය, විදේශගත වීම***

## 1. හැඳින්වීම

සිංහලයන් තරම් අවංක හා දැඩි සුහද පවුල් සම්බන්ධකම් ඇත්තේ මනුෂ්‍ය සමාජ අතරින් ඉතාම ටිකකට වේ. ඒ සම්බන්ධකම් දුර්වල කිරීමට හෝ වෙනතකට යොමු කිරීමට හෝ තුඩුදෙන කිසිවක් නොමැත. ස්වදේශිකයෙකුගේ ආදරය එක් රැස් වන කේන්ද්‍රස්ථානය ලෙස සැලකිය හැක්කේ පවුලයි. ඇත්ත වශයෙන් ඥාති ක්‍රමය එයට සම්බන්ධ පෞද්ගලික නීතිය පිළිබඳ සංස්ථා සමාජයේ ඒකකය ලෙස සැලකුයේ පුද්ගලයා නොව පවුලයි. ජාත්‍යන්තර සංක්‍රමණ ප්‍රවාහයන් විවිධ තත්ත්ව යටතේ ශ්‍රී ලංකාව තුළ ඇති වූ ශ්‍රමික සංක්‍රමණය සමාජ ව්‍යුහය තුළ විවිධ ගැටළු

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
waruniranathnga9@gmail.com

රැකියා ඇති කිරීමට සමත් වී ඇත. 1977 විවෘත ආර්ථික ක්‍රමය යටතේ විගමන නීති ලිහිල් වීමෙන් විදේශ රැකියා ක්ෂේත්‍රයේ පුළුල් ප්‍රසාරණයක් ඇති විය. වඩාත් පුළුල් ලෙස ව්‍යාප්ත වූ ශ්‍රම සංක්‍රමණ, ප්‍රවාහය හැඳින්විය හැක්කේ ශ්‍රී ලාංකිකයන් සඳහා ආරම්භ වූ විකල්ප රැකියා ක්‍රමයක් වශයෙනි (අමරතුංග, 2007). රැකියා සඳහා විදේශ ගත වීම තම පවුල් වල දුප්පත්කම හා විරැකියාව නිසා ඇති වන අවාසනාවන්ත තත්ත්වයෙන් මිදීමට කාන්තාවන් මෙන්ම පිරිමි පක්ෂයේ ද විසඳුමක් ලෙස වටහා ගත හැකිය. බොහෝ විට කාන්තාවන් විදේශ ගත වීමෙන් තම දරුවන්ට වඩාත් යහපත් අනාගතයක් ලබන ආර්ථික වාසිය විශාල වුව ද ඒ මඟින් ජීවත් වීමට හා අධ්‍යාපනයට දරුවෙකුට ඇති අයිතිය එමගින් උල්ලංඝනය වේ. බොහෝ විට එම දරුවන් සමාජ සැලසුම් ප්‍රතිපත්ති කෙරෙහි නොතකා හැරිය වූවන් බවට පත් වෙති (අමරතුංග, 2007).

දෙමව්පියන් විදේශගත වීම මත පවුල් සංස්ථාව තුළ උද්ගත වන මෙම ගැටළු පවුලේ දරුවන්ට ඍජුවම බලපාන නිසාවෙන් මේවා සමාජගත ප්‍රශ්න බවට පත් වී තිබේ. මේ හේතුවෙන් පවුල් සංස්ථාවට ආර්ථික තත්ත්වයට හා දරුවන්ගේ අධ්‍යාපනයට එල්ලවී ඇති ප්‍රතිජානාත්මක මෙන් ම නිශේධනාත්මක ප්‍රතිඵල ද පවතී. දෙමව්පියන් සහ දරුවන් අතර විශාල පරතරයක් ඇති කිරීමට විදේශ ගත වීම හේතු වී තිබේ. මේ තත්ත්වය දරුවන් බාල අපරාධකරුවන් වීම, ලිංගික අතවර වලට ලක් වීම, මෙන්ම විවිධ අපචාරී ක්‍රියාවන්ට ලක්වීමට හේතු වී ඇත. තවද පවුල් බිඳීයාම්, අනියම් ලිංගික සම්බන්ධතාව, ව්‍යාභිචාරය වැනි සිදුවීම් බහුලව හඳුනා ගත හැකි බවද විවිධ අධ්‍යයනයන් තුලින් පැහැදිලි වී තිබේ (අමරතුංග, 2007). එබැවින් දෙමාපියන් විදේශගත වීම නිසා පවුලේ ආර්ථිකයට හා දරුවන්ගේ අධ්‍යාපනයට නිශේධාත්මක බලපෑම් අවම කිරීමට කටයුතු කළ යුතුය.

පවුල් සංස්ථාවක යථා පැවැත්ම මව්පියන් සහ දූ දරුවන් අතර පවත්නා අන්තර් පුද්ගල සබඳතා අනුව සිදු වෙන්නා වූ අඛණ්ඩ ක්‍රියාවලියකි. පවුලක සාමාජිකයෙකු විදේශගත වීම එසේත් නැතිනම් පවුලක් සතු වන අවශ්‍ය කෘත්‍යයක් වන පොදු වාසය තුලින් බැහැර වීම එකී සබඳතා බිඳී යාමට තුඩුදිය හැකිය. එම සබඳතා බිඳ වැටීම පවුලේ එක් එක් සමාජිකයාට ඇති කෙරෙන බලපෑම් විවිධ විය හැකිය. එබැවින් මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටළුව වශයෙන් ගෙන හැර දැක්විය හැක්කේ දෙමව්පියන්ගේ විදේශ රැකියා නියුක්තිය පවුල් සංස්ථාවේ ආර්ථික හා පැවැත්මට සහ දරුවන්ගේ අධ්‍යාපනය බලපෑමක් ඇති කර තිබේ ද නැතිද යන්නයි. විදේශ රැකියා නියුක්තිය හේතුකොටගෙන පවුලේ සාමාජිකයන් අතර ඇති සම්බන්ධතා බිඳ වැටීම මගින් විවිධ වූ පරිවර්තනයන්ට බඳුන් වීම පැහැදිලි කාරණාවක් වේ.

### *1.1 ශ්‍රී ලංකාවේ විදේශ සේවා නියුක්තියේ කාලීන තත්ත්වය*


ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අනුව, 2015 වර්ෂයේ දී කොළඹ දිස්ත්‍රික්කයේ ඉහළම විදේශ සේවා නියුක්තය වාර්තා වෙයි. ඉන්පසු ගම්පහ, කුරුණෑගල, මඩකලපුව, යන දිස්ත්‍රික්ක වල ඉහළ අගයක් පෙන්වනු ලබයි. එසේම මුලතිව් දිස්ත්‍රික්කයේ විදේශ ගත වී ඇත්තේ පුරුෂයන් 14 ක් පමණි. තව ද රත්නපුර දිස්ත්‍රික්කයේ දත්ත ලැබී නොමැත. එම නිසා මෙම දිස්ත්‍රික්ක අතර

සැසඳීම එතරම් සාර්ථක නොවේ. පොදු වශයෙන් බස්නාහිර පළාතට අයත් කොළඹ, ගම්පහ, කළුතර යන දිස්ත්‍රික්ක වලින් අනෙක් පළාත් වලට සාපේක්ෂව ඉහළ විදේශ සේවා නියුක්තියක් පෙන්වනු ලබයි.

### *1.2 පර්යේෂණ අරමුණු*

දෙමාපියන් විදේශ රැකියා සඳහා සංක්‍රමණය වීමෙන් දරුවන්ගේ අධ්‍යාපනයට සහ පවුලේ ආර්ථිකයට ඇති වන බලපෑම පිළිබඳ විමසීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වේ. මීට අමතරව විදේශ ප්‍රේෂණ පරිහරණය කරන ආකාරය පරීක්ෂා කිරීම සහ විදේශ ගත වූ පවුල් වල ආර්ථිකයට සිදු වී ඇති බලපෑම ජා ඇල හා අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ඇසුරින් සන්සන්දනාත්මකව පරීක්ෂා කිරීම ආදිය ද අරමුණු අතර වේ.

ප්‍රස්තාරය 01: ශ්‍රී ලංකාවේ විදේශ සේවා නියුක්තියේ කාලීන තත්ත්වය




*මූලාශ්‍රය : විදේශ සේවා නියුක්ති කාර්යාංශය (2015)*

### 2. සාහිත්‍ය විමර්ශනය

ආරියවති (1998), විසින් ශ්‍රී ලංකාවේ කළුතර දිස්ත්‍රික්කයේ මතුගම අගලවත්ත අධ්‍යාපන කලාපය පදනම් කරගෙන රැකියා සඳහා දෙමාපියන් විදේශගත වීම දරුවන්ගේ අධ්‍යාපන (සාධන මට්ටම) කෙරෙහි වන බලපෑම පිළිබඳව අධ්‍යනයක් සිදු කොට ඇති අතර, එමගින් දෙමාපියන් විදේශගත වූ පවුල්වල දරුවන්ගේ අධ්‍යාපන (සාධන මට්ටම) පහළ ගොස් ඇති බව සොයා ගෙන ඇත.

කුලතිලක (2002) විසින් ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාත පදනම් කරගෙන විදේශ රැකියාවල නියුක්ත ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ දූ දරුවන් සමාජානුයෝජනය වීම පිළිබඳව සිදු කර ඇති අධ්‍යයනය මගින් දරුවන් සමාජානුයෝජනය කෙරෙහි මව්පිය සමීප සම්බන්ධතාවන් ඉටු කෙරෙන බවත්, මව්වරු විදේශගත වීම හේතු කොට ගෙන ඔවුන්ගේ සමාජානුයෝජනයට බලපෑමක් සිදුවන බවත් නිගමනය කර ඇත.

විජේනායක (2016) විසින් ශ්‍රී ලංකාවේ මව විදේශගත වීම දරුවන් කෙරෙහි බලපා ඇති ආකාරය පිළිබඳව සමාජ විද්‍යාත්මක අධ්‍යනයක් ශ්‍රී ලංකාවේ කුරුණෑගල දිස්ත්‍රික්කය පදනම් කරගෙන සිදු කර ඇති අතර, එමගින් ශ්‍රී ලංකාවේ පවුල් සංස්ථාව තුළ බිරිඳ විදේශගත වීම පවුල තුළ සැමියා කෙරෙහි බලපා ඇති බවත් මව විදේශගත වීම දරුවන් කෙරෙහි නිශේධනාත්මකව බලපාන බව සොයා ගෙන ඇත.

## 3. පර්යේෂණ ක්‍රමවේදය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයට අයත් ජා ඇල හා අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වලට අයත් දෙමාපියන් විදේශ ගත වූ පවුල් 20 බැගින් පවුල් 40 ක නියැදියක් සම්භාවිතා නොවන හිමබොල නියැදි ක්‍රමය යටතේ තෝරා ගන්නා ලදී. මෙම නියැදියට අයත් පවුල්වල සාමාජිකයන්ගෙන් හා දරුවන්ගෙන් ද අසල්වාසීන් 10 දෙනෙකුගෙන් ද ප්‍රාථමික දත්ත ලබා ගන්නා ලදී. එනම් ඒ සඳහා ප්‍රශ්නාවලී ක්‍රමය බහුලව භාවිතා කළ අතර තවද සම්මුඛ සාකච්ඡා ක්‍රමය සහ නිරීක්ෂණ ද යොදා ගන්නා ලදී. මෙම පර්යේෂණයට අදාළ තොරතුරු ලබා ගැනීමට ද්විතීයික මූලාශ්‍ර ද පරිශීලනය කරන ලදී. විදේශ සේවා නියුක්ති කාර්යයාංශයේ වාර්තා, මහ බැංකු වාර්තා, සඟරා, පොත්පත් ද මේ අතර වේ.

## 4. දත්ත විශ්ලේෂණය

### *4.1 දෙමාපියන් විදේශගත වීම නිසා පවුලේ ආර්ථිකයට වන බලපෑම*

නියැදියෙන් 52.5% ක් ම විදේශ ගත වී ඇත්තේ මැදපෙරදිග රටවල් කරාය. දෙවනුව අග්නිදිග ආසියාතික රටවල් කරා වැඩි පිරිසක් විදේශ ගත වී ඇත (47.6%). එසේම ඕස්ට්‍රේලියාව කරා 10%ද, යුරෝපා රටවල් කරා 7.5%ද විදේශ ගත වී ඇත.

වගු අංක 01: විදේශ රැකියා සඳහා නික්ම ගිය ක්ෂේත්‍ර

| ක්ෂේත්‍ර | ස්ත්‍රී | | පුරුෂ | | මුළු සංඛ්‍යාව | මුළු ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | | |
| තාක්ෂණික ශිල්පීන් | 0 | 0% | 2 | 9.5% | 2 | 5% |
| ගෘහ ශ්‍රමිකයින් | 14 | 73.6% | 0% | 0% | 14 | 35% |
| නුපුහුණු ශ්‍රමිකයින් | 0 | 0% | 3 | 14.2% | 3 | 7.5% |
| පුහුණු ශ්‍රමිකයින් | 3 | 15.7% | 14 | 6.6% | 17 | 42.5% |
| වෙනත් | 2 | 10.5% | 2 | 9.5% | 4 | 10% |
| එකතුව | 19 | 100% | 21 | 100% | 40 | 100% |

*මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය (2017)*

### *4.2 විදේශ ප්‍රේෂණ පරිහරණය කළ ආකාරය*

නියැදිය තුළ පවුල් 40 ක් වූ අතර ඒ තුළ වැඩිම පිරිසක් ගිණුමක තැන්පත් කර මුදල් ඉතිරි කරන ආකාරයක් දක්නට ලැබුණි. එය ප්‍රතිශතයක් ලෙස ගතහොත් 30% කි. එසේ ම එවන ලද මුදල් වලින් ආදායම් මාර්ගයක් සකසා ගෙන මුදල් උපයන අයුරු ද අපගේ අවධානයට බඳුන් විය.

වගු අංක 02: විදේශ ප්‍රේෂණ පරිහරණය කළ ආකාරය

| එවන ලද මුදල් පරිහරණය කරන ආකාරය | මුළු සංඛ්‍යාව | මුළු ප්‍රතිශතය |
|---|---|---|
| ආයෝජනය කිරීම | 9 | 22.5% |
| ආදායම් මාර්ගයක් සකසා ගැනීම | 10 | 25% |
| ගිණුමක තැන්පත් කිරීම | 12 | 30% |
| අධ්‍යාපනික කටයුතු සඳහා | 7 | 17.5% |
| වෙනත් | 2 | 5% |
| එකතුව | 40 | 100% |

*මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය (2017)*

එසේම කොටස් වෙළඳපොළ තුළ ආයෝජනය කිරීම වැනි විශාල ආයෝජනය ව්‍යාපෘති නොමැති වුවත් 22.5% ක් එවන ලද මුදල් ඉතිරි කරන ආකාරයක් ද දක්නට ලැබුණි. එසේම තව පිරිසක් 17.5% ක ප්‍රතිශතයත් එවන ලද මුදල් අධ්‍යාපනික කටයුතු සඳහා වැය කර ඇති අතර ආහාර බීම, ඇඳුම් පැළඳුම් වැනි අවශ්‍යතා හා වුවමනාවන් සඳහා මුදල් වැය කර ඇත.

### *4.3 විදේශගත වීමට පෙර සහ පසු මුළු ආදායම් විශ්ලේෂණය*

වගු අංක 03: විදේශගත වීමට පෙර සහ පසු ආදායම් විශ්ලේෂණය

| පවුලේ මුළු ආදායම | විදේශ ගතවීමට පෙර පවුලේ මුළු ආදායම | | විදේශ ගතවීමෙන් පසු පවුලේ මුළු ආදායම | |
|---|---|---|---|---|
| | මුළු සංඛ්‍යාව | මුළු ප්‍රතිශතය | මුළු සංඛ්‍යාව | මුළු ප්‍රතිශතය |
| 10,000ට අඩු | 18 | 45% | - | - |
| 10,000-20,000 | 9 | 22.5% | 1 | 2.5% |
| 20,000-30,000 | 6 | 15% | 5 | 12.5% |
| 30,000-40,000 | 2 | 5% | 10 | 25% |
| 40,000-50,000 | 2 | 5% | 14 | 35% |

*මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය (2017)*

මෙම අධ්‍යයනයේ නියැදියට අනුව විදේශගත වීමට පෙර ආදායම රු.10,000ට අඩු පවුල් ප්‍රමාණය සාපේක්ෂව වැඩි අගයක් ගනු ලබයි. එය 38% ප්‍රතිශතයකි. එසේම විදේශගත වීමට පෙර ආදායම රු.50,000 ට වැඩි පවුල් නොමැති වීම ද විශේෂ ලක්ෂණයකි. නියැදියට අනුව පවුල්වල විදේශගත වීමට පෙර ආදායම පවුල් වැඩි ප්‍රමාණයක රු.10,000ත් රු.40,000ත් අතර වේ (52%). නියැදියට අනුව විදේශගත වීමට පසු ආදායම රු.10,000ට අඩු පවුල් කිසිවක් නොමැති බව දැක ගත හැකිය. නියැදියට අනුව විදේශගත වීමට පසු ආදායම රු.40,000 සහ රු.50,000ට වැඩි පවුල් ප්‍රමාණය සාපේක්ෂව වැඩි අගයක් ගනු ලබයි. එය 60% ප්‍රතිශතයකි.

### *4.4 ආදායමේ කල්පිත පරික්ෂාව*

දෙමාව්පියන් විදේශගත වු පවුල්වල විදේශගත විමට පෙර ආදායම, විදේශගත විමෙන් පසු ආදායමට සමාන බව සොයා බැලිම සදහා සිදු කරන ලද කල්පිත පරික්ෂාවට තෝරාගත් නියැදිය තුල විදේශ ගත වූ පුද්ගලයින් 40 ක් පමණක් තෝරාගෙන ඇත.

> $H_0$ : දෙමාපියන් විදේශගත වූ පවුල්වල විදේශගත වීමට පෙර ආදායම, විදේශගත වීමෙන් පසු ආදායමට සමාන වේ.
>
> $H_1$ : දෙමාපියන් විදේශගත වූ පවුල්වල විදේශගත වීමට පෙර ආදායම, විදේශගත වීමෙන් පසු ආදායමට අසමාන වේ.

නියැදියේ ඇතුලත් විදේශගත වූ පුද්ගලයින් සංඛ්‍යාව 30 ට වැඩි නිසා Z ව්‍යාප්තිය භාවිතා කරන ලදි. Z මගින් ගණනය කළ අගය -1027.81 > Z වගු අගය 1.96 බැවින් Ho කල්පිතය ප්‍රතික්ෂේප වේ. එනම් දෙමාපියන් විදේශගත වූ පවුල්වල විදේශගත වීමට පෙර ආදායම, විදේශගත වීමෙන් පසු ආදායමට අසමාන වේ. එනම් විදේශ ගතවීම තුළ පවුල් බොහොමයක අදායම් තත්ත්වය වර්ධනය වී ඇති බව දැක ගත හැකි වේ.

### *4.5 දෙමව්පියන් විදේශගත වීමට පසු ආර්ථික දත්ත විශ්ලේෂණය*

විදේශගත වීමෙන් පසු ප්‍රදේශීය ලේකම් කොට්ඨාස දෙක සැසඳීමේදී වගු අංක 4ට අනුව විදේශගත වීමෙන් පසු ප්‍රදේශීය ලේකම් කොට්ඨාස දෙක සංසන්දනය කිරීමේ දී එම කොට්ඨාස දෙකෙහිම ආදායම වැඩි ඇති නමුත් ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට සාපේක්ෂව අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආදායම වැඩි වීමක් පෙන්නුම් කරයි.

වගු අංක 04: විදේශගත වීමෙන් පසු පවුල්වල ආදායම් සැසඳීම

| ආදායම | ජා-ඇල | අත්තනගල්ල |
|---|---|---|
| 10000 ට අඩු | 0% | 0% |
| 10,000-20,000 | 0% | 4.3% |
| 20,000-30,000 | 11.7% | 13.04% |
| 30,000-40,000 | 35.2% | 17.3% |
| 40,000-50,000 | 35.2% | 34.7% |
| 50,000 ට වැඩි | 17.6% | 30.4% |

*මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය (2017)*

### *4.6 දෙමව්පියන් විදේශ ගතවීම දරුවන්ගේ අධ්‍යාපන මට්ටමට සිදු කරන බලපෑම*

පවුලේ ආර්ථික අපේක්ෂාවන් මූලිකකොට විදේශ රටවල් විවාහකයින් මෙන්ම දෙමව්පියන් විදේශගතවීම පවුලේ ආර්ථික සුබ සිද්ධිය උදෙසා උපකාරී වනු නොඅනුමානය. නමුත් ඔවුන් මෙරට තනිකර දමා යාමෙන් තම ස්වාමි පුරුෂයා හෝ භාර්යාව සහ තම දරුවන්ට දැනෙන මානසික පිරිවැය පිළිබඳව විදේශගත වන පුද්ගලයාට හෝ අන් කිසිවෙකුට නොවැටහේ. පවුලේ ආර්ථිකය ඉහළ ගිය ද තම මව හෝ පියා ළඟ නොමැති අඩුව පිරවීමට ඒ මුදලට හැකි ද යන්න දන්නේ ඒ කුඩා දරුවන් පමණි. ඒ නිසාවෙන් දෙමව්පියන් විදේශගත වීම හේතු කොටගෙන පවුල තුල දරුවන්ට ඇති වන බලපෑම කෙබඳු ආකාරයේ ද යන්න අධ්‍යයනය කිරීම තුළින් ලබා ගත් දත්ත විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කිරීම සහ කල්පිත පරික්ෂාවක නිරත වීමත්, පවුලේ දෙමව්පියෙක් විදේශගත වූවාට පසුව ආර්ථික තත්ත්වය සහ අධ්‍යාපනයට වැය කරන වියදම අතර පවතින සබඳතාව කල්පිත පරික්ෂාව මෙහි දී සිදුවේ.

### *4.7* දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වලට අයහපත් බලපෑම් ඇති කිරීම

වගු අංක 5: දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වලට අයහපත් බලපෑම් ඇති කිරීම

| බලපාන හේතු | අවු 6 ට අඩු | 6-13 ත් අතර | 14-19 ත් අතර |
|---|---|---|---|
| අයහපත් මනෝභාවයන් | 4 | 6 | 3 |
| අකීකරු බව | 2 | 8 | 5 |
| කණ්ඩායම් ගැසිම | | 2 | 2 |
| අධ්‍යාපන කටයුතු අඩාලවිම | 1 | 1 | 1 |
| හුදෙකලා බවට පත් වීම | 0 | 4 | 0 |
| වැරදි ක්‍රියාවලට යොමු වීම | 2 | 1 | 1 |
| ලිංගික අපරාධ වලට යොමු වීම | 0 | 0 | 0 |
| මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීම | 0 | 0 | 2 |

*මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය (2017)*

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 2 ක තුළ මව හෝ පියා විදේශගත වූ පවුල් වල දරුවන්ගේ අයහපත් බලපෑම් ඇති කිරීමට මූලික වූ හේතු අතරින් අවුරුදු 6 ට අඩු ළදරු හෝ පෙර පාසල් අවධියේ සිටින සිසුන් අතරින් වැඩි සිසුන් ප්‍රමාණයක් අයත් වන්නේ අයහපත් මනෝභාවය නම් හේතු සාධකය බව ප්‍රශ්නාවලි ඔස්සේ ලබා ගත් තොරතුරු ඔස්සේ අනාවරණය විය. නියැදියට අයත් සිසුන් 78 අතුරින් අවු. 6 ට අඩු ළමුන් ප්‍රමාණයෙන් 26% ක ප්‍රමාණයක් තම මව/පියා විදේශගතවීම හේතුකොට ගෙන අයහපත් මානසික තත්ත්වයන්ට, එනම් දුර්වල මානසික තත්ත්වයනට පත් වී ඇති බව දැකගත හැකි විය. එසේම අවු 6-13 ත් අතර සිසුන්ගෙන් 32% ප්‍රමාණයක් දෙමව්පියන් ලඟ නොමැතිවීම නිසා අකීකරු බව ඇතිවීම ද, අවු 14-13 ත් අතර ප්‍රමාණයක් මව හෝ පියා ළඟ නොසිටීම හේතුවෙන් අධ්‍යාපන මට්ටම පහළ යාමට ද හේතු වී තිබේ.

### *4.8 දරුවන් අධ්‍යාපන කටයුතු කෙරෙහි දක්වන දක්ෂතා සහ උනන්දුවීම්*

මව හෝ පියා විදේශගත වූ ළමුන් අධ්‍යාපන කටයුතු කෙරෙහි දක්වන දක්ෂතා සහ උන්නදුවීම් පිළිබඳව අවධානය යොමු කිරීමේ දී පියා විදේශගත වූ පවුල්වල දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කෙරෙහි ඇති උන්නදුවට වඩා පවුලේ මව විදේශගත වූ පවුල්වල දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කෙරෙහි දක්වන දක්ෂතා සහ උනන්දුවීම ඉතා අඩු මට්ටමක පවතින බව දැකගත (44%) හැකිය.

වගු අංක 6: දරුවන් අධ්‍යාපන කටයුතු කෙරෙහි දක්වන දක්ෂතා සහ උනන්දුවීම

| දරුවන් අධ්‍යාපන කටයුතු කෙරෙහි දක්වන දක්ෂතා සහ උනන්දුවීම | පියා විදේශගත වූ | | මව විදේශගත වූ | |
|---|---|---|---|---|
| | ළමුන් සංඛ්‍යාව | % | ළමුන් සංඛ්‍යාව | % |
| ඉතා අඩු සැලකිල්ලක් දක්වයි | 14 | 35 | 17 | 44 |
| සාමාන්‍යයි | 11 | 27 | 7 | 18 |
| සැලකිල්ලක් නොදක්වයි | 6 | 22 | 11 | 28 |
| ඉතා හොඳින් කරනු ලබයි | 9 | 22 | 3 | 7 |
| එකතුව | 40 | 100 | 38 | 100 |

*මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය (2017)*

### *4.9 දෙමව්පියන් විදේශගත විම හේතුවෙන් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කෙරෙහි ඇති කරන බලපෑම සැසඳීම*

නියැදිය සඳහා තෝරා ගන්නා ලද අත්තනගල්ල සහ ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 2 පිළිබඳව අවධානය යොමු කිරීමේ දී නියැදියට ඇතුළත් වූ පවුලේ මව හෝ පියා විදේශගත වූ පවුල් අතරින් අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වූ ළමුන්ගෙන් 16% ක ප්‍රමාණයක දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කෙරෙහි අයහපත් බලපෑම් එල්ල කිරීමට මව හෝ පියා විදේශ ගත වීම

මත දරුවෙක් තුළ දුර්වල මානසික තත්ත්වයන් ඇති විම මූලික වී ඇති බව දත්ත විශ්ලේෂණය කිරීමේ දී දැකගත හැකි වේ.

එසේම නියැදියට තෝරාගත් ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වූ ළමුන් 35 දෙනා අතරින් පියා විදේශගත වීම නිසාවෙන් අකීකරු ලෙසින් නොමනා ක්‍රියාවලට යොමු වීම, දරුවන් තුළ පෙර පැවති ළමා වයසේ තෘප්තිය දඟකාර බව නැතිවීම දැකගත හැකිවේ. තව ද මීට අමතරව තම මව හෝ පියා විදේශගත වීම නිසාවෙන් දරුවන්ට අධ්‍යාපන කටයුතු කෙරෙහි අහිතකර ලෙස බලපෑම් ඇති කිරීම, දරුවන් හුදකලා බවට පත් වීම, වැරදි ක්‍රියාවලට යොමු වීම, අධ්‍යාපන කටයුතු අඩාල වන තත්ත්වයට පත් වීම, මත් ද්‍රව්‍ය භාවිතයට පවා හුරු වී ඇති බව අපට දැකගත හැකි විශේෂ ලක්ෂණයකි.

වගු අංක 07: දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කෙරෙහි ඇති කරන බලපෑම සසඳා බැලීම

| බලපෑම් කරන හේතු සාධක | ළමුන් සංඛ්‍යාව අත්තනගල්ල | ළමුන් සංඛ්‍යාව ජා-ඇල |
|---|---|---|
| අයහපත් මනෝභාවයන් | 7 | 6 |
| අකීකකරු බව | 6 | 9 |
| අධ්‍යාපන මට්ටම පහල යාම | 11 | 7 |
| අධ්‍යාපන කටයුතු අඩාල වීම | 1 | 1 |
| හුදකලා බවට පත්විම | 2 | 4 |
| වැරදි ක්‍රියාවලට යොමු වීම | 3 | 0 |
| ලිංගික අපරාධ සිදු වීම | 0 | 0 |
| මත්පැන් භාවිතයට යොමු වීම | 2 | 1 |
| කණ්ඩායම් ගැසීම | 6 | 3 |
| එසේ නොවේ | 43 | 35 |
| එකතුව | 43 | 35 |

*මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය (2017)*

**5. සමාලෝචනය**

දෙමාපියන් විදේශගත වූ පවුල් වල විදේශ ගත වීමට පෙර ආදායම සහ විදේශ ගත වීමට පසු ආදායම අසමාන වේ. ඒ අනුව දෙමාපියන් විදේශගත වීමට පෙර හා පසු ආදායම සමාන වේ යන උපකල්පනය ප්‍රතික්ෂේප වීමෙන් පෙන්නුම් කරනුයේ, විදේශගත වීමට පෙර ආදායම සහ පසු ආදායම අතර වෙනසක් පවතින බවයි. දෙමව්පියන් විදේශගතවිම නිසා ලැබෙන ආදායමේ වර්ධනය සේම වියදම ද වර්ධනය වී තිබේ. මෙය විදේශ ගත වීමට පෙර කල මාසික මධ්‍යයන වියදමට වඩා

දෙගුණයකින් පමණ ඉහළ ගොස් තිබේ. විදේශ ගත වූ දෙමාපියන් තම පවුල් වෙත එවන මුදල් නිසි පරිදි පරිහරණයට හා ආයෝජනය කිරීමෙ දී තාවකාලික අවශ්‍යතා එනම් ආහාර, ඇඳුම් පැළඳුම් වැනි දේ කෙරෙහි මුල් තැනක් ලබා දීම තුළ මුඛ්‍ය අභිලාෂයන්ට අවධානය යොමු වීම නිසා ඇතැම් පවුල් වල ආර්ථික තත්ත්වය, විදේශ ගත වීමට පෙර ආර්ථිකයට සාපේක්ෂව වර්ධනයන් දක්නට නොලැබුණි. විදේශ රැකියා සඳහා දෙමව්පිටයන් විදේශ ගතවීම තුළ පවුලේ සිටින දරුවන්ගේ අධ්‍යාපනය සඳහා තිබූ උනන්දුව හා දක්ෂතා යම් පසු බෑමකට ලක් වී තිබේ. විශේෂයෙන්ම මව විදේශ ගත වූ පවුල් වල දරුවන්ට ඇති වන බලපෑම වැඩිය. දෙමාපියන් විදේශ ගත වීම නිසා දරුවන් මානසික වශයෙන් ගැටලු වලට මුහුණ දිම හා දෙමාපියන්ගේ ලැබෙන ආරක්ෂාව නොලැබීම නිසා දරුවන් හුදකලා  බවට පත් වීම ඇතැම් පවුල්වල දැක ගත හැකි විය. දෙමාපියන් විදේශ ගත වන විට දරුවන්ගේ භාරකාරීත්වයට විශ්වාසදායී අයෙකුට පවරා යා යුතු අතර නිරතුරු දරුවා සමඟ සම්බන්ධතා පවත්වා ගැනීමට දෙමාපියන් කටයුතු කල යුතුයි. කුඩා දරුවන් ඇති දෙමාපියන් විදේශ ගතවීම පිළිබඳ නීතිමය පදනමක් ඇති කල යුතුය. පවතින නීති ක්‍රියාත්මක කරමින් විදේශ ගතවී උපයන ආදායම නිසි ලෙස කළමණාකරණය කළ යුතුය.

දෙමාපියන් විදේශගත වූ පවුල් වල අධ්‍යාපනයට වන හානිය දෙමාපියන් විදේශගත වීමෙන් පසු පවුලේ ආර්ථිකය වර්ධනය වුවත් පවුල් පසුබිමට වන හානිය ගණනය කල නොහැකිය. ළදරු වියේ දරුවන් සිටින පවුල් වල දෙමාපියන් බොහොමයක් විදේශගත වීමෙන් සාමාජානුයෝජන ක්‍රියාවලියට බලපෑම් එල්ල වී ඇත. මේ අනුව පවුලේ ආර්ථිකය ඉහළ නැංවීමට දෙමාපියන් විදේශගත වූ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වල සැලකිය යුතු පසුබැස්මක් සිදුවී ඇත දෙමාපියන් දරුවන් තනිකර යාම වෙනුවට දරුවන්ගේ අධ්‍යාපන කුසලතා නැංවීමට සානුබල ලබා දීම අත්‍යවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සංක්‍රමණ අතීතයේ සිටම සිදු වුවත්, එම සංක්‍රමණ පවුල් සංස්ථාවේ පැවැත්මට ඍජු බලපෑමක් ඇති නොකළ බව පැහැදිලිය. ශ්‍රී ලංකා සමාජයේ පවුලක එක් සාමාජිකයෙකු හෝ කිහිපදෙනෙකු විදේශ ගත වීම එම පවුලේ සෙසු සාමාජිකයන්ට බලපෑම්  සිදු නොකරන ලද්දේ පැරණි සමාජය තුළ සිටි ඥාති සමූහය නිසාය. නමුත් වර්තමානය වන විට විස්තෘත පවුල, න්‍යෂ්ටික පවුල දක්වා වෙනස් වී ඇති නිසා පවුල් සංස්ථාව සමාජය තුළ සාමාජිකයන් කිහිපදෙනෙකුගෙන් සමන්විත ඒකකයක් බවට පත් වී ඇත. මෙවැනි පසුබිමක් තුළ දෙමව්පියන් විදේශ ගත වීම නිසා පවුලේ ආර්ථිකයට සහ  දරුවන්ගේ අධ්‍යාපනයට සිදු වන බලපෑම පරික්ෂා කිරීම අත්‍යවශ්‍ය වන්නකි.

## ආශ්‍රිත ග්‍රන්ථ

අමරතුංග, කේ. (2007), *ශ්‍රී ලංකාවේ පුත්තලම දිස්ත්‍රික්කය පදනම් කරගෙන දෙමාපියන්ගේ විදේශ රැකියා නියුක්තය පවුල් සංස්ථාව කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්* (පර්යේෂණ නිබන්ධනය), කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

ආරියවති, පී.කේ. (1998), *රැකියා සඳහා දෙමාපියන් විදේශගත වීම දරුවන්ගේ අධ්‍යාපන (සාධන මට්ටම) කෙරෙහි වන බලපෑම* (පර්යේෂණ නිබන්ධනය), කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

කුලතිලක, එස්. ඩබ්ලිව්. (2002), *විදේශ රැකියා වල නියුක්ත ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ දූදරුවන් සමාජානුයෝජනය වීම පිළිබඳ අධ්‍යයනයක්* (පර්යේෂණ නිබන්ධනය), කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

විජේනායක, ඩබ්ලිව්. පී. (2016), *ශ්‍රී ලංකාවේ මව විදෙස්ගත වීම දරුවන් කෙරෙහි බලපෑ ඇති ආකාරය දෙස සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්* (පර්යේෂණ නිබන්ධනය), කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

Department of Foreign Employment. (2015). *Female Departures For Foreign Employment By Manpower Levels 1996-2015.* Retrieved from http://www.statistics.gov.lk/NCMS/en/AboutNCMS/Intro.shtm

# Time to First Employment
# (A special reference to University of Kelaniya)

A. P. D. N. Perera[1], D. K. M. Malagala, M. Rasanjalee, P. T. Pathirana,
R. R. A. L. W. Ranathunga

***Abstract***

*Graduate Employability means that higher education alumni have developed the capacity to obtain work. The recent experience reveals that even talented graduates have to wait for a long time to be employed after the graduation. Under this circumstance, graduates' unemployment has become a severe problem in Sri Lanka during the last few decades. Therefore, this study was conducted to investigate the relationship between graduates' faculties and the time to first employment. The sample was chosen using stratified random sampling method. Under the proportional system, 5% of the total population was selected for the sample. The sample of the survey is only from the latest passed out 100 graduates of University of Kelaniya in 2017. Primary data was collected by giving questionnaires to the selected sample unit. Secondary data was obtained from the academic section of the University of Kelaniya and through literature survey. Collected data was analyzed using the SPSS software and MS Excel. Central tendency measures, Chi square test and Point & Interval estimation were used to analyze the data. Analyzed data was presented using tables and charts. According to the data analysis, the average time of getting the first employment of a graduate is about five months. According to the ANOVA table, P-value is 0.044. Hence it can be concluded that there is significant difference between average time to first employment and faculties at 95% confidence level. Finally, we could conclude that there is a difference between the faculty and time to first employment of graduates as per faculties.*

***Key words: Faculty, First employment, Graduate Employability, Time***

[1] Department of Social Statistics, University of Kelaniya.
nadeeshaniperera95@gmail.com

## 1. Introduction

Education is a major criterion of measuring the development of a country. It is also a key determinant of the wealth and prosperity of a nation. One of the main objectives of the education, particularly of higher education, is to prepare students to pursue different careers in a country. University education is the core of the higher education. Universities are supposed to be social institutions which provide facilities for higher intellectual needs of a community as regards both academic knowledge and professional training (Watts, 2006). It identifies multiple duties of universities which help to reach the objectives such as "conduct pure and applied research", "protect the knowledge", "exchange the knowledge", "protect the culture", "solve the social problems as a public service", "help for the modernization", "train the students for the academic and professional sectors", "improve students' thinking skills, physical strength, control emotional feelings, obey the requirements, and enhance the brainpower", "Improve students' requirements such as food, accommodation, medical facilities, guidance and finally, the job opportunities" (Watts, 2006). Accordingly, it is clear, that the "employability of graduates" is a highly expected function of a university. It is said that the major objective of promoting children for higher education in most of Sri Lankan families is to ensure their employability.

The goal of Graduate Studies is to develop in each student an appreciation of knowledge and to provide an intellectual stimulus for advanced study. Graduate study is offered in several fields for students who wish to increase their effectiveness in the arts, sciences, education, government, business and industry (Kevin, et al, 2011). Emphasis is placed upon current thinking, modern practice and research findings in academic and professional education. Generally, graduates are considered as one of the most important human capital in a country. They are expected to work in a middle or top management level providing services to society in various ways. Therefore, in Sri Lanka, there is a considerable demand for higher education. Hence, obtaining a place in a national university is a great challenge for students. However, many students, who are fortunate to enter the universities, have to face numerous challenges especially at the end of the graduation in seeking suitable employments. Employment is a relationship between two parties, usually based on a contract in which one person, the employee, agrees to perform work for another, the employer (Kaufman, 2004).

The concept of employability has been discussed for a number of years but there has been a growing interest in graduate employability over the last decade. As the interest in promoting graduate employability has increased, numerous studies have produced detailed breakdowns and taxonomies of particular skills and attributes required to promote graduate employability such as core skills; key skills; common skills; essential skills; functional skills and skills for life. Graduate Employability means that higher education alumni have developed the capacity to obtain and/or create work (Kinash, Crane, Judd et al., 2015).

Employability also means that institutions and employers have supported the student knowledge, skills, attributes, reflective disposition and identity that graduates need to succeed in the workforce. Graduate employability has continued to attract more attention from scholars and policy makers globally. The recent experience reveals that even talented graduates have to wait for a long time to be employed after the graduation. Many of the graduates have passed out and obtained the graduate certificate, yet could not find suitable employments. Even if one of the main objective of the university education is to improve the skills of students to face the challenges in external society, they have to leave from the university without having sufficient self-confidence and assurance for better employments. Under this circumstance, graduates' unemployment has become a severe problem in Sri Lanka during the last few decades. Therefore, this study was conducted to investigate the relationship difference between the graduates' faculties and the time to first employment with special focus on graduates in University of Kelaniya.

### *1.1 Research Objectives*

The key objective is to study about the time to first employment of graduates as per faculties. The specific objectives are to judge that whether the internship training effects on the first employment of graduates and to investigate that whether the subjects of studying effects on the first employment. This study is important to the all the graduates of the university. Undergraduates can get knowledge about selecting of learning subjects. Policy makers can get information to minimize the unemployment time period of graduates. This study can be used to update the course contents and change the degree programme.

## 2. Literature Review

Dawn (2002) has pointed out on graduate employability. This literature review explains about the employability, employability skills and lot of areas on employability. This is only a wide review on employability. The general conclusion of this research is that training for employability is important, both in terms of general education and more specifically for future employment.

Ariyawansa (2008) has reviewed determinants of graduates' employability of Sri Lankan universities. This study used quality assurance judgement review results relating to the degree programs in Sri Lankan universities conducted by Sri Lanka Quality Assurance Council. It is found that there are many jobs for engineering/science and management graduates in current job market and fewer opportunities are available for graduates from humanities and social sciences. However, as far as quality of degree programs is concerned humanities and social sciences degree programs are better than even some degree programs offered by medical faculties in Sri Lanka.

Toyese (2017) has investigated on graduate employability and communication skills which are an investigation of Nigerian graduates' proficiencies and areas of deficiencies in written English. Error Analysis was used for the identification and categorization of errors in each essay, using grammar, lexis, punctuation and content as major categories. The output of this study calls for remedial intervention by government policy makers, managers of higher education and professionals in the teaching of English in Nigeria. According to this review, one of the critical factors to work on is the communication skill of the graduates, and more importantly, English as a means of official communication. It is therefore recommended that the overall curriculum of all Higher Educational Institutions (HEIs) in the country should be overhauled to give more prominence to the teaching and learning of English.

Galvan, Fisher, Casman & Small (2013) have investigated on assessing the impact of mandatory internships on employability of recent college graduates in Mexico. This research focuses on whether students' performance as interns and the number of internships they completed are significant in determining their employability in various labor-market conditions. This study revealed that the performance as an intern played an important role on

employment and that employability depended on the interaction of a graduate's personal assets, his/her family connections, and whether or not the labor market was contracting. In accordance with literature reviews, we can identify that many of researchers have reviewed on graduate employability and related areas of that. Many researchers have concerned about the internship training and the graduates' first employment. But few researchers have reviewed on graduates' faculties and time to first employment of graduates.

## 3. Methodology

This study was based on graduate employability. So our main target was graduates who completed the degree. Population of this study was the graduates of university of Kelaniya. First, we had to select a sample from the population. So we selected the sample only from the latest passed out graduates of university of Kelaniya in 2017.

A representative sample of 100 graduates was selected for the sample from four faculties of University of Kelaniya who passed out in 2017. This sample was selected because of the convenience of the study. The sample was chosen using stratified random sampling method. Under the proportional system, 5% of the total population was selected for the sample.

Table 01: Selecting the sample under the proportional system


| **Faculty** | **Male** | **Female** | **Total** |
|---|---|---|---|
| Social Sciences | $\left[106 \times \frac{5}{100}\right]$=5 | $\left[658 \times \frac{5}{100}\right]$=33 | 38 |
| Humanities | $\left[64 \times \frac{5}{100}\right]$=3 | $\left[236 \times \frac{5}{100}\right]$=12 | 15 |
| Commerce | $\left[203 \times \frac{5}{100}\right]$=10 | $\left[333 \times \frac{5}{100}\right]$=16 | 26 |
| Science | $\left[205 \times \frac{5}{100}\right]$=10 | $\left[233 \times \frac{5}{100}\right]$=11 | 21 |
| Total | 28 | 72 | 100 |

*Source: Sample Survey (2018)*

Primary data was collected using questionnaires to the selected sample unit. Secondary data was obtained from the academic section of the University of Kelaniya and through literature survey.

Collected data was analyzed using the SPSS software and MS Excel. Some of analytical methods were used to analyze data. Central tendency measures, hypothesis testing, Chi square test and Estimation (Point & Interval estimation) were used as analysis methods. Analyzed data was presented by using tables and charts.

Chart 01 : Sample Distribution




*Source: Sample Survey (2018)*

## 4. Results

### *4.1 Time to first employment of graduates as per faculties*

The key objective of the research is to study about the time to first employment of graduates as per faculties. We calculate the average time by using Mean as a central tendency measure. According to the data analysis, the average value of getting the first employment of a graduate of faculty of Social Sciences is 6.38, a graduate of faculty of Humanities is 4.80, a graduate of faculty of Commerce & Management is 5.00 and a graduate of faculty of Sciences is 4.71. According to that, the average time of getting the first employment of a graduate is about five months.

Table 02: The average time of getting the first employment of a graduate

| Faculty | Mean | N | Std. Deviation |
|---|---|---|---|
| Social Sciences | 6.38 | 32 | 2.166 |
| Humanities | 4.80 | 15 | 2.513 |
| Commerce | 5.00 | 26 | 2.546 |
| Science | 4.71 | 21 | 2.591 |
| Average | 5.37 | 94 | 2.497 |

*Source: Sample Survey (2018)*

According to the ANOVA table, P-value is 0.044. A lower P-value than 0.05 is accepted to reject the null hypothesis. So we reject the $H_o$. Hence it can be concluded that there is significant difference on average time to first employment as per faculties at 95% confidence level.

Table 03 : ANOVA Table

| ANOVA Table | | | |
|---|---|---|---|
| | Sum of Squares | F | Sig. |
| Between Groups | 49.782 | 2.817 | .044 |
| Within Groups | 530.186 | | |
| Total | 579.968 | | |

*Source: Sample Survey (2018)*

***4.2 Estimation of Employability***

In the year of 2017, total of 2038 graduates have passed out from the internal degree programs. And, for this survey, 100 graduates have been responded.

Thus, $N = 2038\ and\ n = 100$. Out of the sample of 100 graduates, 94 are employed (employed/engaged in volunteer service). Thus, $r = 94$

The sample proportion of employed graduates are, $p = \frac{r}{n} = \frac{94}{100} = 0.94$.

Sample proportion is an unbiased estimator for the population proportion. Thus, population proportion of employed graduates are,

$$p = \frac{282}{348} = 0.81$$

The variance of the population proportion estimator is,

$$Var(P) = \frac{p(1-p)}{n-1}$$

$$Var\ (p) = 0.00057$$

Therefore, the 95% confidence interval for population proportion of employed graduates are,

$$p\ \pm\ \left(z_{\frac{\alpha}{2}}\sqrt{\frac{p(1-p)}{n-1}} + \frac{1}{2n}\right)$$

Thus, there is a 95% probability that the population graduate employability of 2017 may lie between 88% to 99% That is, out of 2038 graduates, a number between 1810 to 2022 may employ by now.

### *4.3 Relationship Between Time to First Employment and Faculties*

When studying about the time to first employment of graduates as per faculties, Chi square test was used to test whether the faculties effect on the first employment of graduates. Hypothesis were built as mentioned below.

$H_o$: Faculty does not effect on the first Employment.

$H_1$: Faculty effects on the first employment.

Table 04: Chi Square Test

| | Value | df | Asymp. Sig. (2-sided) |
|---|---|---|---|
| Pearson Chi-Square | 8.492[a] | 3 | .037 |
| Likelihood Ratio | 8.718 | 3 | .033 |
| N of Valid Cases | 94 | | |

a. 0 cells (0.0%) have expected count less than 5. The minimum expected count is 7.34.

When regarding the null hypothesis which faculty does not effect on the first employment, $H_o$ is rejected at 5% error level. Here P-value is 0.037. A lower P-value than 0.05 is accepted to reject the null hypothesis, which represented in the Table 4. Therefore, it can be concluded that faculty effects on the first employment.

### *4.4 Relationship between the Internship Training and the First Employment*

When investigating whether the internship training effects on the first employment of graduates, Chi square test was used to test whether the internship training effects on the first employment of graduates. Hypotheses were built as mentioned below.

$H_0$: Internship training doesn't effect on the first employment.

$H_1$: Internship training effects on the first employment.

Table 05: Chi Square Test

| | Value | Df | Asymp. Sig. (2-sided) | Exact Sig. (1-sided) |
|---|---|---|---|---|
| Pearson Chi-Square | .006[a] | 1 | .937 | |
| Continuity Correction[b] | .000 | 1 | 1.000 | |
| Likelihood Ratio | .006 | 1 | .937 | |
| Fisher's Exact Test | | | | .590 |
| N of Valid Cases | 94 | | | |

When regarding the null hypothesis which internship training doesn't effect on the first employment, $H_o$ is accepted at 5% error level. Here P-value is 0.590. A higher P-value than 0.05 is accepted to accept the null hypothesis. Therefore, it can be concluded that the internship training does not effect on the first employment.

### *4.5 Relationship Between First Employment and The Duration of the Internship*

When investigating about first employment and the duration of the internship training, Chi square test was used to test the relationship between the first employment and the duration of the internship training. Hypotheses were built as mentioned below.

$H_o$: There is no significant relationship between the first employment and the duration of the internship training.

$H_1$: There is significant relationship between the first employment and the duration of the internship training.

Table 06: Chi Square Test


| | Value | Df | Asymp. Sig. (2-sided) |
|---|---|---|---|
| Pearson Chi-Square | 2.482[a] | 2 | .289 |
| Likelihood Ratio | 2.575 | 2 | .276 |
| N of Valid Cases | 87 | | |

a. 2 cells (33.3%) have expected count less than 5. The minimum expected count is 3.95.

When regarding the null hypothesis which there is no significant relationship between the first employment and the duration of the internship training, $H_o$ is accepted at 5% error level. Here P-value is 0.289. A higher P-value than 0.05 is accepted to accept the null hypothesis. Therefore, it can be concluded that there is no significant relationship between first employment and the duration of the internship training.

### *4.6 Usefulness of the internship training*

Chart 02 : Usefulness of the internship training





*Source: Sample Survey (2018)*

We investigated about the usefulness of the internship training to the first employment of the graduates at the university. According to the data analysis, 35% of graduates have expressed that their internship training was usually useful to the first employment. 16% of graduates have expressed that their internship training was not useful to the first employment.

### *4.7 Impact of subjects studying on the first employment*

Chart 03: Frist job related your degree




*Source: Sample Survey (2018)*

When studying whether the subjects of studying effects on the first employment**,** we could identify that the most of graduates who involve with their first job related to their subjects of studying are the Commerce graduates. The most of graduates of faculty of Social Sciences do not involve with their first job related to their subjects of studying.

### *4.8 Impact of Faculty on the first employment*

When investigating whether the faculty effects on the first employment that related to the degree, Chi square test was used to test the relationship between the first employment and the faculty. Hypothesis were built as mentioned below.

$H_0$: There is no significant relationship between the first employment and the faculty.

$H_1$: There is significant relationship between the first employment and the faculty.

Table 07: Chi Square Test


| | Value | df | Asymp. Sig. (2-sided) |
|---|---|---|---|
| Pearson Chi-Square | 3.543[a] | 3 | .315 |
| Likelihood Ratio | 3.570 | 3 | .312 |
| N of Valid Cases | 95 | | |

a. 0 cells (0.0%) have expected count less than 5. The minimum expected count is 6.47.

When regarding the null hypothesis which there is no significant relationship between the first employment and the faculty, $H_o$ is accepted at 5% error level. Here P-value is 0.315. A higher P-value than 0.05 is accepted to accept the null hypothesis. Therefore, it can be concluded that there is no significant relationship between the first employment and the faculty.

***4.9 The Reasons for first employment***

Chart 04: Resons for the first employment





*Source: Sample Survey (2018)*

When finding the reasons for the first employment, we could identify that most of graduates have involved with their first employment based on educational qualifications it can be shown as a percentage value of 50.57%. According to the research, 8.05% of graduates have involved with their first employment based on computer skills.

### *4.10 Section of the first employment*

Chart 05: Section of the first employment




*Source: Sample Survey (2018)*

When finding the section of the first employment, we could identify that most of graduates have involved with their first employment in private sector. It can be shown as a percentage value of 66%. According to the research, 14% of graduates have involved with their first employment in self-employment. 20% of graduates have involved with their first employment in government sector.

## 5. Conclusion

According to the data analysis, the majority of the graduates who were in the faculty of Social Sciences and the Faculty of Humanities have involved with their first employment at a low time after the graduation. According to the chi analysis, the faculty effects on the first employment of graduates. Regarding about the internship training and the first employment, we could identify that internship training does not effect on the first employment. And the duration of the internship training does not effect on getting first employment. According to the respondents, the internship training was usually useful to get the first employment. When investigating whether the subjects of studying effect on the first employment, we could find that many of graduates of faculty of Commerce and Management have involved with subject related job. Few of graduates of faculty of Social Sciences involve with subject related jobs. When studying about the factors of getting the first employment, we can conclude that many of graduates have involved to the first employment as per educational qualifications. When investigating about the section of the first employment, many of graduates have involved to the first employment in private sector. Finally, we can conclude that there is a difference between the faculty and time to first employment of graduates as per faculties.

We recommend to reduce the time to first employment through entering special training programs into the subject course units regarding the degree course and to develop the internship training further productively. We suggest to generate employments related to the degree through motivating private sector. Most of graduates have involved with the first employment accordance with the educational qualifications. So we recommend to develop the quality of the degree.

**References**

Ariyawansa, R. G. (2008). Employability of Graduates of Sri Lankan Universities. *Sri Lankan Journal of Human Resource Management,* 2(1), 91-104

Dawn, L, (2002) *Graduate Employability,* LTSN Generic Centre, Retrieved from http://qualityresearchinternational.com/esecttools/esectpubs/leeslitreview.pdf

Galvan, J., Fisher, E., Casman, E., and Small, M. (2013). Assesing the impact of mandatory internships on employability of rcent college graduates in Mexico. *In proceedings of 2013 CIEC –ASEE Annual conference,* Phoenix, Arizona, USA

Kaufman E. B. (2004). What Unions Do: Insights from Economic Theory, *Journal of Labour Research*, 25(3), 351-382

Kevin, L., Stuart, H., Dely, E. and Jon, L. (2011). *Employers' perceptions of the employability skills of new graduates,* University of Glasgow SCRE Centre and Edge Foundation

Kinash, S., Crane, L., Judd, M. M., & Knight, C. (2016). Discrepant stakeholderperspectives on graduate employability strategies. *Higher Education Research and Development*, 35(5), 951-967

Toyese, N. D. (2017). Graduate Employability and Communication Skills. *World Journal of English Language*, 7(3), 49 – 61

Watts, A.G., (2006). *Career development learning and employability*, The Higher Education Academy, United Kingdom, Retrieved from https://www.qualityresearchinternational.com/esecttools/esectpubs/watts%20career.pdf

# ශ්‍රී ලංකාවේ ජනගහනයේ මෑත කාලීන උපනතීන්

ඩී. ඒ. කේ. චතුරංගනි[1]

***සංක්ෂේපය***

*ජනගහනය යනුවෙන් හැඳින්වෙන්නේ නිශ්චිත කාල පරාසයක් තුළ තෝරා ගන්නා ප්‍රදේශයක ජීවත් වන සියලුම මිනිසුන් සංඛ්‍යාව වේ. ඕනෑම රටක ජන සංඛ්‍යාව යනු එරට ප්‍රජා විද්‍යාත්මක සාධක පිළිබිඹු කරන ප්‍රධානතම සාධකයක් ලෙස පෙන්වා දිය හැක. රටේ ආර්ථිකය ගැන සැලකීමේදී ජනගහනය ඉතා තීරණාත්මක සාධකයක් බව අතීත උදාහරණ රාශියකින් ඔප්පු වී ඇත. ශ්‍රී ලංකාවේ ජනගහනයේ මෑත කාලීන උපනතීන් පිළිබඳව අධ්‍යයනයේ දී 1871 ශ්‍රී ලංකාව තුළ පැවැත් වූ ප්‍රථම ජන සංගණනය වැදගත් වන අතර එය හේතුකොට ගෙන එම කාල වකවානුවේ පැවැති ගති ලක්ෂණයන් සහ එම ලක්ෂණයන් වර්තමානය වන විට එනම් 2012 අවසාන සංගණනය වන විට කොතෙක් දුරට වෙනස් ව ඇත් දැයි යන්න සහ 2012 සංගණනය පාදක කර ගනිමින් ශ්‍රී ලංකාවේ වර්තමාන ජනගහනයේ හඳුනාගත හැකි උපනතීන් මොනවා ද යන්න මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ. මෙම මෑත කාලීන උපනතීන් ශ්‍රී ලංකාවේ ඉදිරි සංවර්ධන ගමනට එල්ල කරන බලපෑම සොයා බැලීම තවත් උප අරමුණක් ලෙස දැක්විය හැකිය. මේ සඳහා ද්විතීයික දත්ත යොදා ගන්නා ලදී. එනම් ජන හා නිවාස සංගණන වාර්තා මේ සඳහා භාවිතා කර ඇත. වගු හා ප්‍රස්තාර වැනි සරල සංඛ්‍යාන ක්‍රම මඟින් දත්ත විශ්ලේෂණය කරන ලදී. 2001 වර්ෂය වන විට ජනගහන වර්ධන වේගය 2.1% ක් වුවද 2012 සංගණන වාර්තා අනුව එය 0.7% දක්වා අඩු වී ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ ජනගහනයේ මෑත කාලීන උපනතීන් පිළිබඳව කරන ලද මෙම අධ්‍යයනයේ දී ජන සංඛ්‍යා වර්ධන වේගය ක්‍රමයෙන් පහළ බැසීම, නගර කරා ජනයා ඇදී යාම, රැකියා සහ අධ්‍යාපන කටයුතු සඳහා විදෙස්ගත වීමේ සංඛ්‍යාව වැඩි වීම, ළමා ජන සංඛ්‍යාව අඩු වීම, ජන සංඛ්‍යාව වයස්ගත වීමේ ප්‍රවණතාවක් දක්නට ලැබීම, මුළු ජනගහනයෙන් ස්ත්‍රී ප්‍රතිශතය ඉහළ යාම, ආදී ප්‍රධාන උපනතීන් කිහිපයක් හඳුනාගත හැක.*

***මුඛ්‍ය පද: උපනතීන්, ජනගහනය, වර්ධනය, ශ්‍රී ලංකාව***

## 1. හැඳින්වීම

ඕනෑම රටක ජන සංඛ්‍යාව යනු, එරට ප්‍රජා විද්‍යාත්මක සාධක පිළිබිඹු කරන ප්‍රධාන ම සාධකයක් ලෙස පෙන්වා දිය හැක. ධනාත්මකව මෙන්ම ඍණාත්මකව ද සමාජයක ජනගහනයක් එම රටේ සංවර්ධනය හා බැඳී පවතී. ශ්‍රී ලංකා ජනගහනය පිළිබඳව අධ්‍යයනයේ දී ජන සංඛ්‍යාව වැදගත් සාධකයක් බවට පත් වන්නේ සංවර්ධනය වන රටක් ලෙස සංවර්ධිත රටක් බවට පත්වීමේ අරමුණ සාක්ෂාත් කරගැනීමේදීය. රටේ ආර්ථිකය ගැන සැලකීමේදී ජනගහනය ඉතා තීරණාත්මක සාධකයක් බව අතීත උදාහරණ රාශියකින් ඔප්පු වී ඇත. ශ්‍රී ලංකාවේ ජනසංඛ්‍යාව

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
kasunicranawaka@gmail.com

පිළිබඳ ව විධිමත් ව දත්ත එක්රැස් කරනු ලබන්නේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ජන හා නිවාස සංගණන මඟිනි. ඒ අනුව මුල් ම විධිමත් ජන සංගණනය 1871 වර්ෂයේ දී පවත්වා ඇති අතර සාමාන්‍යයෙන් වසර දහයකට වරක් ජන හා නිවාස සංගණන පවත්වනු ලැබේ.

ශ්‍රී ලංකාව, ආර්ථික වශයෙන් සංවර්ධනය වෙමින් පවතින රටක් වුවද ළදරු මරණ, මාතෘ මරණ, ආයු අපේක්ෂාව, සාක්ෂරතාව වැනි ජන සංඛ්‍යාවේ ඇතැම් ගුණාත්මක ලක්ෂණ අනුව සංවර්ධිත රටක ලක්ෂණ පෙන්නුම් කෙරේ. ඒ අනුව සංවර්ධනය වෙමින් පවතින රටවල් හා සසඳන විට විශේෂ තත්ත්වයක් ශ්‍රී ලංකාවේ දක්නට ලැබේ. අධ්‍යාපනය සහ සෞඛ්‍ය ක්ෂේත්‍රවල ප්‍රගතිය මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබේ. ජනගහන වර්ධනය අහිතකර ලෙස බලපාන බව 1970 දශකයේ ලෝකවාසීන්ගේ දෘෂ්ටිය විය. 1978 මෝල්තස්ගේ මැල්තුසියානුවාදයත් සමඟ එය ස්ථාවර මතයක් බවට පත්විය. එනමුදු ජුලියන් සයිමන් හා හර්බට් ඛාන් (1984) වැන්නවුන් මෙයට පටහැනි අදහසක් ඉදිරිපත් කරමින් කියා සිටියේ තවමත් සංවර්ධනය වෙත යොමු නොවූ විශාල සම්පතක් ලෝකය සතු ව ඇති බවත් එය මානව සම්පත බවත් ය (දිසානායක, 1998). මෙයින් අනතුරුව ජනයා මානව සම්පත මෙන් ම මානව සම්පතෙ හි ගුණාත්මක බව වර්ධනය කිරීම උදෙසා ද සිය අවධානය යොමු කරන ලදී. 1992 මිහිතල සමුළුවේ දී සාකච්ඡා කරන ලද ආකාරයට ශ්‍රී ලංකාව යනු අඩු ඒක පුද්ගල ආදායම් තත්ත්වයක් යටතේ වුව ද මෑත වර්ෂවල දී ඉතා කෙටි කාලයක් තුල ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තියේ ඉහළ හා පරිණත අවස්ථාවන්ට අවතීර්ණ වූ රාජ්‍යයකි. ශ්‍රී ලංකාව ජන විකාශන විද්‍යාත්මක විද්‍යාගාරයක්ය යන අයුරින් ටෝබර්ගේ කියමන මේ අදහස තව දුරටත් තහවුරු කරයි (ජයකොඩි, 2008).

### *1.1 පර්යේෂණ අරමුණු*

ශ්‍රී ලංකාවේ ජනගහනයේ මෑත කාලීන උපනතීන් පිළිබඳව අධ්‍යයනය කරන විට 1871 වර්ෂයේ ශ්‍රී ලංකාව තුළ පැවැත් වූ ප්‍රථම ජන සංගණනය වැදගත් වන අතර එය හේතුකොට ගෙන එම කාල වකවානුවේ පැවැති ගති ලක්ෂණයන් සහ එම ලක්ෂණයන් වර්තමානය වන විට, එනම් 2012 අවසාන සංගණනය වන විට කොතෙක් දුරට වෙනස් ව ඇතිදැයි යන්න සහ 2012 සංගණනය පාදක කර ගනිමින් ශ්‍රී ලංකාවේ වර්තමාන ජනගහනයේ හඳුනාගත හැකි උපනතීන් මොනවාද යන්න මෙම පර්යේෂණ මාතෘකාවේ ප්‍රධාන අරමුණ වේ. මෙම මෑත කාලීන උපනතීන් ශ්‍රී ලංකාවේ ඉදිරි සංවර්ධන ගමනට එල්ල කරන බලපෑම සොයා ගැනීම තවත් උප අරමුණක් ලෙස දැක්විය හැකිය.

### 2. සාහිත්‍ය විමර්ශනය

ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධන වේගය තිරසාර සංවර්ධනයට බලපාන බව තහවුරු වේ (ජයකොඩි , 2008). 2008 වර්ෂයේ ඒ. ටී. පී. එල්. අබේකෝන් ශ්‍රී ලංකාවේ ජනගහනය වියපත්වීම සම්බන්ධයෙන් මතු වෙමින් පවතින ගැටළු යන ග්‍රන්ථයෙන් ජනගහනය වියපත් වීම නිසා නිසා ආර්ථික වර්ධනයට බලපෑම් ඇති කරන බව දක්වා ඇත (අබේකෝන් , 2008). 1997 වර්ෂයේ ආරියවංශ දිසානායක, ප්‍රජා

විද්‍යාත්මක දත්ත මූලාශ්‍ර සහ 1946 න් පසු ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා වර්ධන උපනතීන් පිළිබඳ විග්‍රහයන් යන කෘතියෙන් ජන සංඛ්‍යාවේ වර්ධනය දක්වා ඇත (දිසානායක,1997). ඔහු විසින් ජනගහනයේ වර්ධනයක් පෙන්නුම් කර ඇත. 2012 වර්ෂයේ ටී. ආර්. ප්‍රියදර්ශන මහතාගේ ජනගහන වියපත්වීමේ ආර්ථික හා සමාජීයිය ප්‍රතිවිපාක යන කෘතියෙන් ජනගහන වියපත් වීමේ උපනතින් දක්වා ඇති අතර එමගින් ශ්‍රී ලංකාවේ ජනගහන විෂමතා පෙන්නුම් කරයි (ප්‍රියදර්ශන, 2012). 2008 වර්ෂයේ, ඩබ්ලිව්.අයි ද සිල්වා,ශ්‍රී ලංකාවේ වියපත් වන ජනගහනය සහ සමාජ ආරක්ෂණය නමැති කෘතිය මගින් ඉහළ යන වියපත් ජනගහනයට සාපේක්ෂව සිදුකළ යුතු සමාජ ආරක්ෂණ වැඩපිළිවෙළවල් පිළිබඳ අදහස් දක්වා ඇත (ද සිල්වා , 2008).

## 3. පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය ප්‍රධාන වශයෙන් ද්විතීයික මූලාශ්‍ර පදනම් කොට සිදු කර ඇති අතර එනම් 1871 සිට 2012 දක්වා, වසර 140 කට ආසන්න කාල සීමාවක් තුළ සිදු කරන ලද සංගණන ආශ්‍රයෙන් ප්‍රකාශ කරන ලද වාර්තා භාවිතයෙන් සිදු කරන ලදි. මේ හේතුවෙන් සෑම සංගණනයක ම දත්ත මගින් ඒ වර්ෂ 10 ට ම අයත් දත්ත නිරූපණය වෙතැයි උපකල්පනය කර ඇත. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2012 වර්ෂයේ ජන හා නිවාස සංගණනයේ ප්‍රධාන තොරතුරු, යන වාර්තාව ඇසුරින් ආර්ථිකමය දත්ත ලබාගෙන ඇත (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012). මීට අමතර ව ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා හා සාහිත්‍යය අධ්‍යයනයන් තුළින් ද ද්විතීයික දත්ත සපයා ගන්නා ලදී. දත්ත විශ්ලේෂණයේ දී වගු, ප්‍රස්තාර, රේඛාංකික සිතියම් සහ සාපේක්ෂ සංඛ්‍යාතීන් භාවිතයට ගෙන ඇත.

## 4. දත්ත විශ්ලේෂණය

ශ්‍රී ලංකාවේ මුල් වරට ජන සංගණනයක් සිදු කරනු ලැබුවේ, 1871 වසරේදී ය. එම වසරේදී රටේ මුළු ජන සංඛ්‍යාව මිලියන 2.4 විය. කෙසේ වුව ද මුළු දිවයිනම ආවරණයවන පරිදි සංගණනයක් පැවැත්වුයේ 1981 වසරේදී ය. එහෙත් 2001 වසරේදී පැවති ජන සංගණනයේදී ආවරණය වූයේ දිස්ත්‍රික්ක 18ක් පමණි. 1981 වසරේ පැවැත් වූ ජන හා නිවාස සංගණනයට පසු අවසන් වරට මුළු දිවයිනම ආවරණය වන පරිදි සංගණනයක් පැවැත්වුයේ 2012 වසරේදී ය. 2012 මාර්තු 20 පැවැත්වූ සංගණනයට අනුව ශ්‍රී ලංකාවේ මුළු ජනගහණය 20,359,439 ලෙස වාර්තා වේ (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012). ජනගහනය වාර්ෂිකව ක්‍රමයෙන් වැඩිවන අතර 1871ට සාපේක්ෂව 2012 වසර වන විට ශ්‍රී ලංකාවේ ජනගහනය අට ගුණයකට වඩා වැඩි ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇත. වර්තමානය වන විට විශාලතම ජනගහනය වාර්තා වන්නේ කොළඹ දිස්ත්‍රික්කයෙනි. එය මිලියන 2.3 වන අතර මුළු ජනගහනයෙන් 11.4% කි. ගම්පහ දිස්ත්‍රික්කයෙන් ද ඒ හා සමාන ජනගහනයක් ව්‍යාප්ත වී සිටින අතර එම ප්‍රමාණය 2.3 වන අතර මුළු ජනගහනයෙන් 11.3% කි. කුරුණෑගල, මහනුවර, කළුතර, රත්නපුර හා ගාල්ල යන දිස්ත්‍රික්ක තුළ ද මිලියන එකකට අධික ජනගහනයක් වාර්තා වේ. මෙම දිස්ත්‍රික්ක හත තුළ මුළු ජනගහනයෙන් භාගයකට වැඩි ප්‍රමාණයක් එනම් 54% ක් සිටින අතර


ඔවුන් ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් හතරෙන් එකකටත් වඩා අඩු භූමි ප්‍රමාණයක ව්‍යාප්තව ඇත. උතුරු පළාතේ මුලතිව්, මන්නාරම, කිලිනොච්චි සහ වව්නියාව යන දිස්ත්‍රික්ක තුළ පසුගිය කාලය තුළම අඩු ජනගහන ව්‍යාප්තියක් වාර්තා වේ. මුලතිව් හා මන්නාරම යන දිස්ත්‍රික්ක වල ජනගහනය 100,000 කටත් අඩු ය. දිස්ත්‍රික්ක අතර ජනගහනය ව්‍යාප්ත වීමේ විෂමතාවය පිළිබඳ අවධානය යොමු කිරීමේදී විවිධ වූ පැතිකඩ රාශියක් ඔස්සේ සාකච්ඡාවට බඳුන් කළ හැකිය. එනම් ජනගහනයේ විශාලත්වය වර්ධනය සහ ව්‍යාප්තිය, විවාහකතත්වය, සාඵල්‍යතාවය, සාක්ෂරතාවය, අධ්‍යාපනය, සංක්‍රමණ, නාගරීකරණය, ආදියයි. මෙලෙස ගත් කල ශ්‍රී ලංකා ජනගහනයේ මෑත කාලීනව හඳුනාගත හැකි උපනතීන් පහත පරිදි සාකච්ඡාවට බඳුන් කළ හැක.

### *4.1 ජන සංඛ්‍යා වර්ධන වේගය ක්‍රමයෙන් පහළ බැසීම.*

යම් රටක ජන සංඛ්‍යාව වර්ධනය වීම සිදු වන්නේ ක්‍රමානුකලව ය. 1871 පළමු සංගණනයේ දී 0.9 ක් වූ වර්ධන වේගය 1953 වන විට 2. 8 දක්වා ඉහළ ගියේ ය. ඉන් පසු වසර 30ට ඉහළ වර්ධනයක් පෙන්නුම් කළ අතර 1981න් පසු වර්ධන වේගය මදක් අඩු විය. පළමු සංගණනයේදි ලක්ෂ 24 ක ජන සංඛ්‍යාව වසර 60 ක් ගතවීමෙන් පසු එනම් 1931 දි ලක්ෂ 53 බවට පත්විය. එහි සිට තවත් වසර 30ක් ගතවන විට ලක්ෂ 105ක් බවට පත්විය.

1999 වර්ෂයේදි 1.5 ක් වු ජන සංඛ්‍යා වර්ධන වේගය 2005 දි 1.1ක් වු අතර, එය 2007 දි 0.6 දක්වා පහත බැස ඇත. ස්ත්‍රීන්ගේ සාඵල්‍යතාවය ජන සංඛ්‍යා වර්ධන වේගය සඳහා බලපායි. 1953 දි ස්ත්‍රීන්ගේ සාඵල්‍යතාවය 5.3 ක් වූ අතර, වර්තමානය වන විට 1.9 අඩුකර ගැනීමත් සමග ජන සංඛ්‍යා වර්ධන වේගය ක්‍රමානුකලව අඩු විය. ඒ සඳහා ස්ත්‍රීන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ යාම, වෛද්‍ය විද්‍යාවේ දියුණුව, කුඩා පවුල් කෙරෙහි අවධානය යොමු කිරිම, උපත් පාලන ක්‍රම අනුගමනය කිරිම, ළදරු මරණ අඩුවීම, මාතෘ මරණ අඩුවීම ආදිය නිසා 2.8 ක තිබූ වර්ධන වේගය 2001 වන විට 1.2 දක්වා ද 2012 සංගණන දත්ත වලට අනුව වර්තමානයේ එම අ.ය 0.7 ක් දක්වා පහළ බැස ඇති බව පැහැදිලිය (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012).

ප්‍රස්තාරය 01 : ජනගහනයේ විශාලත්වය සහ වර්ධනය 1871-2012




*මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2012)*

### *4.2 නගර කරා ජනයා ඇදී යාම.*

වර්තමාන ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටවල නාගරික ජන සංඛ්‍යාව මෙන් ම නාගරික මට්ටම ද ක්‍රමයෙන් වැඩි වෙමින් පවතී. ශ්‍රී ලංකාවේ නාගරික ජනගහනය වැඩිම දිස්ත්‍රික්ක 8 වන්නේ කොළඹ, කඩුවෙල, දෙහිවල ගල්කිස්ස, මොරටුව, මීගමුව, කෝට්ටේ සහ කැස්බෑව සහ මහරගම යන මහා නගර සභා ය. මුළු නාගරික ජනගහනයෙන් 50% ක් පමණ මෙම නගර තුළ ජීවත් වේ. මෙම ප්‍රදේශයන් සියල්ලම බස්නාහිර පළාතට අයිතිවීම විශේෂ ලක්ෂණයකි. ඉන් 7ක් කොළඹ දිස්ත්‍රික්කයට ද එකක් ගම්පහ දිස්ත්‍රික්කයට ද අයත් වේ. එබැවින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන නාගරික කලාප කොළඹ දිස්ත්‍රික්කය වටා ඒකරාශි වී ඇත. නගර කරා ඇද ගැනීමේ සාධක ලෙස අධ්‍යාපන පහසුකම් ප්‍රසාරණය වීම, යටිතල පහසුකම් ප්‍රසාරණය වීම, නගරවල සැපවත් ජීවිතයක් ගත කල හැකි වීම, රාජ්‍ය හා පෞද්ගලික ආයතන පිහිටුවීම නිසා රැකියා අවස්ථා බහුලවීම, ප්‍රධාන සේවා මධ්‍යස්ථාන පිහිටිම ආදිය දැක්විය හැකි ය.

මේ නිසා නගරවල වාසය කරන සියලුම දෙනාට වැඩි වැටුපක් සහිත රැකියා ලබා ගැනිමේ ගැටළුවක් පවති. තවද නාගරීකරණය ආශ්‍රිතව විවිධ සමාජීය හා පාරිසරික ගැටළු රාශියක් හඳුනා ගැනිමට හැකියාව ලැබේ. එහෙයින් සමහරු සුළු මුදලක් උපයා ගත හැකි අවිධිමත් අංශයේ සුළු වෙළදාම, විවිධ සේවා සැපයිම, පදික වෙළෙදාම වැනි රැකියාවන් වල  නිරත වේ. නමුත් තවත් කොටසක් නිත්‍යානුකල නොවන හිගාකෑම, මනුෂ්‍ය ඝාතන, ගණිකා වෘත්තිය, ගැට කැපීම, සොරකම් හා මත්ද්‍රව්‍ය අලෙවිය වැනි අපචාරී ක්‍රියාවන්හි නියැලේ. ඔවුන්ගේ ආදායම අඩු ය. එම නිසා ඔවුන්ට පදිංචියට සුදුසු නිවසක් සපයා ගැනිම දුෂ්කර වේ. මොවුන් අතරින් වැඩිදෙනෙකු අනවසරයෙන් තැනු පැල්පත්වල ජිවත් වේ.

මෙම පැල්පත් වල මුඩුක්කු ආදියෙහි විශාල ජන සංඛ්‍යාවක් ජිවත්වීම නිසා පැන නගින තවත් ප්‍රශ්නයක් ලෙස සෞඛ්‍ය ගැටළුව දැක්විය හැක. මේ හේතුවෙන් නිවාස තුළ තදබදයක් පවතින අතර එම නිවාස තුළින් බැහැර කරනු ලබන කැළි කසළ නිසි ආකාරයෙන් බැහැර කිරීමට ස්ථාන නොමැති වීම හා නිවාස ආසන්නයේ ම ඉවත් කිරිම හේතුවෙන් නාගරික අපිරිසිදු බවක් ඇති වේ. තව ද වර්ෂාවත් සමග මෙම කැළි කසළ ජලයට එකතු වීමෙන් දුර්ගන්ධය වහනය වනවා මෙන් ම මැසි මදුරු හා කෘමීන් බෝවන ස්ථාන බවට පත්වේ. එය බරවා, ඩෙංගු , පාචනය වැනි භයානක රෝග වේගයෙන් පතුරුවා හරියි. නාගරික ජනාවාසවල කර්මාන්තශාලා විශාල ප්‍රමාණයක් ස්ථාපිත කර ඇති හෙයින් මෙම ප්‍රදේශවල ජල දුෂණය, වායු දුෂණය මෙන්ම, පාංශු දුෂණය වැනි පාරිසරික ගැටළු රැසක් ඇති කරනු ලබයි. ඒ අතර, මෙම කම්හල් වලින් බැහැර කරන රසායකින ද්‍රව්‍ය සහිත අපවිත්‍ර ජලය ඇතුලු අපද්‍රව්‍ය ඒ අවට ජලාශ වලට මුදාහරිනු ලබයි. එමෙන්ම මෙම රසායනික ද්‍රව්‍ය හා ඛනිජ වර්ග එකතු වීමෙන් මෙම ප්‍රදේශවල භූගත ජලය ද අපවිත්‍ර වේ. මෙම ප්‍රදේශවල, ජිවත්වන ජනයාගේ ශරීර සෞඛ්‍යට ද මෙය අහිතකර වේ.

### *4.3 රැකියා සහ අධ්‍යාපන කටයුතු සඳහා විදෙස්ගත වීමේ සංඛ්‍යාව වැඩි වීම.*

සංවර්ධනය වෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වශයෙන් සිදුවන ජන සංක්‍රමණ ප්‍රමාණය අති විශාලය. විශේෂයෙන්ම සංවර්ධිත රටවල් කරා ඇදී යන්නේ සංවර්ධනය වෙමින් පවතින රටවල වෘත්තිය දක්ෂතා ඇති පුද්ගලයින් වේ. මේ තුළින් සංවර්ධිත රටවල නිෂ්පාදනය ඉහළ යාමක් සිදුවුවත්, සංවර්ධනය වෙමින් පවතින රටවලට වෘත්තිමය දක්ෂතාවයන් ඇති පුද්ගලයින් අහිමිවීමෙන් ශ්‍රම බලකායේ සංකෝචනයක් සිදු වේ. එය සංවර්ධනයවෙමින් පවතින රටකට එනම් ශ්‍රී ලංකාව වැනි රටකට නිෂ්පාදනය හා ආර්ථික වර්ධනයේ පසුබෑමකට හේතුවිය හැක. 2012 ජන හා නිවාස සංගණනයට අනුව තාවකාලීකව මාස හයට වඩා වැඩි කාලයක් විදේශගතව ජීවත්වන මුළු ජනගහණය 604,540ක් ලෙස වාර්තා වේ. මෙම සංඛ්‍යාවෙන් 59%ක් පුරුෂයන් වේ. විදෙස්ගත ජන සංඛ්‍යාවෙන් 47% අධ්‍යාපනය සඳහා ඇමරිකන් එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව යන රටවලට ගොස් ඇති බව වාර්තා වේ. ජත්‍යන්තර සංක්‍රමණ ශ්‍රී ලංකාව වැනි රටකට මුහුණ පාන්නට සිදුවන තවත් ගැටළුවකි.

බුද්ධි ගලනය නිසා මෙරටින් සංක්‍රමණය වන පිරිස අතර, උගත් මෙන්ම බුද්ධිමත් වෘත්තිය දක්ෂතා ඇති පිරිස ද විශාල ය. මොවුන්ගේ වෘත්තිය දක්ෂතා ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා අප රටේ රජය විශාල වියදමක් දරා තිබේ. නමුත් මෙම බුද්ධිය පිටතට ගලා යාම නිසා ඔවුන් වෙනුවෙන් මෙරට රජය විසින් දැරූ වියදමවත් පියවා ගැනිමට අවස්ථාව නොලැබී යයි. තවද මෙම බුද්ධි ගලනයට හේතුවක් ලෙස උගත් දැනුමට සරිලන පරිදි රැකියා නොමැති වීම ආදී හේතූන් ද ගෙනහැර දැක්විය හැකිය. එමෙන්ම බුද්ධි ගලනයේ දී සංක්‍රමණයට සහභාගී වන්නේ තනි පුද්ගලයන්ට වඩා පවුල් ඒකක වේ. එමනිසා ඔවුනට ප්‍රේෂණ මුදල් තම රටට බැර කිරිමේ අවශ්‍යතාවයක් ඇති නොවේ.

තම දූ පුතුන්ට උසස් අධ්‍යාපනයක් ලබාදීමටත්, අනාගත ප්‍රයෝජනය සඳහා ඔවුන් තමන් උපයන මුදල් එම රටේම රඳවා තබා ගනී. එය ද අප රටට අවාසියකි. එසේම ජාත්‍යන්තර සංක්‍රමණ නිසා ඇතිවන තවත් ගැටළුවක් ලෙස සමාජයීය ගැටළු වර්ධනය වීම දැක්විය හැකි ය. මෙවැනි ජන සංක්‍රමණ නිසා දෙමාපියන් හා දරුවන් තාවකාලිකව හෝ වෙන්වේ. එය පවුල් පද්ධතිය දුර්වල කරයි. ඒ තුළින් අඹුසැමි ප්‍රශ්න හා දරුවන් සම්බන්ධ ප්‍රශ්න ද ඇති වේ. එමෙන් ම දෙමාපියන් විදේශ රටවලට සංක්‍රමණය වී රැකියා කිරීම තුළින් එම පවුල්වල, ආදායම් මට්ටම ඉහළ යයි. ඒ නිසා එම පවුල් ඉහළ මට්ටමේ වියදම්වලට හුරු වේ. නමුත් යම් ලෙසකින් මෙම විදේශ රැකියා අහිමි වුවහොත් ආදායම මට්ටම පහළ වැටී දැඩි අපහසුතාවන්ට මුහුණ පෑමට සිදුවේ. මෙලෙස ජාත්‍යන්තර සංක්‍රමණ සිදුවීම තුළින් ඇති කරන සමාජීය ගැටළු ද හඳුනාගත හැකි ය.

### *4.4 ළමා ජන සංඛ්‍යාව අඩු වීම.*

ළමා ජන සංඛ්‍යාව ලෙස සැලකෙන්නේ වයස අවුරුදු 14ට වඩා අඩු ජන සංඛ්‍යාවයි. එය 2012 දී 25.2% ලෙස වාර්තා වේ. බාල වයසේ ජන සංඛ්‍යාව කිසියම් රටක ප්‍රජා විද්‍යාත්මක ලක්ෂණ අතර වැදගත් ලක්ෂණයක් ලෙස සැලකිය

හැකි වන අතර එහි ප්‍රතිශතය අඩු වීම යනු එම රටෙහි ජන සංඛ්‍යාවේ සීඝ්‍ර අඩු වීමක් හා ශ්‍රම බලකායේ අඩු වීමක් අනාගතයේදී ඇතිවිය හැකි බවට හොඳ සාක්ෂියකි. එමෙන් ම ලෝකයේ විවිධ රටවල් ආශ්‍රයෙන් ගින්ස්බර්ග් කළ අධ්‍යයනයට අනුව පෙනී ගොස් ඇති කරුණක් වන්නේ බාල වයස් ජන සංඛ්‍යාව ලෝකයේ ධනවත්කම හා ප්‍රතිලෝම සම්බන්ධතාවයන් ප්‍රකට කරන බවයි (ද සිල්වා, 2008). ළමා ජන සංඛ්‍යාව අඩු වීම සඳහා බලපාන සාධකයක් ලෙස විවාහ වීමේ වයස වැඩිවීම හා පවුල් සැලසුම් ක්‍රමවල භාවිතය ද දැක්විය හැක. එසේම මෙහිදී ස්වභාවික වර්ධන වේගය සෘණ අගයක් ද ගැනීමට ඉඩකඩ පවතී. එසේම අනාගතයේදි රටේ ශ්‍රම හිඟයක් ඇති වී වෙනත් රටවලින් ශ්‍රමිකයන් ගෙන්වා ගැනිමට සිදුවනු ඇත. අනාගතයේදී දේශීය තරුණ පිරිස අඩු වීමත් සංක්‍රමණ අධික විමත් නිසා රටේ ආරක්ෂාවට තර්ජනයක් ඇති වීමට ද ඉඩකඩ ඇත.

වගු අංක 1: ළමා හා වැඩිහිටි ජනගහනය 1971-2051

| වර්ෂය | මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස | |
|---|---|---|
| | ළමා ජනගහනය | වයස්ගත ජනගහනය |
| 1971 | 71.8 | 11.5 |
| 1981 | 60.5 | 11.3 |
| 1991 | 51.4 | 13.3 |
| 2001 | 38.9 | 15.4 |
| 2011 | 35.6 | 20.4 |
| 2021 | 30.4 | 26.2 |
| 2031 | 25.5 | 32.8 |
| 2041 | 25.3 | 41.4 |
| 2051 | 26.5 | 51.2 |

මූලාශ්‍රයඃ ද සිල්වා (2008)


වැඩකරන වයසේ ජනගහනය වර්ධනය වන අතරතුර ළමා ජනගහනය අඩු විම සහ වයස්ගත ජනගහනයේ ප්‍රමාණය කළමනාකරණය කළ හැකි මට්ටමක පවතින විට ආර්ථික සංවර්ධනයට හිතකර ප්‍රජා විද්‍යා පාරිතෝෂිකය යනු වැඩ කරන වයසේ ජනගහනයට සාපේක්ෂව ළමා ජනගහනයේ අඩු වර්ධනයක් ඇති අවස්ථාවේදී ලබා ගත හැකි සීඝ්‍ර ආර්ථික වර්ධනයයි. වගු අංක 01 ට අනුව 1971 දී ළමා ජනගහනය 71.8 වන අතර එය ක්‍රමයෙන් අඩු වී ඇත. 1981, 1991, 2001 යන වර්ෂ වලදී එය පිළිවෙලින් 60.5, 51.4, 38.9 ලෙස හඳුනාගත හැකි ය. 2021 වන විට ද එම අගය 30.4 දක්වා ද 2051 වන විට 26.5 දක්වා ද ළමා ජනගහනය අඩු වනු ඇතැයි ප්‍රක්ෂේපණය කෙරේ. එමෙන් ම ළමා ජනගහනයට සාපේක්ෂව වයස්ගත ජනගහනය ක්‍රමයෙන් වැඩිවන බවක් මෙහිදී හඳුනාගත හැක. 1981 වසරේ 11.3 වූ වයස්ගත ජනගහනය 1991, 2001, 2011 යන වර්ෂවල දී පිළිවෙලින් 13.3, 15.4, 20.4

දක්වා වැඩි වී ඇත. එමෙන් ම 2021 වන විට 26.2 දක්වාද 2051 වන විට 51.2 දක්වා ද වැඩි වනු ඇතැයි ප්‍රක්ෂේපණය කෙරේ. මෙහිදී 2051 වන විට මුළු ජනගහනයෙන් හරි අඩකට වඩා වයස්ගත ජනගහනය නැතිනම් මහලු යැපෙන්නන් සිටිනු ඇතැයි ප්‍රක්ෂේපණය කෙරේ. මෙම තත්ත්වය රටේ ඉදිරි සංවර්ධනයට එක එල්ලේ බලපෑම් එල්ල කරනු ඇත.

### *4.5 ජන සංඛ්‍යාව වයස්ගත වීමේ ප්‍රවණතාවක් දක්නට ලැබීම*

ජනගහනය වියපත් වීමේ ප්‍රජා විද්‍යාත්මක ක්‍රියාවලිය සාඵල්‍යතාව අඩු වීමට සමගාමීව සිදු වූවකි. සාඵල්‍යතාවයේ සහ මර්ත්‍යතාවයේ සීඝ්‍ර පහළ බැසීම, ඍණ ජාත්‍යන්තර ශුද්ධ සංක්‍රමණය හා ඉහළ ආයු අපේක්ෂාවක් පැවැතිම ජනගහනය වයස්ගත වීමට හේතු වේ. ශ්‍රී ලංකාවේ අවුරුදු 60 වැඩි වැඩිහිටි ජනගහනය 2012 වන විට මිලියන 2.5 කි. මෙය මුළු ජනගහනයෙන් 1/8 කි. 2012 සංගණනයේ සංඛ්‍යාලේඛනවලට අනුව දළ මරණ අනුපාතිකය 5.7 ක් දක්වා පහළ බැස ඇති ආකාරය හඳුනාගත හැකි ය. මේ සඳහා ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය හා පෝෂණ මට්ටම වර්ධනය වීම බලපාන්නට ඇත. මරණ අනුපාතය පහළ මට්ටමක පවතින හෙයින් වයස්ගත වූවන් සඳහා ආර්ථිකයේ වැඩි ප්‍රමාණයක් වෙන් කිරීමට සිදුවීම නිසා ආර්ථිකය අවදානම් මට්ටමක පවතී. මෙහිදී මහලු යැපුම් අනුපාතිකය 12.4 දක්වා ඉහළ ගොස් ඇති බව හඳුනා ගත හැක. මෙම තත්ත්වය සංවර්ධනය වෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාවට අහිතකර තත්වයක් බවට පත් වන්නේ සංවර්ධන කටයුතු සඳහා යෙදවීමට ඇති මුදලින් විශාල ප්‍රමාණයක් වයස්ගත වූවන්ගේ සුභසාධන කටයුතු සඳහා යෙදවීමට සිදු වීම හේතුවෙනි. මෙය 2041 වන විට මිලියන 5.4 ක් දක්වා වැඩි වේ යැයි අපේක්ෂිත ය. එසේ වුවහොත් මුළු ජනගහනයෙන් ප්‍රතිශතයක් ලෙස ගත්විට සියයට 24.8 කි. එනම් 2041 වන විට මිනිසුන් හතර දෙනෙකුට එක් අයෙක් වියපත් මිනිසෙකු බවට පත්වේ (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012).

ප්‍රස්තාරය 02: ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහනය 1946 - 2012




*මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2012)*

#### *4.6 මුළු ජනගහනයෙන් ස්ත්‍රී ප්‍රතිශතය ඉහළ යාම*

සංගණන ඉතිහාසයේ පළමු සංගණනය වන 1871 සිට 1981 දක්වා පවත්වන ලද සෑම සංගණනයකදී ම මුළු ජනගහණයෙන් පුරුෂ ප්‍රතිශතය ස්ත්‍රී ප්‍රතිශතය අභිබවා වාර්තා වී ඇත. 1946 දි 46.9% වූ ස්ත්‍රී ජනගහනය 1981 වන විට 49% ලෙස ද 2012 සංගණනයට අනුව එය 51.6% ලෙස ද වර්ධනය වී ඇත. මීට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පුරුෂයන් හා සැසඳීමේ දී ස්ත්‍රීන් ඉහළ ආයු අපේක්ෂාවක් භුක්ති විඳීම, මාතෘ මර්ත්‍යතාවේ සීඝ්‍ර පහළ බැසීම ආදී සාධකයන් ය. ස්ත්‍රීන්ගේ ජීවිත අපේක්ෂාව පුරුෂයන්ට වඩා වැඩි බැවින් වැඩිහිටි ජනගහනයේ වැඩිකොටසක නියෝජනයක් ස්ත්‍රී පක්ෂයට හිමි වී ඇත. එසේ ම 2015 දි ස්ත්‍රීන් 100 දෙනෙකුට සිටින පිරිමි සංඛ්‍යාව 93 ක් වේ.

#### *4.7 විවාහ වීමේ වයස ඉහළ යාම.*

විවාහක තත්ත්වය යනු ජනගහනය වෙනස් වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපාන සාධකයක් ලෙස ද සැලකිය හැක. රටක සාඵල්‍යතාව කෙරෙහි ඍජු ලෙස ද මර්ත්‍යතාවය සහ සංක්‍රමණ කෙරෙහි ද විවාහක තත්ත්වය බලපායි. ඒ හැරුණු විට අධ්‍යාපන තත්වය, ශ්‍රම බලකා සහභාගීත්වය වැනි සමාජ සහ ආර්ථික ලක්ෂණයන් කෙරෙහි ද පුද්ගලයෙකුගේ විවාහක තත්වය බලපානු ලබයි. වයස අවුරුදු 20-24 අතර කාණ්ඩයේ පමණක් 1971 සිට 2012 දක්වා විවාහක ප්‍රතිශතය ඉතා සුළු වශයෙන් වුවද ක්‍රම ක්‍රමයෙන් අඩු වෙමින් පවති. මූලික අධ්‍යාපනයට අමතරව කාන්තාවන් විශාල වශයෙන් පූර්ණ කාලීන උසස් අධ්‍යාපන කටයුතුවල යෙදීමේ වැඩිවීමක් මෑත කාලයේ දක්නට ලැබීම මේ සඳහා හේතු වී ඇතැයි උපකල්පනය කළ හැක.

2012 සංඛ්‍යා දත්තවලට අනුව කාන්තාවන්ගේ විවාහ වන වයස 23.4 ලෙස වාර්තා වේ. එසේම 2012 වර්ෂයේ දී විවාහවන පූරුෂයකුට වඩා ස්ත්‍රීන් වසර 4කින් පමණ ලාබාල වේ. විවාහ වන අවස්ථාවේ දී පුරුෂයා සහ ස්ත්‍රිය අතර අඩු වෙමින් පවතින මෙම වයස් පරතරය සඳහා මූලිකවම බලපා ඇත්තේ ස්ත්‍රියගේ විවාහ වන වයස ඉහළ යාම බව පැහැදිලිය.

#### *4..8 ප්‍රධාන නගරවලින් බැහැරව අවට ප්‍රදේශවල ජන සංකේන්ද්‍රණ බිහි වීම.*

විශේෂයෙන්ම මෙය ද වර්තමානයේ දැකිය හැකි ප්‍රවණතාවක් ලෙස හඳුනාගත හැක. ප්‍රධාන නගරයෙන් බැහැරව ඒ අවට ප්‍රදේශවල ජනයා සංකේන්ද්‍රණය වනුයේ නගර ආශ්‍රිතව පවතින දැඩි කලබලකාරී බවින් මිදීමේ අපේක්ෂාවෙනි. එමෙන් ම මෙම ප්‍රදේශවල ජනයා අපේක්ෂා කරන සේවා සහ අනෙකුත් පහසුකම් භුක්ති විඳීමේ අපේක්ෂාවෙන් මොවුන් මේ ප්‍රදේශවල ජන සංකේන්ද්‍රණ ඇති කර ගැනිමට පෙළඹීමේ ප්‍රවණතාවක්ද දක්නට ඇත. මෙලෙස ශ්‍රී ලංකාවේ ජනගහනයේ මෑත කාලීන උපනතීන් හඳුනාගත හැකිය.

### 5. සමාලෝචනය

ශ්‍රී ලංකාවේ ජනගහනය මෑත කාලීන උපනතීන් පිළිබඳව අධ්‍යයනයේ දී ජන සංඛ්‍යා වර්ධන වේගය ක්‍රමයෙන් පහළ බැසීම, ළමා ජන සංඛ්‍යාව අඩු වීම, වයස්ගත ජනගහනය වැඩි වීම, ස්ත්‍රී ප්‍රතිශතය ඉහල යාම, සංක්‍රමණ ආදී උපනතීන් හඳුනාගත හැකිය. එසේම ඉහළ ජීවන තත්වයක් සහ නිසි අධ්‍යාපනයක් ලබා උසස් රැකියාවක නියැලීමේ අරමුණු ඇතිව විදෙස් ගතවන පිරිසක් ද වර්තමානය වන විට ඉහළ අගයක් ගන්න බව හඳුනාගත හැකිය. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ ජනගහනයේ ලක්ෂණ අනුව ඒ තුළ තවදුරටත් විවිධ උපනතීන් සිදුවිය හැකි බව කිව හැකිය.

### ආශ්‍රිත ග්‍රන්ථ


අබේකෝන් ඒ. ටී. පී. එල්. (2008). *ශ්‍රී ලංකාවේ ජනගහනය වියපත්වීම සම්බන්ධයෙන් මතු වෙමින් පවතින ගැටළු වල ආර්ථික විමසුම.* ශ්‍රී ලංකා මහජන බැංකුව, ශ්‍රී ලංකාව

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව. (2012). *2012 ජන හා නිවාස සංගණනයේ ප්‍රධාන තොරතුරු,* ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව. කොළඹ

ජයකොඩි, කේ. එස්. (2008). *ශ්‍රී ලංකාව තිරසර සංවර්ධනය, අභියෝග සහ ප්‍රතිචාර,* කතෘ ප්‍රකාශන, ශ්‍රී ලංකාව

ද සිල්වා, ඩබ්ලිව්. අයි. (2008). *ශ්‍රී ලංකාවේ වියපත් වන ජනගහනය සහ සමාජ ආරක්ෂණය,* ආර්ථික විමසුම, ශ්‍රී ලංකා මහජන බැංකුව.

දිසානායක, ඒ. (1998). ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ වර්ධනය, *ආර්ථික විමර්ශනය,* 135-154

ප්‍රියදර්ශන, ටී. ආර්. (2012). ජනගහන වියපත්වීමේ ආර්ථික හා සමාජීයිය ප්‍රතිවිපාක, *සටහන,* මහජන බැංකුව, කොළඹ

Malthus, T. (1798). *An Essay on the principles of population.* London: J. Johnson in St.Paul's Church-Yards.

# ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිය හා මෑත කාලීනව සිදුව පවතින වෙනස්කම්

ආර්. පී. එස්. එස් දිසනායක[1]

***සංක්ෂේපය***

*ඕනෑම රටක ආර්ථික වර්ධනය රඳා පවතින්නේ එම රටේ ශ්‍රම බලකාය මතය. රටක ශ්‍රම බලකාය පූර්ණ උපයෝජනයක් නොමැති විට ආර්ථික වර්ධනය හීන වන අතරම සේවා වියුක්තියක් නිර්මාණය වේ. ඒ අනුව මෙම පරීක්ෂණයේ ගැටළුව බවට පත් කර ගන්නා ලද්දේ ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිය යන්න, 2011-2018 අතර කාලය තුළ වෙනස්ව පවතිනේ කෙසේද යන්න අධ්‍යනය කිරීමයි. එම ගැටළුව මත පදනම්ව 2011-2018 අතර කාලය තුළ සේවා වියුක්තිය වෙනස්ව පවතින ආකාරය හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණ වශයෙන් යොදා ගන්නා ලදී. මෙහිදී පරීක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය දත්ත රැස් කර ගන්නා ලද්දේ ද්විතික දත්ත මූලාශ්‍ර මතය. එමෙන්ම දත්ත විශ්ලේෂණ කාර්යය සඳහා යොදා ගනු ලැබුවේ SPSS හා MS-EXCEL යන මෘදුකාංගයන් වන අතර එවා මත පදනම්ව වගු සටහන්, ප්‍රස්තාර සටහන්, මූලික සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රම ශිල්ප හා පරාමිතික පරික්ෂා මත පදනම්ව දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී. මෙම විශ්ලේෂණය කරන ලද දත්ත මත පදනම්ව නිගමන හා සොයා ගැනීම කිහිපයකට එළඹීමට හැකි විය. එනම් ශ්‍රී ලංකා ආර්ථිකය තුල 2011-2018 අතර කාලය තුළ ස්ත්‍රී හා පුරුෂ වශයෙන් ගත්විට සේවා වියුක්තියේ දැවන්ත වෙනසක් පවතින බව නිගමනය කළ හැකි විය. එමෙන්ම 2011-2018 අතර කාලය තුළ වයස් මට්ටම් අනුව ගත් කල ද ශ්‍රී ලංකාවේ සේවා වියුක්තියේ වෙනසක් පවතින බව නිගමනය කල හැකි වූ අතරම ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති අනුපාතිකයන් ගත් කල මෑත කාලීනව සුළු උච්ඡාවචනයන් පමණක් සිදුව පවතින බව හඳුනා ගැනීමට හැකි විය. එමෙන්ම අධ්‍යාපන මට්ටම් අනුව ගත් කළ ද 2011-2018 අතර කාලය අතරතුර සේවා වියුක්තියේ වෙනස්කම් පවතින බවද නිගමනය කළ හැකි විය. මෙම අධ්‍යනය තුළින් විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිය සඳහා සාධක ගණනාවක් බලපාන බව හඳුනා ගන්නා ලද අතර ඒ සඳහා ප්‍රධාන වශයෙන් යොදා ගනු ලැබුවේ ද්විතීයික මූලාශ්‍ර වන මෑත කාලීන ලිපි, පුවත්පත් වර්තා, ආර්ථික විද්‍යාව හා සම්බන්ධ මෑත කාලින ග්‍රන්ථ ආදිය උපයොගි කරගෙනය. ඒවාට යොදා ගත හැකි විසඳුම් ගණනාවක් පවතින බවද අදාල මූලාශ්‍ර හා සාහිත්‍යය විමර්ශන මත සොයා ගැනීමට හැකි විය.*

***මුඛ්‍ය පද : අධ්‍යාපන මට්ටම, වයස් මට්ටම, සේවා වියුක්තිය, ශ්‍රී ලංකාව***

---

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
shanakasandaruwan40@gmail.com

## 1.හැඳින්වීම

සේවා වියුක්තිය රටක පවතින ප්‍රධාන ආර්ථික හා සමාජීය ගැටලුවකි. ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂාවෙන් කිසියම් ආර්ථික කටයුත්තකට ශ්‍රමය සැපයීමට කැමති එහෙත් ඒ සඳහා අවස්ථාවක් නොලැබ ඇති පුද්ගලයන් විරැකියාවෙන් පෙළෙන පුද්ගලයන් ලෙස හඳුනා ගනී. සේවා වියුක්තිය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද යන්න විවිධ මත ඉදිරිපත් වී ඇත. ඊට ප්‍රථම සේවා නියුක්තිය පිළිබඳ දළ අවබෝධයක් ලබා තිබිය යුතුය. ඒ අනුව, සේවා නියුක්තිකයන් යනුවෙන් අදහස් කරන්නේ, සේවය කරනු ලබන පැය ගණන : රැකියා නියුක්තිකයෙකු වීම සඳහා අඩු තරමින් යොමු සතිය තුළ පැය 20ක් වත් කිසියම් ආර්ථික ක්‍රියාවලියකට සම්බන්ධ වී සිටිය යුතුය. වැඩ කරන වයසේ ජනගහනය : වයස අවු: 15 ත් 65 ත් අතර ශ්‍රම බලකාය. පවුලේ ආර්ථිකයට උදව් කරන්නා : පවුලේ ආර්ථිකයට උදව් කරන්නන් රැකියා නියුක්තිකයන් ලෙස නොසැලකිය යුතුය. වැටුප් නොලබා පවුලේ ආර්ථිකයට උදව් කරන්නෙකු රැකියාවක් අපේක්ෂාවෙන් සිටින්නේ නම් එවැන්නෙකු රැකියා විරහිතව පසුවන්නෙකි. එලෙස නොවන්නේ නම් ආර්ථික වශයෙන් ක්‍රියාශීලි නොවන (ශ්‍රමබලයට අයත් නොවන) අය විය යුතුය. එහෙයින් රැකියා නියුක්තිකයින් ලෙස සැලකෙන්නේ සෙවකයින්, සේවා යෝජකයින් සහ තමාගේම වැඩ කටයුතු කරන්නන් පමණි (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012).

සේවා වියුක්තිය යනුවෙන් ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ නිර්වචනය නම් දැනට රැකියාවක් නොමැතිව, රැකියාවක් සොයමින් සිටින, සමීක්ෂණ සතියට පෙර සති හතරක කාල වකවානුවකදී රැකියාවක් සෙවීමට පියවරක් ගෙන ඇති, එසේම ඉදිරි සති දෙක ඇතුලත ලැබෙන රැකියාවක් භාර ගැනීමේ හැකියාවද ඇති පුද්ගලයින් රැකියා වියුක්තිය යටතට ගැනේ. රැකියා විරහිත පුද්ගලයෝ වශයෙන් ජාත්‍යන්තර කම්කරු සංවිධානය දක්වන්නේ නියමිත කාලය තුලදී (සේවා වියුක්තිය මැන බැලීම සඳහා භාවිත වන කාලය) පුද්ගලයා වැටුප් ලබන හෝ ස්වයං රැකියාවක නොයෙදී සිටිය යුතු බවයි. එසේම රැකියාවක් ලබා ගැනීම සඳහා නිරන්තර උත්සහයක් දරා සිටිය යුතුය (අතපත්තු, 2011).

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වනු ලැබූ පරිභෝජන වියදම් හා සමාජ ආර්ථික සමීක්ෂණවල දී සේවා වියුක්ත පුද්ගලයෙකු වශයෙන් නිර්වචනය කරනු ලැබුවේ, අදාළ කාල පරිච්ඡේදය තුළ වැටුපකට, වේතනයකට, ලාභයකට, පවුලේ ආදායම වැඩි කිරීමට කිසියම් රැකියාවක් සොයමින් සිටින හෝ රැකියාවක් බලාපොරොත්තුවෙන් සිටින, එහෙත් රැකියාවක් නොමැති පුද්ගලයෙකු වශයෙනි. (අතපත්තු, 2011). මේ අනුව සේවා නියුක්ති අවස්ථා නොමැතිවීම සහ ආර්ථිකයේ අඩු අවශෝෂණ ධාරිතාව හේතුවෙන් ශ්‍රම බලකායේ ප්‍රයෝජනයට නොගත් පංගුව සේවා වියුක්තිය ලෙස සලකයි (හේනෙගෙදර, 2007).

### *1.1 සේවා වියුක්තියේ ප්‍රභේද*

සේවා වියුක්තියට හේතු වූ කරුණු පදනම් කරගෙන සේවා වියුක්තිය ප්‍රධාන ප්‍රභේද 4 ක් යටතේ වර්ග කර ඇත. එනම්, සාර්ෂික සේවා වියුක්තිය (frictional unemployment), ව්‍යුහාත්මක සේවා වියුක්තිය (structural unemployment), වාරික සේවා වියුක්තිය (seasonal unemployment) සහ චක්‍රීය සේවා වියුක්තිය (cyclical unemployment) වේ. එදිනෙදා සිදුවන ක්‍රියාවලින් තුළින් ඇතිවන සේවා වියුක්තිය සාර්ෂික සේවා වියුක්තිය ලෙස හැඳින්වේ. ව්‍යාපාරික ආයතන වෙළෙඳපොලින් නික්මයාම නව ආයතන ඇතුල්වීම හා පුද්ගලයින් නව රැකියා සොයා යාම ආදියෙන් මෙම සේවා වියුක්තිය ඇති වේ. ආර්ථිකයේ පවතින සර්ෂණයන් මෙම විරැකියා තත්ත්වයට හේතු වේ. ව්‍යුහාත්මක සේවා වියුක්තිය ඇති වන්නේ ඇතැම් ව්‍යුහාත්මක වෙනස්කම් නිසාය. තාක්ෂණික ක්‍රම ඉතා සීඝ්‍රයෙන් දියුණු වීම නිසා ඇතැම් ශ්‍රම වර්ග නව ක්‍රම ඉදිරියේ දී යල්පැන ගිය ඒවා වීම මීට එක් උදාහරණයකි.

කඩ සාප්පුවල බිල් ලිවීම, මුදල් ගැනීම සඳහා ශ්‍රම ඒකක කිහිපයක් යෙදීම වෙනුවට යාන්ත්‍රික ක්‍රම මගින් එම කටයුතු කිරීමේදී ඇතැම් පිරිස් සේවා වියුක්ත විය හැකිය. ඉතාමත් අයහපත් තත්ත්වයකදී වුවද මෙම සේවා වියුක්තිය ඇති වේ. වාරික සේවා වියුක්තිය යනු වාරික වශයෙන් ඇතිවන අවශ්‍යතා අනුව ඇතැම් කර්මාන්ත ක්‍රියාකරගෙන යාම හා නතර කිරීම නිසා ඇතිවන සේවා වියුකතිය යි. අපරට සිංහල අවුරුදු හා නත්තල සමය අවසානයේ දී රතිඤ්ඤා කර්මාන්තයත්, ගොයම් කැපීමේ කාලය අවසානයේදී ගොයම් කැපීමේ කර්මාන්තයත් ශීත රටවල ශීත සෘතුවෙන් පසු හිම ක්‍රීඩා කර්මාන්තයත් අඩු ධාරිතවයකින් කටයුතු කිරීම මේවාට නිදසුන් ලෙස පෙන්වා දිය හැකිය. ව්‍යාපාර චක්‍රවල පරිහානි සමයේදී දැකිය හැකි සේවා වියුක්තිය චක්‍රීය සේවා වියුක්තිය ලෙස හැඳින් වේ. ආර්ථික පසු බැසීමක් හෙවත් ප්‍රතිගමනයක් හට ගන්නා අවධියේ දී සේවා වියුක්තිය ඉහළ මට්ටමක පවතී.

### *1.2 පර්යේෂණ අරමුණු*

සේවා වියුක්තිය යනු වර්තමානයේ ශ්‍රී ලංකාව මුහුණ දෙන ප්‍රධාන ගැටළුවක් වන අතර එම ප්‍රධාන ගැටළුව 2011 - 2018 කාලය තුළ ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්තව පවතින්නේ කෙසේද යන්න හඳුනාගැනීම සඳහා කරන ලද මෙම පර්යේෂණයේ මූලික අරමුණු කිහිපයකි. එවා නම්, 2011-2018 කාලය තුළ ශ්‍රී ලංකාවේ සේවා වෙනස්කම් කවරේද, එම කාලයේ ශ්‍රී ලංකාව තුළ සේවා වියුක්තිය පැවත ඇත්තේ කෙසේද යන්න විමර්ශනය කිරීම, ශ්‍රී ලංකාවේ සේවා වියුක්තියට බලපාන ප්‍රායෝගික හේතු හඳුනා ගැනීම සහ ශ්‍රී ලංකාවේ සේවා වියුක්තියට ඉදිරිපත් කළ හැකි ප්‍රායෝගික විසඳුම් හඳුනා ගැනීමය.

## 2. සාහිත්‍ය විමර්ශනය

මෙම පර්යේෂණය සිදු කිරීමේදී කරන ලද පසු විපරම මත මේ හා සමගාමී අධ්‍යනයන් හා පොත් පත් කිහිපයක් පිළිබදව අවධානය යොමු කරන ලදී. එම පරික්ෂණ අතර 'Martín Rama' විසින් කරන ලද 'The Sri Lankan Unemployment Problem Revisited' යන පරික්ෂණය පදනම් කරගෙන ශ්‍රී ලංකාවේ සේවා වියුක්තියේ ස්වාභාවය හා සේවා වියුක්තියට බලපාන හේතු හා පෞද්ගලික හා රාජ්‍ය අංශයේ රැකියා අතහැර යාමට බලපාන සාධක පිළිබදව මනා පැහැදිලි කිරීමක් සිදු කර ඇත ( මාර්ටින් රාමා, 1999). අතපත්තු (2011) විසින් රචනා කරන ලද ආර්ථික විද්‍යා ප්‍රවේශය යන ග්‍රන්ථය ද මෙම පර්යේෂණයේ සාහිත්‍ය විමර්ශනය සඳහා දායක කර ගන්නා ලදී. එයට හේතුව මෙම පර්යේෂණය යටතේ මුලික වශයෙන් ආර්ථික විද්‍යාත්මක සංකල්ප කිහිපයක් ගැන කතා කරන නිසාය. එම සංකල්ප පිළිබඳව නිවැරදි න්‍යාත්මක කරුණු කරනා උකහා ගැනීමට මෙම ග්‍රන්ථය මනා උපකාරයක් විය (හේනෙගෙදර, 2007).

ශ්‍රී ලංකාවේ ශ්‍රමය සහ සේවා නියුක්තිය පිළිබඳ සමාලෝචනය යන කෘතිය තුලින්ද සේවා වියුක්තියට ප්‍රතිවිරුද්ධ අදහස දෙන ශ්‍රී ලංකාවේ සේවා නියුක්තිය කෙසේ ව්‍යාප්තව පවතිද යන්න පිළිබඳව මනා අවබෝධයක් ලබා ගත හැකි විය. සේවා වියුක්තිය ගත් කල එය හුදෙක් ශ්‍රී ලංකාවට පමණක් බලපාන්නා වූ මූලික ආර්ථික අර්බුදයක් නොවන බව හඳුනාගත හැකිය. ලෝකයේ බොහෝ රටවල් මෙම අර්බුදයෙන් ගැලවීම සඳහා සටන් කරමින් සිටී. නමුත් ලෝකයේ ඇතැම් රටවල් මෙම තත්ත්වය ජය ගෙන ඇති අතර ඔවුන් අද වන විට ලෝක බලවතුන් බවට පත්වී ඇති බව නොරහසකි (හේනෙගෙදර, 2007). සමස්තයක් ලෙස අඩුම සේවා වියුක්තියක් වර්ථා කරණු ලබන්නේ කොලොම්බියා රාජ්‍යයි. එහි අගය 0.1% ක් ලෙස දැක්වෙයි. එමෙන්ම වැඩිම සේවා වියුක්ති අනුපාතයක් වර්තා වන්නේ සිම්බාබ්වේ රජ්‍යයෙනි. එම අගය 95.0% ලෙස දැක්වෙයි. මෙම සටහනේ අඩුම සේවා වියුක්තියක් ඇති රටවල් 10 යතු තුළ සිංගප්පූරුව හා කුවේට් රාජ්‍යන් සිටී.

## 3. පර්යේෂණ ක්‍රමවේදය

ශ්‍රී ලංකාවේ සේවා වියුක්තියේ මෑත කාලීන ප්‍රවණතා එසේත් නැත්නම් වෙනස්කම් පිළිබදව කරන ලද මෙම අධ්‍යයනය මුලික වශයෙන් දත්ත රැස්කිරීම, දත්ත විශ්ලේෂණය කිරීම හා නිගමනවලට එලඹීම යන ක්‍රමවේදය ඔස්සේ සිදු කළ අතර එහිදී මෙම පර්යේෂණය සඳහා අදාල දත්ත ද්විතික මුලාශ්‍ර වන, ආර්ථික විද්‍යා ප්‍රවේශය (අතපත්තු, 2011), සේවා වියුක්තිය, ආර්ථික විමසුම (අතපත්තු, 2012) , ශ්‍රී ලංකාවේ ශ්‍රමය සහ සේවා නියුක්තියපිළිබඳ සමාලෝචනයක් (හේනෙගෙදර, 2007) යන ග්‍රන්ථ මෙන්ම ශ්‍රම බලකා සමික්ෂණ වර්තා දත්ත (2011 සිට 2018 දක්වා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව) යනාදී මූලාශ්‍ර මත පදනම්ව සපයා ගත් අතර එම වර්තා හා පොත පතට අනුව ලබා ගන්නා ලද දත්ත SPSS, MINITAB, MSEXCEL යන මෘදුකාංග මත පදනම්ව වගු සටහන්, ප්‍රස්තාර සටහන්, මුලික සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රම ශිල්ප මත පදනම්ව විශ්ලේෂණයට බඳුන් කරන ලදී.

### *4.1 ස්ත්‍රී පුරුෂ භාවය මත ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිය*

සේවා වියුක්තිය යන්න ගත් කළ එය හුදෙක් ශ්‍රී ලංකාවට පමණක් නොව මුලු මහත් ලෝකයටම බලපානු ලබන ප්‍රශ්නයක් බව පැහැදිලිය. ශ්‍රී ලංකාව ගත් කල ශ්‍රී ලංකාව තුළ 2011 - 2018 කාලය තුළ මෙම සේවා වියුක්තියේ ව්‍යාප්තියේ සුළු උච්චාවචනයන් පවති. ශ්‍රී ලංකාවේ 2018 වර්ෂයේ තුන්වන කාර්තුව වන විට සේවා වියුක්තිය 4.1% වන බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සෑම වසරකම කාර්තු තුන සඳහා ශ්‍රම බලකා සමීක්ෂණයන් හරහා සේවා නියුක්ති හා සේවා වියුක්ති අනුපාතයන් ගණනය කර දක්වන වාර්තාවේ දැක්වෙයි.

මෙලෙස ශ්‍රී ලංකාවේ අද වන විට පවතින සේවා වියුක්තිය ගත් කළ ස්ත්‍රී පුරුෂ භාවය මත වෙනසක් පවතීද යන්න ඉහත වාර්තාවේ සටහන් දත්ත මත පදනම්ව මධ්‍යනය පිළිබද පරාමිතික පරික්ෂාවක් වන One-way Anova විශ්ලේෂණය මත පහත පරිදි විශ්ලේෂණය කරන ලදී.

වගු අංක 01: One-way ANOVA

| ANOVA | | | | | |
|---|---|---|---|---|---|
| | Sum of Squares | Df | Mean Square | F | Sig. |
| Between Groups | 43.396 | 1 | 43.396 | 423.651 | .000 |
| Within Groups | 1.024 | 10 | .102 | | |
| Total | 44.420 | 11 | | | |


මෙම පරික්ෂාව සඳහා 2011 සිට 2018 වර්ෂය තෙක් දත්ත යොදා ගත් අතර මේ සදහා කල්පිත දෙකක් යොදා ගන්නා ලදී. එනම්,

$H_0$: ස්ත්‍රී පුරුෂ භාවය මත ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති අනුපාත අතර වෙනසක් නැත. $\mu1 = \mu2$

$H_1$: ස්ත්‍රී පුරුෂ භාවය මත ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති අනුපාත අතර වෙනසක් ඇත. $\mu1 \neq \mu2$

ඉහත පරික්ෂාව සලකා බලන විට එහි Significant Value = 0.000 වීම මත මෙහි $H_0$ කල්පිතය 95% විශ්වාසයකින් යුතුව බැහැර වන අතර එමගින් ස්ත්‍රී පුරුෂ භාවය මත ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති අනුපාතයන්හී වෙනසක් පවතින බව මනාව පැහැදිලි වේ. මෙය තවදුරටත් පැහැදිලි කිරීමට පහත ප්‍රස්තාර සටහන යොදා ගත හැකිය.

ප්‍රස්තාර අංක 01: ශ්‍රි ලංකාවේ ස්ත්‍රී පුරුෂ සේවා වියුක්ති අනුපාතය




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2018)*

මේ අනුව ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිය ගත් කල ස්ත්‍රී පුරුෂ භාවය මත සැබෑ වෙනසක් පවතින බවත් පුරුෂ සේවා වියුක්තියට වඩා ස්ත්‍රී සේවා වියුක්තිය වැඩි බවත් පැහැදිලි කරුණක් වේ.

***4.2 අධ්‍යාපන තත්වය හා වයස් ව්‍යූහය මත ශ්‍රී ලංකාවේ සේවා වියුතික්තිය***

ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිය වයස් ව්‍යූහය මත කෙසේ ව්‍යාප්තව පවතිද යන්න අධ්‍යයනය කිරීම සිදු කරන ලදී. එහිදී ද කල්පිත පරික්ෂාවක් මත මෙම තත්වය පරික්ෂාවට භාජනය කරන ලදී. එහිදී යොදා ගන්නා ලද්දේ Independent sample T test පරික්ෂාවකි.

මෙහිදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව කොටස් දෙකකට බෙදා දක්වා ඇත. එනම්, වයස අවු 20-24 සහ වයස අවු 25-29 වේ. මෙහිදීද කල්පිත දෙකක් යොදා ගැණිනි. එනම්,

$H_0$:වයස් කාණ්ඩ මත ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති අනුපාත අතර වෙනසක් නැත. $\mu1 = \mu2$

$H_1$:වයස් කාණ්ඩ මත ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති අනුපාත අතර වෙනසක් ඇත. $\mu1 \neq \mu2$


මෙම පරික්ෂාවට අදාළ ප්‍රතිඵල පහත පරිදි විය.

වගු අංක 02: Independent sample T test

| Independent sample T test | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | F | Sig. | t | Df | Sig. (2-tailed) |
| percentage | Equal variances assumed | .283 | .606 | 19.390 | 10 | .000 |
| | Equal variances not assumed | | | 19.390 | 9.758 | .000 |

මෙම පරික්ෂාවට අනුව මෙහි Significant Value = 0.000 වන නිසාත් එය 0.05 ක් වන නිසාත් මෙහි $H_0$ කල්පිතය බැහැර වී වයස් කාණ්ඩ අනුව සේවා වියුක්ති අනුපාත අතර වෙනසක් පවතින බව ඔප්පු වේ. මෙය තවදුරටත් පහත ප්‍රස්තාර සටහනින් පැහැදිලි කළ හැකිය.


ප්‍රස්තාර අංක 02: වයස් කාණ්ඩ මත සේවා වියුක්ති අනුපාතයෙහි වෙනස




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2012 - 2018)*

අධ්‍යාපන මට්ටම සලකා බැලිමේදී අ.පො.ස උසස් පෙළ හා ඊට වඩා ඉහල සුදුසුකම් තිබෙන පිරිස සලකා බැලීමට අපේක්ෂා කෙරේ. එයට හේතුව ශ්‍රම බලකායට සෘජුවම එම පිරිස සලකා බලන නිසාය.

ප්‍රස්තාර අංක 03: අධ්‍යාපන මට්ටම මත සේවා වියුක්ති අනුපාතයෙහි වෙනස




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2012-2018)*

මෙම ප්‍රස්තාර සටහන අධ්‍යයනය තුළින් පැහැදිලි වන්නේ අ.පො.ස උසස් පෙළ හා ඊට වඩා ඉහළ සුදුසුකම් තිබෙන පිරිස අතරින්ද වැඩි සේවා වියුක්තියක් පවතින්නේ ස්ත්‍රී කාණ්ඩයේ බවය. එමෙන් ම සලකා බලන කාල සීමාව තුළදී වැඩිම ස්ත්‍රී සේවා වියුක්තිය වාර්තා වී ඇත්තේ 2016 වසරේ ය. එම අගය 13.5 කි.

**5. සමාලෝචනය**

අද වන විට සමාජගතව පවතින ප්‍රධාන ආර්ථික ගැටළුවක් හා සංවර්ධන අභියෝගයක් වන ශ්‍රී ලංකාවේ විරැකියාව පිළිබඳව කරන ලද මෙම අධ්‍යයනය තුළින් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනු ලැබුවේ මෑත කාලීන විරැකියාව පිළිබඳවය. එහිදී ලෝකයේ මෙම විරැකියා අර්බුදය කෙසේ ව්‍යාප්ත වී පවතීද විරැකියාව වැඩිම හා අඩුම රටවල් මොනවාද යන්නත්, ශ්‍රී ලංකාවේ 2014-2018 කාලයේ විරැකියා අනුපාතයන් අධ්‍යාපන මට්ටම් අනුව, ස්ත්‍රී පුරුෂ භාවය මත එමෙන්ම වයස් ව්‍යුහය මත කෙසේ වෙනස් වී පවතිද යන්න පිළිබඳව මේ තුළින් සොයා බලන ලදී. එහිදී හඳුනා ගැනීමට හැකි වූ එනම් නිගමනය කිරීමට හැකි වූ කරුණු කිහිපයක් මෙසේ දැක්විය හැකිය. ලෝකය සමස්තයක් ලෙස ගත් විට ලෝකයේ අඩුම විරැකියා අනුපාතයක් පෙන්වන්නේ කොලොම්බියා රාජ්‍යය වන අතර එම අගය 0.1% වේ. එමෙන්ම වැඩිම විරැකියා අනුපාතයක් සහිත රට වන්නේ සිම්බාබ්වේ දේශයේ ය. එම අගය 95% වේ. මිළගට ශ්‍රී ලංකාව පිළිබඳව අවධානය යොමු කරන විට ස්ත්‍රී පුරුෂ භාවය මත ගත් කළ ශ්‍රී ලංකාවේ ස්ත්‍රීන් හට දැවැන්ත සේවා වියුක්තියක් පවතින බව පැහැදිලිව කිව හැකිය. එමෙන්ම පුරුෂ පාර්ෂවය ගත්තද මෑත කාලීනව සේවා වියුක්ති ප්‍රශ්නය නිසි විසඳුම් ලැබී නැති බව කිව හැකිය. එයට හේතුව සේවා වියුක්ති අනුපාතයෙහි සිදු වී ඇත්තේ සුළු උච්ඡාවචනයන් පමණක් විමය. එමෙන්ම වයස් ව්‍යුහය ගත් විට වයස අවු 20-24 තරුණ පිරිස අනෙක් පිරිසට වඩා වැඩි සේවා වියුක්තියකින් පෙළෙන බව කිව හැකිය. ශ්‍රී ලංකාව තුළ අධ්‍යාපනය ලැබූ ස්ත්‍රී සේවාව අධ්‍යාපනය ලැබූ පුරුෂ

සේවා වියුක්තියට වඩා වැඩිය. මෙම පර්යේෂණයේ තවත් අරමුණක් වූ සේවා වියුක්තියට බලපාන ප්‍රායෝගික හේතු කවරේද යන්න සොයා බලන ලද්දේද විද්වත් මත පොත් පත් , සඟරා ආදිය පදනම් කරගෙන ය. එහිදී විරැකියාවට බලපාන ප්‍රධාන හේතු ලෙස රටේ වර්ධන අනුපාතයට වඩා වැඩි වේගයෙන් ජනගහයේ සීඝ්‍ර වර්ධනය, තිබෙන අධ්‍යාපන ක්‍රමවේදය රැකියා වෙළඳපොල හා නොගැලපීම හා රාජ්‍ය අසාර්ථක මූල්‍ය පාලන ප්‍රතිපත්ති යනාදිය හඳුනාගත හැකි අතර මේවාට පිළියම් යෙදීම මත ශ්‍රී ලංකාවේ විරැකියව අඩු කර ගත හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


අතපත්තු ඩැනී. (2011). *ආර්ථික විද්‍යා ප්‍රවේශය 02*, කර්තෘ ප්‍රකාශන, ශ්‍රී ලංකාව.

ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව. (2012-2018). *ශ්‍රම බල සමීක්ෂණ වාර්තා,* මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, ශ්‍රී ලංකාව.

හේනෙගෙදර, පී. එම්. (2007 ජන./ජූලි). ශ්‍රී ලංකාවේ ශ්‍රමය සහ සේවා නියුක්තිය පිළිබඳ සමාලෝචනයක්, *ආර්ථික විමසුම,* 33, පිටු 28.

Martín Rama, (1999). *The Sri Lankan Unemployment Problem Revisited, The World Bank,* Retrieved from http://documents.worldbank.org/curated/en/422331468759896541/pdf/multi-page.pdf

# The Relationship between Job Satisfaction and Employee Performance
# (A Special Reference to Nobleswear (Pvt) Ltd)

K. K. S. U. Ishari Ubesekara[1]

***Abstract***

*This study examined the relationship between job satisfaction and job performance of sewing machine operators in Nobleswear (Pvt) Limited located in Koggala Export Processing Zone, Southern Province in Sri Lanka. The highly talented and committed machine operators were under perform and have left the company. Hence the researcher inspired to examine the job satisfaction and job performance of the machine operators considering the past two years. The sample size was fifty machine operators and they were selected using simple random sampling technique under probability sampling method. The primary data were collected through a well-structured questionnaire containing three parts. The job satisfaction was measured through seven dimensions which are basic pay, supervision, working condition, work itself, opportunity for promotions, support from the management and benefits. Job performance was measured through trait, behaviour and result approach. The answers of the respondents were evaluated using the five point Likert Scale under non- comparative scaling technique. Data were analyzed through the SPSS version 20. The analysis data revealed that there is a positive significant relationship between job satisfaction and job performance of the sewing machine operators. Also there is a significant difference between male and female sewing machine operators in respect of their performance. This study provides a road map for managers about how to satisfy their employees.*

***Keywords*: *Job Performance, Job Satisfaction, Relationship***

## 1. Introduction

In the current world, human resource management is becoming a very significant functional field of organizational management. It can be seen in any place where the employees involve in and their contribution must be

[1] Deprtment of Social Statistics, University of Kelaniya
ishariubesekara@gmail.com

needed for organizational affairs. According to that, each and every organization should pay a high attention to their employees because human resources are the most valuable resource for organizational success. Also it is the source that makes other sources use and gets best return out of them. In new globalization era, there is a fierce competition among apparel sector companies to be the enormous market leader in the world and to get maximum gain for their productions. To achieve those, they should highly concern about their employees because they do their best for the best of the organization if the employees are satisfied with organization. At present these apparel companies are introducing an attractive benefit packages to satisfy and retain existing employees for long run and to attract new employees.

Employee satisfaction refers to a collection of positive and/ or negative feelings that an individual hold toward his or her job. It is a part of life satisfaction. Job satisfaction has been studied both as a consequence of many individual and work environment characteristics and as an antecedent to many outcomes. This study examines whether job satisfaction as an antecedent to job performance of employees. Job performance can be defined as all the behaviours of employees engage while at work (Jex and Thomas, 2002). According to his definition, a fair amount of the employees' behaviour displayed at work is not necessarily related to job specific aspects. Hence commonly, job performance refers to how well someone performs at his or her work. Almost all their findings have been proved there is a positive relationship between these two concepts. Today, employees act like entrepreneurs when they work in a team and every member of the team tries his level best to prove one the best amongst all others.

Although number of researchers has conducted their researches in order to examine the relationship between job satisfaction and job performance, among those there are few studies have been applied into the apparel sector. Also, some researchers have used same dimensions to measure both concepts. But in this study, the researcher has used separate variables to measure job satisfaction and job performance clearly. Job satisfaction is measured through seven dimensions which are basic pay, supervision, working condition, work itself, opportunity for promotions, support from the management, and benefits. Job performance is measured through traits, behaviours and result approach. Also the researcher examines the

relationship between job satisfaction and job performance of the sewing machine operators in Nobleswear (Pvt) Limited, located in Koggala Export Processing Zone, Southern Province in Sri Lanka. There is a fierce competition among apparel organizations in Koggala Export Processing Zone to attract employees to the organization and to retain employees in the organization. Some companies have become more powerful and successful example Unichela, Brandix, Star Garment etc. than other companies. As a result of that Nobleswear (Pvt.) Limited was becoming unsuccessful and reaching to break down their situation as their highly rated machine operators are under perform and a lot of employees are leaving the organization.

When examine the employee turnover in the past two years, the researcher could identify there is a high turnover in the machine operator carder. It is growing day to by day. As a result of that, they face to many hardships such as unable to achieve the production targeted, rejection of orders, and drop of orders from buyers. Therefore, the business was carrying on losses. The management of the company was excited about that and they were unable to determine "why employees leave the company". Commonly held an opinion is, "If the employees are satisfied with the organization, they perform well and never leave the company.

According to that the researcher inspired to examine the level of job satisfaction and job performance of machine operators considering the past two years. For fulfilling that purpose, the researcher discussed with existing employees to identify what are the reasons for this condition. The employees are highly unsatisfied with the salary and salary increments. They said that, "the salary is not enough to cover basic expenses and our salary is lower than other factories in the Zone and still we stay in this company because breaking the service and personal matters. Although the state has proclaimed to increase salary of all private sector employees in Rs. 2500, the company have increased that amount for older employees. They told that, "this increment is unfair and all employees should be received that amount". In addition to that, employees are unsatisfied with management and supervisor actions because they provide high pressure to achieve targets. These matters were highly influenced to employee turnover and to underperformance.

According to that the facts the researcher needed to examine the degree of impact of pay, supervision. Working condition, work itself, opportunity for

promotions, support from the management and benefits to job satisfaction and examine the relationship between job satisfaction and job performance of the employees. Therefore, the addressed main problem is "What is the relationship between job satisfaction and job performance of the sewing machine operators". The researcher expects to provide a good answer to these companies through this study.

### *1.1 Research Objectives*

The main objective of this research was to examine the relationship between job satisfaction and job performance of the sewing machine operators. Also the researcher developed two sub objectives: to examine the impact of gender on job performance of the sewing machine operators and to examine the impact of job satisfaction dimensions on job performance of the sewing machine operators.

## 2. Literature Review

Spector (1997) defined the job satisfaction in terms of how people feel about their jobs and its different aspects. It has to do with the extent to which people like or dislike their job. Thus job satisfaction and job dissatisfaction can appear in any given work situation. He listed three important features of job satisfaction. First, organizations should be guided by human values. Such organizations will be oriented towards treating workers fairly and with respect. In such cases the assessment of job satisfaction may serve as a good indicator of employee effectiveness. High levels of job satisfaction may be sign of a good emotional and mental state of employees. Second, the behaviour of workers depending on their level of job satisfaction will affect the functioning and activities of the organization's business. It can be concluded that job satisfaction will result in positive behaviour and dissatisfaction from this work will result in negative behaviour of employees. Third, job satisfaction may serve as indicators of organizational activities. According to Locke (1976), job satisfaction can be defined as the positive emotional state of person resulting from the appraisal of one's job. Ellickson & Logsdon (2002) shaped this view by defining job satisfaction as the extent to which employees' willingness to their work. Hussami (2008) stated that, job satisfaction and dissatisfaction are not only depending on the nature of the job, it also depends on the expectations what the job supply to an employee.

## 3. Methodology

The population of this study covered all the sewing machine operators who were being employed during the time of the study in Nobleswear (Pvt) Ltd. Among them 50 sewing machine operators were randomly selected for the study. The data collection for the study was done through primary and secondary sources. Primary data were collected by the use of survey through questionnaires and secondary data collection was gathered through previous researcher's articles, books journals and different research papers.

The advantage of using survey method are confidentiality and ability of keeping track of records regarding those who do not return the questionnaire on time and required to be reminded again. A structured questionnaire was developed and distributed among the firms under the sample. Five-point Likert scale of strongly agree, agree, moderate, disagree and strongly disagree was considered while weighting or valuing of 5,4,3,2 and 1 respectively. There were two hypotheses of this study. Job satisfaction is significantly related to the performance of sewing machine operators. And that there is a significant difference between male and female sewing machine operators with regard to their performance. They were tested by using Pearson Product Moment Correlation technique and T test.

## 4. Results

The job satisfaction was measured through seven dimensions which are basic pay, supervision, working condition. Work itself, opportunity for promotions, support from the management and benefits. Job performance was measured through trait, behaviour and result approach.

### *4.1 Nature of the Sample*

Data were collected from fifty sewing machine operators in Nobleswear Company. The majority (68%) of the sample represents female sewing machine operators and 32% of the sample represents the male sewing machine operators in the Nobleswear (Pvt) Limited. The majority (52%) of sewing machine operators represent the age in between 18-28 years. The Age 29-39 years and 40 or above represents 44% and 4% respectively. The majority (54%) of sewing machine operators in the sample represents 1-5 years of working experience. The service of 6-10 years and over 10 years represent 36% and 10% respectively.

### *4.2 Job Satisfaction and Employee Performance*

The Bivariate analysis consists with correlation analysis which was used to investigate the relationship between job satisfaction and job performance of the sewing machine operators in the Nobleswear (pvt) Limited. Using the Pearson product Correlation Coefficient with two - tailed test of significance, the correlation analysis was made to investigate the relationship. The results of the Pearson's correlation are shown in the table 1

Table 1: Correlation between job satisfaction and employee performance

| | | **Mean job Satisfaction** | **Mean job Performance** |
|---|---|---|---|
| **Mean job Satisfaction** | Pearson Correlation | 1 | .571** |
| | Sig.(2-tailed) | | .000 |
| | N | 50 | 50 |
| **Mean job Performance** | Pearson Correlation | .571** | 1 |
| | Sig.(2-tailed) | .000 | |
| | N | 50 | 50 |

Desired level of significant level was (0.005). Two - tailed test was used as formulated alternative hypothesis had been a non-directional one.

The found Pearson product Correlation Coefficient is 0.571 suggesting that there is a significant positive relationship between the job satisfaction and employee job performance. Hence the alternative hypothesis can be accepted while rejecting the null hypothesis. Therefore, there is a statistical evidence to claim that there is a significant relationship between the job satisfaction and employee job performance in Nobleswear (Pvt) Limited.

### *4.3 Job Satisfaction and Employee Performance Based on Gender*

Table 2: T Test (Group statistics and Independent sample test)

| | | Levene's test for Equality of variance | | t-test for Equality of Means | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | F | Sig. | t | df | Sig.(2-tailed) | Mean Difference | Std. Error Difference | 95%Confidence Interval of the Difference Lower | Upper |
| Mean Job Performance | Equal variances assumed | 9.064 | 0.004 | -1.664 | 48 | .103 | -.20067 | .12058 | -.44312 | .04177 |
| | Equal variances not assumed | | | -2.103 | 47.953 | .041 | -.20067 | .09544 | -.39257 | -.00877 |

The appropriate statistical technique was Independent Sample T-Test to test the second hypothesis and the desired level of significance was 0.05 (95% confident level). Hence the alternative hypothesis had been a non-directional one, two tail tests was applied. When considered the mean value there is a slight difference (0.2007) descriptively. It indicates that the job performance of female sewing machine operators in Nobleswear (Pvt) Limited is greater than that of male sewing machine operators. Independent sample T- Test was used to find out whether this difference is statistically significant or not. Results of the independent sample T- Test indicates that Levene's Test for Equality of Variances is significant with F= 9.064 (Sig 0.004). It is suggested that the null hypothesis that the two samples come from populations with the same variances can be rejected. Therefore, the alternative hypothesis is accepted. Thus there is a statistical evidence to claim that there is a significant difference in the job performance of female and male sewing machine operators in Nobleswear (Pvt) Limited.

## 5. Conclusion

In the modern environment of businesses and organizations the human element is an important source of building and sustaining a competitive advantage. Job satisfaction is one of the most widely discussed and enthusiastically studied constructs in such related disciplines as industrial-organizational psychology, personnel and human resource management and organizational management. Job satisfaction also plays a central role in the study of behaviour at work. The main objective of this study was to examine the relationship between job satisfaction and job performance of the sewing machine operators in Nobleswear (Pvt.) Limited. This was accomplished and results showed that as there is a significant positive relationship between job satisfaction and job performance of the sewing machine operators. The correlation value was 0.571. The second purpose of the investigation was to examine the impact of gender on job performance of sewing machine operators. The result was job performances of female sewing machine operators are higher than male sewing machine operator. It was statistically proven by mean value and t- test. Also the third objective was to examine the impact of job satisfaction dimension on job performance of sewing machine operators.

The researcher identified support from the management, employee benefits and work itself have a significant influence on sewing machine operator performance while payments, supervisory support, working conditions and promotions have no greater influence on machine operator performance using analysis of variance. Therefore, the alternative hypothesizes of the study can be accepted.

## References


Elickson, M.C., & Logsdon, K. (2002). *Determinants of job satisfaction of municipal goverment employees.* Piblic personnel Management, 31(3), 343-358

Hussami M. Al. (2008). A Study of nurses' job satisfaction: The relationship to organizational commitment, perceived organizational support, transactional leadership, transformational leadership, and level of education. *European Journal Science*, 22(2), 286-295.

Jex, S. M. and Thomas W. B. (2002). *Organizational psychology: A scientist-practitioner approach*. John Wiley & Sons, Inc, New York, Retrieved from https://sistemas.upb.edu/uploads/%5BSteve_M._Jex,_Thomas_W._Britt%5D_Organizational_Psychology.pdf

Locke, E. (1976). *The nature and causes of job satisfaction*. In M.D.Dunnette(Ed). Chicago: Handbook of industrial and organizational psychology.

Spector, P. (1997). *Job Satisfaction: Application, Assessment, Causes and Consequences.* Thousand Oaks, CA. Sage Publications.

# අ.පො.ස. (උ.පෙළ) 13 වැනි ශ්‍රේණියේ සිසුන්ගේ පාසල් නොපැමිණීම (ජාතික අධ්‍යාපන ආයතනය ආශ්‍රයෙනි)

බී. ජී. ටී. ඩී. බණ්ඩාර[1], එස්. එම්. එම්. එච්. සමරකෝන්

***සංක්ෂේපය***

*මිනිසා තම ජීවන පැවැත්ම පවත්වා ගැනීමටත්, උසස්කර ගැනීමටත් රැස්කරගන්නා ලද දැනුම, ආකල්ප, චර්යයා ආදිය පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය කිරීමේ ක්‍රියාවලිය අධ්‍යාපනය ලෙස අර්ථ දැක්විය හැකිය. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කේන්ද්‍රය පාසල් පද්ධතියයි. ශිෂ්‍යයින්ගේ පාසල් නොපැමිණීම ඔවුන්ගේ කාර්යය සාධනය කෙරෙහි බලපෑම් කරන ගැටලුවකි. පාසල් නොපැමිණීම පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ආශ්‍රිතව හා සමාජීය වශයෙන් ගැටලු ඇති කිරීමට මූලික වන්නකි. 13වැනි ශ්‍රේණියේ සිසුන්ගේ පාසල් නොපැමිණීමේ ස්වභාවය හඳුනා ගනිමින්, එම තත්ත්වට බලපා ඇති අවකාශ පැහැදිලි කර ගැනීම අරමුණු කර පර්යේෂණය ක්‍රියාත්මක කරන ලදි. මෙම අධ්‍යයනයට මහරගම ජාතික අධ්‍යාපන ආයතනය, අධ්‍යාපන අමාත්‍යාංශය වාර්ෂික තොරතුරු වාර්තාව ආශ්‍රයෙන් ද්විතියීක දත්ත රැස්කරගන්නා ලදී. ඒ අනුව 13වැනි ශ්‍රේණියේ සිසුන්ගේ පාසල් නොපැමිණීමේ ප්‍රතිශතය 72.1%කි. ඉහළ ම නොපැමිණීම (88.5%) බස්නාහිර පළාතෙන් ද, අවම නොපැමිණීම (37.9%) උතුරු පළාතෙන් ද වාර්තා වේ. පුම්තිරි බව අනුව සිසුන්ගේ පාසල් නොපැමිණීමේ වෙනස 5%ට අඩු ය. අවම නොපැමිණීම (68.1%) කලා විෂයධාරාව හදාරන සිසුන්ගෙන් වාර්තා වන අතර, ඉහළ ම නොපැමිණීම (76.5%) වාණිජ විෂයධාරාව හදාරන සිසුන්ගෙනි. පාසලෙන් ඉටුවන කාර්යයභාරය පිළිබඳ පාසල් ප්‍රජාවේ විශ්වාසය පළුදු වී නොමැති නමුත් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය විධිමත් නොවීම පිළිබඳ ප්‍රතිශේධාත්මක අදහස් පවතී. තරඟකාරී විභාග ක්‍රමයට මුහුණ දීමට පාසලේ දායකත්වය ප්‍රමාණවත් නොවේ යන ප්‍රධාන සමාජ මතය මත සිසුන් විකල්ප ඉගෙනුම් ක්‍රමවලට නැඹුරු වී තිබේ. පාසලෙහි ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ විශ්වාසය ගොඩ නැගීම, විශ්වවිද්‍යාල හා වෙනත් උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුළත් වීමේ අවස්ථා වැඩි කිරීම, වෘත්තීය මාර්ගෝපදේශය වැඩි වශයෙන් විධිමත් පාසල් අධ්‍යාපනයට සම්බන්ධ කිරීම, ශිෂ්‍ය රුචිකත්වයට අනුව විෂයධාරා තෝරා ගැනීමේ අවස්ථාව ලබා දීම, ප්‍රිය මනාප පාසල් වාතාවරණයක් ඇති කිරීම, පාසල් කළමනාකරණය හා අධීක්ෂණ කටයුතු විධිමත් කිරීම ප්‍රමුඛ වේ. සාපේක්ෂ ව අවම නොපැමිණීමක් සහිත පළාත් මූලික කර ගනිමින්, එම පාසල් පද්ධතිය සුවිශේෂ ව අධ්‍යයනයට ලක් කර සිසු නොපැමිණීම අවම කිරීමට යෝග්‍ය උපක්‍රම සැලසුම් කිරීමේ වැඩපිළිවෙළක් සම්පාදනය කිරීම කාලෝචිත ය.*

**මුඛ්‍ය පද : අධ්‍යාපනය, නොපැමිණීම, පාසල, විභාගය, සිසුන්**

[1]සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
bandarathusithad@gmail.com

## 1. හැඳින්වීම

තරගකාරී විශ්වවිද්‍යාල ප්‍රවේශ විභාගය උසස් පෙළ ශිෂ්‍යයන්ගේ පාසල් නොපැමිණීම කෙරෙහි බලපාන විවාදාපන්න එක් හේතුවකි. දෙමව්පියන් සහ ශිෂ්‍යයන් තුළ මෙම තරගකාරී විභාගය කෙරෙහි දක්වන භීතිකාව පාසල් අධ්‍යාපනයෙන් ඔවුන්ට ලැබෙන ප්‍රතිලාභ ප්‍රමාණය පිළිබඳ සැහීමකට පත්වීම වලක්වාලයි. දෛනිකව මතුවන පෞද්ගලික උපකාරක පන්ති කෙරේ යොමු වීමට එය හේතු කාරක වේ. මෙම පෞද්ගලික උපකාරක පන්ති පාසල් කාලය තුළ ද ක්‍රියාත්මක වීම ශිෂ්‍යයන්ගේ පාසල් නොපැමිණීමට දැඩි බලපෑමක් සිදු කරන අතර විධිමත් අධ්‍යාපනයට ද තර්ජනයක්ව පවතී. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක විධිමත් පාසල් අධ්‍යාපන ක්‍රියාවලියේ අවසාන සහතිකකරණ විභාගය වන්නේ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයයි. තෘතීයික අධ්‍යාපනය සඳහාත් විශ්වවිද්‍යාල ඇතුළු වෙනත් උසස් අධ්‍යාපන ආයතනවලටත්, අධ්‍යාපන විද්‍යා පීඨ රාජ්‍ය අංශයේ මෙන් ම පෞද්ගලික අංශයේ මධ්‍යම මට්ටමේ රැකියා සඳහා තෝරා ගැනීමේ දී ද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල සලකා බැලේ. අ.පො.ස. (උ.පෙළ) විෂයධාරාව ද්විතීයික අධ්‍යාපනයේ විශේෂීකරණ අදියරක් හා තෘතීයික අධ්‍යාපනයේ පදනම් අදියරක් ලෙස ක්‍රියාත්මක ව පවතින අතර අ.පො.ස. (උ.පෙළ) විභාගය සහතිකකරණ විභාගයක් මෙන් ම තේරීම් විභාගයක් ලෙස ද ක්‍රියාත්මක වේ (ගුණසේකර, 2006). අ.පො.ස. (උ.පෙළ) විභාගය 12 හා 13 ශ්‍රේණිවල විෂය නිර්දේශ පදනම් කොටගෙන විෂයධාරා, විද්‍යාව (ජීව විද්‍යාව/භෞතික විද්‍යාව), කලා, වාණිජ හා තාක්ෂණවේදය ලෙස බෙදී ඇත්තේ ය (මහරගම ජාතික අධ්‍යාපන ආයතනය, 2016).

අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටීම සඳහා අධ්‍යාපනය ලබන සෑම පාසල් සිසුවකු ම විභාගය සඳහා අයදුම් පත්‍ර ඉදිරිපත් කරන අවස්ථාව වන විට පාසල් පැවැත්වූ දින ගණනින් අවම වශයෙන් 80%ක පැමිණීම තහවුරු කර තිබිය යුතු ය (අධ්‍යාපන අමාත්‍යාංශය, 2006). උසස් පෙළ විභාගය සම්බන්ධ මූලික පසුබිම මෙසේ පැවතිය ද නියමිත දෑවුරුදු කාලය තුළ පාඨමාලාව සඳහා සිසුන්ගේ පාසල් පැමිණීම පහළ මට්ටමකට ළඟා වී තිබීම වර්තමාන පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවාදාපන්න ගැටලුවක් බවට පත් වී ඇත. මේ ආශ්‍රිත ප්‍රධානතම ගැටලුකාරී තත්ත්වය වන්නේ 13වැනි ශ්‍රේණියෙහි දී සිසු පැමිණීම අඩු වීමත් විභාගය ආසන්නයේ එය බොහෝ දුරටම ශූන්‍ය තත්ත්වයට පත් වීමත් ය (කොඩිතුවක්කු, 1992). අ.පො.ස. (උ.පෙළ) සිසුන් 13 වැනි ශ්‍රේණියේ දී ජනවාරි සිට ජූලි දක්වා පාසල් නොපැමිණෙතියි, යන්න අධ්‍යාපන පරිපාලකයන් එය සාමාන්‍ය තත්ත්වයක් ලෙස සලකන අතර, ඇතැම් පාසල් විසින් එම කාලය අධ්‍යයන නිවාඩු කාලයක් ලෙස හඳුන්වනු ලැබේ (අධ්‍යාපන අමාත්‍යාංශය, 2016). මෙය අද වන විට ප්‍රබල අධ්‍යාපනික හා සමාජ ගැටලු ගණනාවකට තුඩු දෙන්නක් බවට පරිවර්තනය වෙමින් ඇති කරුණකි. මින් ප්‍රමුඛතම වන්නේ වර්ෂයක දී සැලකිය යුතු කාලයක් පාසල් නොපැමිණෙන සිසු පිරිසක් උදෙසා අධ්‍යාපන පිරිවැයෙන් සැලකිය යුතු කොටසක් වෙන් කරනු ලැබීමත්, අනවශ්‍ය භෞතික හා මානව සම්පත් නඩත්තු කිරීමක් සඳහා ඒවා වැය වීමත් සම්පත් අපතේ යාමකි. තවද නියමිත කාලයක් සඳහා සැලසුම් කර ඇති විෂය නිර්දේශයක් නියමිත කාලයට පෙර අවසන් කිරීම

මනෝවිද්‍යාත්මක වශයෙන් ද අහිතකර වේ. මේ සියල්ලෙහි සාමූහික ප්‍රතිඵලය වන්නේ අධ්‍යාපනයේ ඌන සාධනයයි (මහරගම ජාතික අධ්‍යාපන ආයතනය , 2016). ශිෂ්‍යයින්ගේ පාසල් නොපැමිණීම ඔවුන්ගේ අධ්‍යයන කාර්යය සාධනය කෙරෙහි ඉහළ බලපෑමක් එල්ල කරන ගැටලුවකි. එමෙන්ම එය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ආශ්‍රිත ව හා සමාජීය වශයෙන් ගැටලු ඇති කිරීමට මුල්වන සාධකයකි.

### *1.1 පර්යේෂණ අරමුණ*

මේ අනුව මූලික අධ්‍යයනයක් ලෙස අ.පො.ස. (උ.පෙළ) 13වැනි ශ්‍රේණියේ සිසුන් පාසල් නොපැමිණීමට අදාළ ස්වභාවය සහ විචල්‍ය අවකාශ පැහැදිලි කර ගැනීම මෙම අධ්‍යයනය තුලින් සිදු කරනු ලැබේ.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

අ.පො.ස. (උ.පෙළ) 13වැනි ශ්‍රේණියේ සිසුන් පාසල් පද්ධතිය කෙරෙහි දක්වන විශ්වාසය නිසරුවීම වර්තමානයේ විවාදාත්මක ගැටලුවක් බවට පත්වෙමින් පවතින අතර ඒ පිලිබදව සිදුකරන මෙම අධ්‍යයනය තුලදී ද්වීතියික දත්ත හරහා දත්ත රැස්කිරීම සිදුවිය. මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ වාර්තාව (2016), අධ්‍යාපන අමාත්‍යාංශ වාර්ෂික තොරතුරු වාර්තාව (2016) ආදිය තුලින් රැස් කරන ලද දත්ත, ඉදිරිපත් කිරීම සඳහා වගු හා ප්‍රස්තාර භාවිතා කරන ලදී.

### 3. දත්ත විශ්ලේෂණය

දත්ත විශ්ලේෂණය ප්‍රධාන වශයෙන් ආකාර දෙකකට සිදු කරන ලදී. ඒ අනුව පළමුවෙන්ම 13 වැනි ශ්‍රේණියේ සිසුන්ගේ පාසල් නොපැමිණීමේ ස්වභාවය සහ උපනතීන් පිළිබඳව ජාතික මට්ටම සහ පළාත් මට්ටම විශ්ලේෂණය සිදුකරන ලදී. දෙවනුව ගොඩනගන ලද සාධක මත අ.පො.ස. (උ.පෙළ) සිසුන් පාසල් නොපැමිණීම පිලිබඳව ශිෂ්‍යයන් දෙමාපියන් ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් යන පාර්ශ්වකරුවන්ගේ අදහස් විශ්ලේෂණය සිදුකරන ලදී.

### *3.1 සිසුන්ගේ පාසල් නොපැමිණීමේ ස්වභාවය*

වගු අංක 1. පළාත අනුව ශිෂ්‍යයින්ගේ පාසල් නොපැමිණීම


| පළාත | පාසල් සංඛ්‍යාව | ලේඛනගත ශිෂ්‍ය සංඛ්‍යාව | නොපැමිණි ශිෂ්‍ය සංඛ්‍යාව | නොපැමිණීම (%) |
|---|---|---|---|---|
| බස්නාහිර | 33 | 3280 | 2903 | 88.51 |
| උතුරු මැද | 21 | 1607 | 1418 | 8824 |
| වයඹ | 24 | 1825 | 1535 | 81.11 |
| දකුණ | 33 | 2477 | 1911 | 77.15 |

| | | | | |
|---|---|---|---|---|
| සබරගමුව | 21 | 1158 | 881 | 76.08 |
| ඌව | 23 | 1848 | 1222 | 66.13 |
| නැගෙනහිර | 48 | 2676 | 1751 | 65.43 |
| මධ්‍යම | 36 | 2209 | 1332 | 60.3 |
| උතුර | 33 | 1889 | 715 | 37.85 |
| ජාතික මට්ටම | 272 | 18969 | 13668 | 72.05 |

*මූලාශ්‍රය : මහරගම ජාතික අධ්‍යාපන ආයතනය (2016)*

ශ්‍රී ලංකාවේ අ. පො. ස. (උ.පෙළ) 13 වැනි ශ්‍රේණියේ ශිෂ්‍යයින්ගේ පාසල් නොපැමිණීමේ ප්‍රතිශතය 72.05කි. එමෙන් ම දිවයිනේ පළාත් නවයෙන් බස්නාහිර, දකුණ, වයඹ, උතුරු මැද, සබරගමුව යන පළාත් පහක ම ශිෂ්‍යයින්ගේ පාසල් නොපැමිණීම 75% වැඩි අගයක් ගනියි. පළාත් අතුරින් වැඩි ම නොපැමිණීමේ ප්‍රතිශතයක් වාර්තා වනුයේ බස්නාහිර පළාතෙන් ය. අනතුරු ව පිළිවෙළින් උතුරු මැද සහ වයඹ යන පළාත් දෙකෙහි ද පාසල් නොපැමිණීමේ ප්‍රතිශතය 84% ඉක්මවයි. ශිෂ්‍ය නොපැමිණීම අනුව පළාත් සැසඳීමේ දී අවම අගය වාර්තා වනුයේ උතුරු පළාතෙන් වන අතර, එය 38%කි

ප්‍රස්තාර අංක 1. පුම්තිරි බව අනුව සිසුන්ගේ නොපැමිණීම- ජාතික මට්ටම




*මූලාශ්‍රය : මහරගම ජාතික අධ්‍යාපන ආයතනය (2016)*

ජාතික මට්ටම සැලකීමේ දී පාසල් නොපැමිණීම ඉහළ ම අගය (74.53%) නිරූපනය කරනුයේ 13 වැනි ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුවන් ය. එය පාසල් නොපැමිණෙන සිසුවියන්ගේ ප්‍රතිශතයට සාපේක්ෂ ව 5%ක වැඩි අගයකි.

වගු අංක 2. පුම්තිරි බව අනුව පළාත් මට්ටමින් සිසුන්ගේ නොපැමිණීම

| පළාත | සිටිය යුතු ශිෂ්‍ය සංඛ්‍යාව | | නොපැමිණි ශිෂ්‍ය සංඛ්‍යාව | | සිටිය යුතු සංඛ්‍යාවට සාපේක්ෂව නොපැමිණීම (%) | |
|---|---|---|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී |
| බස්නාහිර | 1598 | 1682 | 1488 | 1415 | 93.12 | 84.13 |
| උතුරු මැද | 778 | 829 | 696 | 722 | 89.46 | 87.09 |
| වයඹ | 855 | 970 | 737 | 798 | 86.2 | 82.27 |
| දකුණ | 1146 | 1331 | 869 | 1042 | 75.83 | 78.29 |
| සබරගමුව | 498 | 660 | 346 | 535 | 69.48 | 81.06 |
| ඌව | 883 | 965 | 615 | 607 | 69.65 | 62.9 |
| නැගෙනහිර | 1495 | 1181 | 1038 | 713 | 6943 | 6037 |
| මධ්‍යම | 1097 | 1112 | 672 | 660 | 61.26 | 59.35 |
| උතුර | 822 | 1067 | 375 | 340 | 45.62 | 31.87 |
| ජාතික මට්ටම | 9172 | 9797 | 6836 | 6832 | 74.53 | 69.74 |

*මූලාශ්‍රය : මහරගම ජාතික අධ්‍යාපන ආයතනය (2016)*

අධ්‍යයනයට භාජන කරන ලද පළාත් නවයෙහි සියලු සිසුන්ගේ පාසල් නොපැමිණීමේ රටාව විමසා බැලීමේ දී අනාවරණය වන ප්‍රධාන කරුණක් වන්නේ දිවයිනේ පළාත් නවයෙන් හතක ම, එනම් දකුණ හා සබරගමුව යන පළාත් දෙක හැර අන් සියලු ම පළාත්වල ස්ත්‍රී සිසුන්ට සාපේක්ෂව පිරිමි සිසුන්ගේ පාසල් නොපැමිණීමේ ප්‍රතිශතය ඉහළ අගයක් ගන්නා බවය. එය ජාතික මට්ටම විශ්ලේෂණයෙන් ද තහවුරු වන අතර, ජාතික මට්ටමේ ද සිසුවින්ට සාපේක්ෂව සිසුන්ගේ නොපැමිණීමේ ප්‍රතිශතය 5%කින් ඉහළ වීමෙන් එය සනාථ වේ.

වගු අංක 3. ඉගෙනුම ලබන විෂයධාරාව අනුව ශිෂ්‍යයින්ගේ පාසල් නොපැමිණීම - ජාතික මට්ටම

| විෂය ක්ෂේත්‍රය | පාසල් සංඛ්‍යාව | ලේඛනගත ශිෂ්‍ය සංඛ්‍යාව | නොපැමිණි ශිෂ්‍ය සංඛ්‍යාව | නොපැමිණීම (%) |
|---|---|---|---|---|
| කලා | 268 | 7158 | 4872 | 68.06 |
| වාණිජ | 213 | 4484 | 3431 | 7652 |
| විද්‍යා/ගණිත | 122 | 3574 | 2718 | 76..05 |
| තාක්ෂණවේදය | 89 | 3753 | 2647 | 70.53 |
| ජාතික මට්ටම | 21 | 18969 | 13668 | 72.05 |

*මූලාශ්‍රය : මහරගම ජාතික අධ්‍යාපන ආයතනය (2016)*

විෂයධාරාව අනුව සිසු නොපැමිණීම සැලකීමේ දී වාණිජ විෂයධාරාව හදාරන සිසුන්ගේ පාසල් නොපැමිණීම අනෙක් විෂයධාරා ත්‍රිත්වය හදාරන සිසුන්ට සාපේක්ෂ ව ඉහළ ම මට්ටමේ (76.52%) පවතියි. එහෙත් විද්‍යා/ගණිත විෂයධාරා හදාරන ශිෂ්‍යයින්ගේ නොපැමිණීම හා වාණිජ විෂයධාරාව හදාරන ශිෂ්‍යයින්ගේ නොපැමිණීම අතර පවතින්නේ 0.47%ක වෙනසකි. විෂයධාරා විභේදනයකින් තොරව ජාතික මට්ටම සැලකීමේ දී අ.පො.ස. (උ.පෙළ) ශිෂ්‍යයින්ගේ නොපැමිණීම 72.05%ක් වුව ද, විද්‍යා/ගණිත, වාණිජ හා තාක්ෂණවේදය විෂයධාරා ත්‍රිත්වය හදාරන ශිෂ්‍යයින්ගේ නොපැමිණීම 70% ඉක්මවයි. අධ්‍යයනයට ලක් කළ විෂයධාරා අතුරින් අවම (68.06%) සිසු නොපැමිණීමේ අගය වාර්තා කරනුයේ කලා විෂයධාරාව හදාරන ශිෂ්‍යයින් ය.

වගු අංක 4. ඉගෙනුම ලබන විෂයධාරාව අනුව පළාත් මට්ටමින් ශිෂ්‍යයින්ගේ පාසල් නොපැමිණීමේ ප්‍රතිශතය

| පළාත | කලා | විද්‍යා/ගණිත | වාණිජ | තාක්ෂණවේදය |
|---|---|---|---|---|
| බස්නාහිර | 87.42 | 87.13 | 92.08 | 85.03 |
| මධ්‍යම | 56.51 | 64.32 | 53.17 | 71.02 |
| දකුණ | 72.59 | 82.93 | 79.35 | 74.22 |
| උතුර | 40.12 | 40.9 | 30.19 | 37.17 |
| නැගෙනහිර | 61.14 | 62.64 | 77.09 | 64.89 |
| වයඹ | 81.92 | 94.72 | 84.93 | 80.59 |
| උතුරු මැද | 83.97 | 87.08 | 94.84 | 89.34 |
| ඌව | 59.03 | 83.85 | 70.91 | 61.17 |
| සබරගමුව | 74.4 | 81.67 | 88.67 | 59.49 |
| ජාතික මට්ටම | 68.11 | 76.05 | 76.52 | 70.53 |

*මූලාශ්‍රය : මහරගම ජාතික අධ්‍යාපන ආයතනය (2016)*

ඉගෙනුම ලබන විෂයධාරාව අනුව පළාත් මට්ටමින් පාසල් නොපැමිණීම පිළිබඳ විශ්ලේෂිත දත්ත අනුව, කලා විෂයධාරාව හදාරන සිසුන්ගේ නොපැමිණීමේ ඉහළම අගය (87%) බස්නාහිර පළාතෙන් නිරූපණය වේ. ඊට සමගාමී ව 80%ට වැඩි නොපැමිණීමේ ප්‍රතිශතයක් උතුරු මැද සහ වයඹ පළාත් වලින් වර්තා වේ. සබරගමුව, දකුණ, නැගෙනහිර, ඌව හා මධ්‍යම යන පළාත්වල ද කලා විෂයධාරාව හදාරන සිසුන්ගේ නොපැමිණීම 56%ත් 73%ත් අතර අගයක් ගනී. විද්‍යා හා ගණිත විෂය ධාරාව හදාරන සිසුන්ගේ වැඩි ම නොපැමිණීමේ ප්‍රතිශතය වාර්තා කරනුයේ වයඹ පළාත ය. එය 94% ඉක්මවයි.

ඊට අමතර ව එම විෂයධාරාව සඳහා 80%ට වැඩි නොපැමිණීමක් බස්නාහිර, උතුරු මැද, ඌව, දකුණ සහ සබරගමුව පලාත්වලින් වර්තා වේ. අධ්‍යයනයට ලක් කළ පළාත් අතරින් විද්‍යා හා ගණිත විෂයධාරාව සඳහා අවම නොපැමිණීමක් (30.19%) උතුරු පළාතෙන් වාර්තා වේ. එම අගය 40.9%කි. වාණිජ විෂයධාරාවට උපරිම සිසු නොපැමිණීම (94%) වාර්තා වන්නේ උතුරු මැද පළාතෙන් ය. ඉහතින් සාකච්ඡා කළ අනෙකුත් විෂයධාරාවන් මෙන් ම වාණිජ විෂයධාරාවෙහි ද 80%ට වැඩි නොපැමිණීමක් ප්‍රදර්ශනය කරන පළාත් ත්‍රිත්වයකි. ඒවා පිළිවෙළින් බස්නාහිර, සබරගමුව හා වයඹ පළාත් වේ. වාණිජ විෂයධාරාව සඳහා අවම නොපැමිණීමේ ප්‍රතිශතයක් (30%) පෙන්නුම් කරන්නේ උතුරු පළාත ය.

තාක්ෂණවේදය විෂයධාරාව හදාරන ශිෂ්‍යයින්ගෙන් වැඩි ම නොපැමිණීමේ ප්‍රතිශතය 89.34%ක් වන අතර, එම අගය වාර්තා වන්නේ උතුරු මැද පළාතෙනි. අනෙකුත් සියලු විෂයධාරාවන්හි දී මෙන් ම තාක්ෂණවේදය විෂය ධාරාවෙහි ද අවම නොපැමිණීමේ ප්‍රතිශතය උතුරු පළාත වාර්තා කරයි. උතුරු පළාත හැර අනෙකුත් සියලු ම පළාත්වල තාක්ෂණවේදය විෂයධාරාව සඳහා වන නොපැමිණීමේ ප්‍රතිශතය 59%ත් 89%ත් අතර විචලනය වේ.

සමස්තයක් වශයෙන් විෂයධාරා හතර ම සලකා බැලීමේ දී අවධාරණය වන කරුණක් වන්නේ කලා විෂයධාරාවට ඉහළ ම නොපැමිණීමක් බස්නාහිර පළාතෙන් ද, විද්‍යා ගණිත විෂයධාරාවට වැඩි ම නොපැමිණීම වයඹ පළාතෙන් ද වාණිජ හා තාක්ෂණවේදය විෂයධාරා සඳහා වැඩි ම නොපැමිණීම උතුරු මැද පළාතෙන් ද වාර්තා වීම ය. කලා, විද්‍යා, වාණිජ හා තාක්ෂණවේදය යන සැම විෂය ධාරාවක් සඳහා ම අවම නොපැමිණීම වාර්තා කරන්නේ උතුරු පළාත ය. පළාත් අනුව විශ්ලේෂණයේ දී බස්නාහිර වයඹ හා උතුරු මැද යන පළාත් ත්‍රිත්වය ම සැම විෂයධාරාවක් සඳහා ම 80%කට වඩා වැඩි නොපැමිණීමක් නිරූපණය කරයි. පළාත් අනුව යථෝක්ත විෂයධාරා හතරෙන් උපරිම හා අවම නොපැමිණීමක් පෙන්නුම් කරනුයේ වාණිජ විෂයධාරාව හදාරන සිසුන් ය. එම නොපැමිණීම වාර්තා වනුයේ පිළිවෙළින් උතුරු මැද හා උතුරු පළාත්වලිනි.

### *3.2 සිසුන් පාසල් නොපැමිණීම පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ අදහස*

ශ්‍රී ලංකාවේ අ.පො.ස. (උ.පෙළ) පාඨමාලා ක්‍රියාත්මක සියලුම 1 ඒ බී සහ 1 සී පාසල් අතුරින් අහඹු ලෙස තෝරාගත් පාසල් 272ක සිසුන්ගේ පාසල් නොපැමිණීම පිළිබඳව පාර්ශ්වකරුවන් ලෙස විදුහල්පතිවරු 279ක්, ගුරුවරුන් 1107ක්, සිසුන් 1620ක් හා ඔවුන්ගේ දෙමව්පියන් 1097කින් මහරගම ජාතික අධ්‍යාපන ආයතනය රැස්කරගත් ප්‍රාථමික දත්ත ද්විතීයික දත්ත ලෙස ගෙන ගොඩනගාගත් සාධක කිහිපයක් මත පදනම්ව ප්‍රතිචාරය විශ්ලේෂණය මෙහිදී සිදුවේ.

ශිෂ්‍යයින් 60%ක් පෞද්ගලික උපකාරක පන්තිවලින් ලබන දැනුම විභාගය සමත්වීමට අත්‍යවශ්‍ය යැයි සිතන බැවින් ඉදහිට පාසල් නොගොස් උපකාරක පන්ති කරා ද යොමුවන බවට එකඟ වේ. දෙමව්පියන් (58%), ගුරුවරුන් (64%) සහ විදුහල්පතිවරුන් (71%) ද එම ප්‍රකාශයට එකඟ වීමෙන් එම අදහස තහවුරු කර තිබේ.

වගු අංක 5. පෞද්ගලික උපකාරක පන්තිවලින් ලබන දැනුම විභාගය සමත්වීමට අත්‍යවශ්‍ය යැයි සිතන බැවින් අඛණ්ඩව පාසල් කරා නොගොස් උපකාරක පන්ති කරා ද යොමුවේ, යන ප්‍රකාශයට ලද ප්‍රතිචාර

| පාර්ශවකරුවන් | එකඟ වෙමි | එකඟ නොවෙමි | දළ අනුපාතය |
|---|---|---|---|
| ශිෂ්‍යයන් | 60 | 39.51 | 2:1 |
| දෙමාපියන් | 57.98 | 41.57 | 1:1 |
| ගුරුවරුන් | 63.69 | 35.77 | 2:1 |
| විදුහල්පතිවරුන් | 70.97 | 27.67 | 2:1 |
| සාමාන්‍යය | 63.16 | 36.38 | 2:1 |

*මූලාශ්‍රය : මහරගම ජාතික අධ්‍යාපන ආයතනය (2016)*

ප්‍රකාශය සම්බන්ධයෙන් ගුරුවරුන් සහ විදුහල්පතිවරුන්ගේ එකඟතාව ඉහළ බව ඔවුන්ගේ එකඟතාව, එකඟ නො වීම මෙන් දෙගුණයකට ආසන්න වීමෙන් පැහැදිලි වේ.

පාර්ශව හතරෙහි සමස්ථ එකඟතාවයේ සාමාන්‍යය සැලකීමේ දී සිව් පාර්ශ්වයේ එකඟතාව ප්‍රතිචාර සංඛ්‍යාවෙහි දෙගුණයකට (63%) ආසන්න ය. මේ අනුව පැහැදිලි වන්නේ පෞද්ගලික පන්තිවලින් ලබන දැනුම විභාගය සමත්වීමට අත්‍යවශ්‍ය යැයි සිතන බැවින් අඛණ්ඩ ව පාසල් කරා නොගොස් උපකාරක පන්තිවලට යොමු වීමක් සිදු වන බව යි.

වගු අංක 6 -ආර්ථිකමය දුෂ්කරතා අඛණ්ඩ පාසල් ගමනට බාධා පමුණුවයි යන ප්‍රකාශයට ලද ප්‍රතිචාර

| පාර්ශවකරුවන් | එකඟ වෙමි | එකඟ නොවෙමි | දළ අනුපාතය |
|---|---|---|---|
| ශිෂ්‍යයන් | 27.28 | 72.22 | 1:3 |
| දෙමව්පියන් | 35.55 | 64.18 | 1:2 |
| ගුරුවරුන් | 43.72 | 55.65 | 1:1 |
| විදුහල්පතිවරුන් | 44.80 | 55.20 | 1:1 |
| සාමාන්‍යය | 37.8 | 61.8 | 1:2 |

*මූලාශ්‍රය : මහරගම ජාතික අධ්‍යාපන ආයතනය (2016)*

ආර්ථිකමය දුෂ්කරතා අඛණ්ඩ පාසල් ගමනට බාධා පමුණුවයි"යන ප්‍රකාශය කෙරෙහි ඉහළ ම එකඟ නොවීම (72.22%) සිසුන්ගෙන් නිරූපණය වන අතර පහළ ම එකඟ නොවීම (55.20%) විදුහල්පතිවරුන්ගෙනි. ශිෂ්‍ය එකඟ නොවීමේ දළ අනුපාතය එකඟ වීම මෙන් තෙගුණයක් වුව ද, ගුරුවරුන් සහ විදුහල්පතිවරුන්ගේ එකඟ වීම හා එකඟ නොවීම ආසන්න වශයෙන් සම අනුපාතික වේ. සියලු පාර්ශ්වකරුවන්ගේ එකඟ නොවීමේ සාමාන්‍යය 61.8% කි. ඒ අනුව සමස්ත ප්‍රතිචාර සාමන්‍යය සැලකූ විට ආර්ථික දුෂ්කරතා ශිෂ්‍ය නොපැමිණීම කෙරෙහි දැඩි බලපෑමක් නොකරන බව අනාවරණය වේ.

වගු අංක 7 - විභාගය සඳහා අයදුම්පත් යොමු කළ පසු පාසල් යාම අවශ්‍ය නොවේ/උනන්දු නොවේ යන ප්‍රකාශයට ලද ප්‍රතිචාර

| පාර්ශවකරුවන් | එකඟ වෙමි | එකඟ නොවෙමි | දළ අනුපාතය |
|---|---|---|---|
| ශිෂ්‍යයන් | 21.70 | 77.72 | 1:4 |
| දෙමව්පියන් | 48.50 | 50.68 | 1:1 |
| ගුරුවරුන් | 78.68 | 21.05 | 4:1 |
| විදුහල්පතිවරුන් | 79.93 | 19.71 | 4:1 |
| සාමාන්‍යය | 57.20 | 42.29 | 1:1 |

*මූලාශ්‍රය : මහරගම ජාතික අධ්‍යාපන ආයතනය (2016)*

විභාගය සඳහා අයැදුම්පත් යොමු කළ පසු පාසල් යාම අවශ්‍ය/උනන්දු නො වේ෴ යන ප්‍රකාශයට ශිෂ්‍යය ප්‍රතිචාර විශ්ලේෂණයෙන් තහවුරු වන්නේ එම මතයට එකඟ නොවන ශිෂ්‍ය ප්‍රමාණය එම මතය තහවුරු කරන ශිෂ්‍ය ප්‍රමාණය මෙන් සිව් ගුණයකට ආසන්න ප්‍රමාණයකින් ඉහළ බවයි. දෙමව්පිය ප්‍රතිචාර අනුව එම ප්‍රකාශයට එකඟ වීම හා නොවීම අතර දළ අනුපාතය 1:1 කි. එහෙත් ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් ප්‍රකාශයට එකඟතාව පළ කරන්නේ සිව් ගුණයක ආසන්න ඉහළ මට්ටමකිනි. එය ශිෂ්‍යයන්ගේ මතයට සම්පූර්ණයෙන් ම ප්‍රතිවිරුද්ධව ය. සමස්ත ප්‍රතිචාර සාමාන්‍ය සැලකූ විට උක්ත ප්‍රකාශයට එකඟ වීම (57.2%) එකඟ නොවන ප්‍රතිශතයට (42.3%) වඩා වැඩි ය. ඉන් පැහැදිලි වන්නේ "විභාගය සඳහා අයැදුම්පත් යොමු කළ පසු පාසල් යාම අවශ්‍ය නො වේ" යන ප්‍රකාශයට එකඟ වන ප්‍රමාණය එකඟ නොවන ප්‍රමාණයට වඩා 15%න් වැඩි බව ය.

මේ අනුව විභාගය සඳහා අයදුම්පත් යොමු කල පසු පාසල් යාමට අවශ්‍යතාවක් ශිෂ්‍යයන් තුළ නොමැති බව ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් අදහස් කරන අතර ඒ හා සමාන ප්‍රමාණයකින් ශිෂ්‍යයන් එම මතය ප්‍රතික්ෂේප කර ඇත. එමගින් විභාගය සඳහා අයැදුම්පත් යොමු කළ පසු පාසල් යාම අවශ්‍ය නොවේ යන අදහස ශිෂ්‍යයන්ගේ පාසල් නොපැමිණීම කෙරෙහි යම් බලපෑමක් සිදු කරන බව අනාවරණය වේ.

## 4. නිගමන

### *4.1 පාසල් නොපැමිණීමේ ස්වාභාවය අනුව*

#### *4.1.1 ජාතික මට්ටම*

අ.පො.ස. (උ.පෙළ) 13වැනි ශ්‍රේණියේ ශිෂ්‍යයින්ගේ පාසල් නොපැමිණීම 72%කි. එය මුළු ශිෂ්‍යය ප්‍රමාණයෙන් 3/4 ආසන්න සංඛ්‍යාවකි. පුමිතිරි බව හා පාසල් වර්ගය අනුව සිසුන්ගේ පාසල් නොපැමිණීමේ වෙනස 5%ට අඩු ය.

සියලුම විෂයධාරාවලට ශිෂ්‍ය නොපැමිණීම ලේඛන ගත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 2/3ට(68%) ආසන්න ය. ඉහළ ම ශිෂ්‍ය නොපැමිණීම පෙන්නුම් කරන්නේ වාණිජ විෂයධාරාව හදාරන සිසුන්ගෙනි. අවම ශිෂ්‍ය නොපැමිණීම වාර්තා වන්නේ කලා විෂයධාරාව හදාරන සිසුන්ගෙනි.

#### *4.1.2 පළාත් මට්ටමේ දී*

පාසල් පැමිණිය යුතු සංඛ්‍යාවෙන් 3/4කට වැඩි ශිෂ්‍ය නොපැමිණීමක් බස්නාහිර, දකුණ, වයඹ, උතුරු මැද, සබරගමුව යන පළාත්වලින් පෙන්නුම් කරයි. ඉහළ ම ශිෂ්‍ය නොපැමිණීම බස්නාහිර පළාතෙන් ද, අවම ශිෂ්‍ය නොපැමිණීම උතුරු පළාතෙන් ද වාර්තා වේ. ශිෂ්‍යයන්ගේ නොපැමිණීමේ උපරිමය බස්නාහිර පළාතෙන් වන අතර ශිෂ්‍යාවන්ගේ නොපැමිණීමේ උපරිමය උතුරු මැද පළාතෙනි.

විෂයධාරා අනුව සැලකීමේ දී සියලු විෂයධාරා සඳහා අවම නොපැමිණීම උතුරු පළාතෙන් වාර්තා වේ. කලා විෂයධාරාවේ උපරිම නොපැමිණීමේ ප්‍රතිශතය බස්නාහිර පළාතෙන් වන අතර විද්‍යා/ගණිත විෂයධාරාවේ උපරිම නොපැමිණීම මධ්‍යම පළාතෙන් වාර්තා වේ. වාණිජ හා තාක්ෂණවේදය විෂයධාරා දෙකෙහි ම උපරිම නොපැමිණීම පෙන්වන්නේ උතුරු මැද පළාතයි.

#### *4.1.3 ගොඩනගාගත් සාධක අනුව*

පාසල් ප්‍රජාව තුළ පාසලෙන් ඉටුවන කාර්යයභාරය පිළිබඳ පූර්ණ විශ්වාසය පළුදු වී නොමැති නමුත් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය විධිමත් නොවීම පිළිබඳ ප්‍රතිශේධාත්මක අදහස් පවතී.

තරගකාරී විභාග රටාව නිසා සිසුන් විකල්ප අධ්‍යාපන ක්‍රමවලට යොමු වීමට නැඹුරු වී ඇත. පාසලේ ක්‍රියාත්මක ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සමඟ සසඳා බලා වඩා හොඳ විකල්ප තෝරා ගැනීමට සිසුන් යොමු වේ. පාසල් පැවැත්වෙන කාලසීමාවේ ද පෞද්ගලික උපකාරක පන්ති පවත්වන බැවින් උක්ත කරුණ පිළිබඳ අවධානය යොමු කර සිසුහු උපකාරක පන්ති කරා යොමු වෙ.

සිසුන් පාසල් නොපැමිණීම කෙරෙහි ඔහුන්ගේ ආර්ථික තත්ත්වය එතරම් බලපෑමක් සිදු නොකරයි. විභාගය සමත්වීමට පෞද්ගලික උපකාරක පන්තිවලින් ලබන දැනුම අත්‍යවශ්‍ය යැයි සිතීම ද තරගකාරී විභාග රටාව නිසා විභාගය සමත්වීමට පාසල් අධ්‍යාපනය පමණක් ප්‍රමාණවත් නොවේ යැයි පවතින අදහස් සිසුන්ගේ පාසල් නොපැමිණීමට වන හේතු අතර වේ.

## 5. යෝජනා

අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටීම සඳහා 80%ක පැමිණීමේ නීතිය විධිමත් ලෙස ක්‍රියාත්මක කිරීම සහ පාසලේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ඇතුළු පාසල් කළමනාකරණය හා අධීක්ෂණය කටයුතු විධිමත් කිරීම.

ශිෂ්‍ය රුචිකත්වය පරිදි විෂයධාරා තෝරා ගැනීමට අවස්ථා සැලසීම තුළින් නව තාක්ෂණය යොදා ගනිමින්, සැලසුම් සහගත අතිරේක ඉගැන්වීම් ක්‍රම ක්‍රියාත්මකකිරීම.

සිසු චින්තනය වර්ධනය කරන ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම.

අ.පො.ස. (උ.පෙළ) ශිෂ්‍යයන්ගේ අනාගත අභිවෘද්ධිය සැලසීම උදෙසා විශ්වවිද්‍යාල හා වෙනත් උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුළත් වීමට ඇති අවස්ථා වැඩි කිරීම.

වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් පාසල් අධ්‍යාපනයට වැඩි වශයෙන් සම්බන්ධ කිරීම සහ තරගකාරී අ.පො.ස. (උ.පෙළ) විභාගයට සාර්ථකව මුහුණ දීමට අත්‍යවශ්‍යයින්ම බාහිර උපකාරක පංතිවලට සහභාගී විය යුතුයි සහ පාසල් පද්ධතිය තුළින් විෂය නිර්දේශය නිසි බර තැබීමකින් යුතුව ආවරණය නොකරතියි යන සමාජගත සංකල්ප බිඳ හෙළීමට, විද්‍යාත්මක ප්‍රතිපත්තියක් මත රජය මැදිහත්ව කලාප, දිස්ත්‍රික්, පළාත් මට්ටමින් වෙන වෙනමවත් ජාතික තලයේ ඒකාබද්ධවූත් කෙටිකාලීන සහ දිගුකාලීන වැඩසටහන් ක්‍රියාත්මක කල යුතු ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


අධ්‍යාපන අමාත්‍යාංශය. (2006). *සිසුන්ගේ පාසල් පැමිණීම ඉහළ නැංවීම සහ පාසල් කාලය තුළ දී ගුරුභවතුන් විසින් මුදල් අයකරමින් පෞද්ගලික පන්තිවල ඉගැන්වීම වැලැක්වීම.* 2006. 12. 08 දිනැති චක්‍රලේඛ අංක 2006/45.

අධ්‍යාපන අමාත්‍යාංශය. (2016). *වාර්ෂික තොරතුරු වාර්තාව.* බත්තරමුල්ල: අධ්‍යාපන අමාත්‍යාංශය.

කොඩිතුවක්කු, ජී. (1992). *ශ්‍රී ලංකාවේ රජයේ පාසල්හි 13 වසරේ සිංහල මාධ්‍ය ශිෂ්‍ය ශිෂ්‍යාවන් මුදල් ගෙවා පෞද්ගලික පන්තිවල අධ්‍යාපනය ලැබීම, සිසුන්, විදුහල්පතිවරුන්, එම ගුරුවරුන්, දෙමාපියන්, අධ්‍යාපනඥයින් විසින් විධිමත් පාසල් අධ්‍යාපනයට සාපේක්ෂ ව සංජානනය කරන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්.* මහරගම: ජාතික අධ්‍යාපන ආයතනය.

ගුණසේකර, පී. ඩී. ජේ. (2006). *අ.පො.ස. (උසස් පෙළ) සිසුන්ගේ පාසල් පැමිණීමේ රටා පිළිබඳ අධ්‍යයනය.* මහරගම: පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

මහරගම ජාතික අධ්‍යාපන ආයතනය. (2016). *ශ්‍රී ලංකාවේ පාසල්වල 13 වැනි ශ්‍රේණියේ සිසුන්ගේ පාසල් නොපැමිණීම,* පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව.

# විකුණුම් කාර්යය සාධනයට අනුව පාරිභෝගිකයා මත පදනම් වූ සන්නාම කොටස් වල බලපෑම (ලකී ලංකා ආයතනය ආශ්‍රයෙනි)

ඩබ්. එච්. ඩී. එස්. චන්ද්‍රසේන[1]

***සංක්ෂේපය***

*ව්‍යාපාර කටයුතුවලදී මෙන්ම අධ්‍යයන සමීක්ෂණයන්හිදී ද සමාගමක් සතුව පවතින පාරිභෝගිකයින්ට අමතරව දෙවනුවට වඩාත්ම වැදගත් වත්කම ලෙස සලකනු ලබන්නේ සන්නාම කොටස් වේ. නිෂ්පාදන කාණ්ඩයකට තරඟකාරීන් බහුල වීම නිසා තරඟයක් නිර්මාණය වන අතර එම තරඟයට සාර්ථකව මුහුණ දෙමින් වෙළඳපොළෙහි තම ස්ථානය රැක ගැනිමට පාරිභෝගික මනස තුළ ප්‍රමුඛ ස්ථානයක් වෙළඳ නාමය සඳහා නිර්මාණය කිරීමට අවශ්‍ය වේ. ඒ සඳහා සන්නාම කොටස් සහ විකුණුම් ප්‍රමාණය අතර සම්බන්ධයක් පවතී ද යන්න පිළිබඳව සොයා බැලීම අවශ්‍ය වේ. විකුණුම් කාර්යය තුළ දී සන්නාම කොටස්, පාරිභෝගිකයින් හට කෙතරම් බලපෑමක් කරන්නේද යන්න පිළිබදව සොයා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණ විය. ඒ අනුව ලකී ලංකා කිරි නිෂ්පාදන ආයතනයේ අලෙවි ප්‍රමාණය හා වෙළඳ නාම කොටස් අතර සම්බන්ධයක් පවතියි ද යන්න සොයා බලන ලදී. මෙම අධ්‍යයනය සිදුකර ඇත්තේ විකුණුම් කාර්යයට අනුව කොළඹ ප්‍රදේශයේ පාරිභෝගිකයන් මත පදනම් වූ සන්නාම කොටස් වල බලපෑම මිනුම් කිරීම සඳහා වේ. මෙහිදී ලකී ලංකා ආයතනයේ පාරිභෝගිකයින් 50 දෙනෙකුගෙන් යුතු නියැදියක් සසම්භාවීව තෝරා ප්‍රශ්නාවලී ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතයෙන් දත්ත රැස්කර ගන්නා ලදී. මෙහිදී ස්වායත්ත විචල්‍ය වන්නේ වෙළඳ නාම පිළිබඳ දැනුවත්භාවය, වෙළඳ නාම ඇසුරු කිරිම, ස්ථිර ගුණාත්මකභාවය සහ වෙළඳ නාම පක්ෂපාතීත්වයයි. විකුණුම් කාර්යයය පරායත්ත විචල්‍යය වේ. මෙම අධ්‍යයනයෙන් ලබාගත් ප්‍රතිඵලයට අනුව වෙළඳ නාම පක්ෂපාතිත්වය අනෙකුත් විචල්‍යයන්ට වඩා විකුණුම් කාර්යය කෙරෙහි වැඩි බලපෑමක් කරන බව සොයාගන්නා ලදී. මෙහිදී ආයතනය සාපේක්ෂව, සන්නාම සංගම් එනම්, වෙළඳ නාම ඇසුරු කිරීම සහ ප්‍රත්‍යක්ෂ ගුණාත්මකභාවයට වඩා වැඩි අවධානයක් වෙළඳ නාම පක්ෂපාතීත්වය සහ වෙළඳනාම පිළිබඳ දැනුවත්භාවය යන සාධක කෙරෙහි යොමු කිරීමෙන් සන්නාම නාමය දියුණු කිරීමට හැකි වන බව පෙන්වයි. වෙළඳ නාම පක්ෂපාතීත්වය සහ වෙළඳනාම පිළිබඳ දැනුවත්භාවය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරිම තුළින් විකුණුම් කාර්යය සාර්ථක කරගත හැකි බව මෙම අධ්‍යයනය තුළින් පෙන්වා දිය හැක.*

***මුඛ්‍ය පද : පාරිභෝගිකයා, විකුණුම් කාර්යය, සන්නාම කොටස්***

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
whdschandrasena@gmail.com

## 1. හැඳින්වීම

වර්තමාන තරඟකාරී ව්‍යාපාරික පරිසරයක් තුළ වෙළඳනාම කොටස් පිළිබඳ සංකල්පය යනු ව්‍යාපාරිකයන්ගේ උපාය මාර්ගික බුද්ධිය සඳහා වූ වැදගත් මූලාශ්‍රයකි. ඉහළ වෙළඳනාම කොටස් මට්ටම්, පාරිභෝගිකයන්ගේ කැමැත්ත සහ මිලදී ගැනීමේ අභිප්‍රායන් සඳහා බලපෑම් කරන බව හඳුනාගෙන ඇත (Cobb-Walgren et al., 1995). සන්නාමය හා බැඳුණු වෙළඳ නාම වත්කම් සහ වගකීම්, සමාගමකට හෝ එම සමාගමේ පාරිභෝගිකයන්ට නිෂ්පාදනයකින් හෝ සේවාවකින් ලබා දුන් අගයට එකතු කර හෝ අඩු කර ඇති වෙළඳ නාම සහ සංකේතයන්ය (Aaker, 1991). වෙළඳ නාමයක් මත පාරිභෝගිකයා තබා ඇති සම්පූර්ණ උපයෝගීතාවය වෙළඳ නාම කොටස් ලෙස පිළිගෙන ඇත (Charnatony & McDonald, 2003). වෙළඳනාම කොටස් ව්‍යාපාර භාවිතයේදී මෙන්ම අධ්‍යයනවලදී ද වැදගත් සංකල්පයකි. එයට හේතුව වන්නේ සාර්ථක වෙළඳ නාම ඇසුරෙන් තරඟකාරී වාසි අත්කර ගැනීමට ව්‍යාපාරිකයන්ට හැකි බැවිනි. ශක්තිමත් වෙළඳ නාම කොටස් සාර්ථක සන්නාම දිගුවන්නට අවස්ථාද, තරඟකාරීන්ගේ ප්‍රචාරණ උත්සාහයන්ටත්, තරඟකාරී ප්‍රවේශයට ඇති බාධා වලටත් ඔරොත්තු දීමේ හැකියාවත් අත්කර දේ (Farquhar, 1989).

වෙළඳ නාමය නොමැතිව වෙළඳ නාමයට වඩා විශාල පරිමාවක් හෝ වැඩි ආන්තිකයක් උපයා ගැනිමට වෙළඳනාමයට අවසර දෙන සන්නාමයක ගනුදෙනුකරුවන්, නාලිකා සාමාජිකයින් පවුල් සංස්ථාවේ පාර්ශවකරුවන්ගේ සංගම් සහ හැසිරීම් සමූහයක් ලෙස වෙළඳ නාම කොටස් පුළුල් ලෙස අර්ථ දැක්විය හැකිය (Leuthesser, 1988). එබැවින් පාරිභෝගිකයින්ගේ වෙළඳ නාම කොටස් වල විකුණුම් කාර්යය සාධනය කෙරෙහි වන බලපෑම පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා කිරි කර්මාන්තය යටතේ ලකී ලංකා කිරි නිෂ්පාදන පෞද්ගලික ආයතනය තෝරාගෙන ඇත.

ශ්‍රී ලංකාවේ යෝගට් නිෂ්පාදන කාණ්ඩය යටතේ ලකී යෝගට් සන්නාමය ඉතා වැදගත් කාර්යයයක් ඉටු කරනු ලබයි. ලකී ලංකා කිරි නිෂ්පාදන පෞද්ගලික ආයතනය විසින් ගොඩනගා දියුණු කර ඇති ප්‍රධාන කිරි ආශ්‍රිත නිෂ්පාදනය ලකී යෝගට් වේ. ලංකාවේ යෝගට් නිෂ්පාදන කාණ්ඩය යටතේ ලකී ලංකා කිරි නිෂ්පාදන පෞද්ගලික ආයතනය හැරුණු විට තවත් බොහෝ සන්නාමයන් වේ. මෙම නිෂ්පාදන කාණ්ඩයට තරඟකරුවන් බහුල වීම නිසා විශාල තරඟයක් නිර්මාණය වී ඇත. සාර්ථකව එම තරඟයට මුහුණ දෙමින් සහ වෙළඳපොළෙහි තම ස්ථානයෙහි රැකගනිමින් මෙම නිෂ්පාදන කාණ්ඩයෙහි රැඳී සිටිමට පාරිභෝගික මනස තුළ ස්වාධීන සහ වටිනා ස්ථානයක් වෙළඳ නාමය සඳහා නිර්මාණය කිරීම අවශ්‍යයෙන්ම කළ යුතු දෙයකි.

වෙළඳ නාම යන වචනය විවිධ දෘෂ්ටිකෝණ වලින් අර්ථකතනය කල හැකි අතර එනම් පාරිභෝගිකයාගේ දැක්ම, ආයතනික දැක්ම හා වෙළඳ නාමය ලබාදෙන අරමුණ අනුව වේ (Rios, 2007). එමෙන්ම වෙළඳ නාමය ඒක පුද්ගල සංවිධාන සහ ආයතනමය වශයෙන් විශාල වැදගත්කමක් උසුලයි. වෙළඳ නාමය යනු, යම් භාණ්ඩයක හෝ සේවාවක නිෂ්පාදිතයා හෝ විකුණුම්කරු හඳුනාගැනීමට සංක්ෂිප්ත සංඥාවක්, සළකුණක් නොඑසේනම් සැලසුමක් හෝ ඉහත කරුණු වල සංයෝජනයකි (Kotler, 2009).

භාණ්ඩයක් යනු, යම් උවමනාවක් හෝ අවශ්‍යතාවයක් තෘප්තිමත් කර ගැනීම සඳහා පරිභෝජනයට භාවිතයට හා අවදානය ලබාගැනීමට වෙළඳපොළට පිරිනමන දෙයක් වේ (Keller, 2008). ඔහුට අනුව වෙළඳ නාම යනු භාණ්ඩයකට එහා ගිය දෙයකි. එයට හේතුව නම් එකම අවශ්‍යතාවය තෘප්තිමත් කරගැනිමට නිපදවා ඇති අනෙකුත් නිෂ්පාදනයන්ගෙන් වෙන්කර හඳුනාගැනීමට එය සතුව විවිධ මානයන් පැවතිමයි. නවෝත්පාදනය මඟින් Gillette සහ Merck වැනි වෙළඳ නාමයන් නිෂ්පාදන කාර්යය සාධනය සමඟ තරඟකාරී වාසි නිර්මාණය කර ඇත (Keller, 2008). පාරිභෝගිකයාගේ අභිප්‍රේරණය සහ ආශාවන් හඳුනාගැනීම වැනි විවිධ ක්‍රම මඟින් අනෙකුත් වෙළඳ නාමයන් තරඟකාරී වාසි නිර්මාණය කරගෙන ඇති අතර ඒ සඳහා ඔවුන්ගේ නිෂ්පාදන ආශ්‍රිතව ඒ සඳහා ගැලපෙන රූප නිර්මාණය කරගෙන ඇත (Keller 2008). ශක්තිමත් වෙළඳ නාම සතුව පුළුල් සංවිධාන පරාසයක් ඇති අතර නිවැරදි වෙළඳපොළ තීරණ ලබා ගැනීම සඳහා මේවා හඳුනාගෙන තිබිය යුතුය. වෙළඳනාමකරණයට ලක් කරන ලද නිෂ්පාදන අතර සංජානනය කරන ලද වෙනසක් නිර්මාණය කිරිම මඟින් හා පක්ෂපාතී පාරිභෝගික පිරිසක් නිර්මාණය කරගැනිම මඟින් ව්‍යාපාරිකයන්ට තම සමාගමට මූල්‍යමය ලාභ බවට පත්කරගත හැකි අගයන් නිර්මාණය කරගැනිමට හැකියාවක් පවතී (Keller, 2008).

### *1.1 පර්යේෂණ අරමුණු*

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ ලකී ලංකා කිරි නිෂ්පාදන පෞද්ගලික ආයතනයේ අලෙවි ප්‍රමාණය හා වෙළඳ නාම කොටස් අතර සම්බන්ධයක් පවතිද යන්න සොයා බැලීමයි. මෙම අධ්‍යයනයේ උප අරමුණු පහත පරිදි හඳුනාගත හැකිය.

- විකුණුම් වලට වෙළඳ නාමය පිළිබඳව ඇති අවබෝධයෙහි බලපෑම හඳුනා ගැනීම.
- විකුණුම් වලට වෙළඳ නාමය ඇසුරු කරගැනීමේ බලපෑම හඳුනා ගැනීම.
- විකුණුම් වලට වෙළඳ නාමයේ ගුණාත්මකභාවය මඟින් ඇති කරන බලපෑම හඳුනා ගැනීම.
- විකුණුම් වලට වෙළඳ නාමය සඳහා ඇති පක්ෂපාතිභාවය නිසා ඇතිවන බලපෑම හඳුනා ගැනීම.

## 2. සාහිත්‍ය විමර්ශනය

1980 දශකයේ සිට වෙළඳ නාම කොටස් ඉතාමත් ජනප්‍රිය එමෙන්ම ප්‍රබල වටිනාකමකින් යුතු ව්‍යාපාරික සංකල්පයක් විය (keller, 2004). Srivastawa සහ Shocker ගේ අදහසට අනුව වෙළඳ නාම කොටස් යනු වෙළඳ නාමයක් විසින් නිෂ්පාදනයකට ලබාදෙනු ලබන අගය වැඩි කිරීමයි. Ailawadi, lenmann සහ Neslin ට අනුව වෙළඳ නාම කොටස් යනු වෙළඳ නාමයක් නැති නිෂ්පාදනයකට සාපේක්ෂව වෙළඳ නාමයක් ඇති නිෂ්පාදනයක් නිසා හට ගන්නා ප්‍රතිඵලයකි. වටහාගත් ගුණාත්මකභාවය වෙළඳනාම ඇසුරුකිරීම සහ වෙළඳ නාම පිළිබඳ දැනුවත්භාවය තෘප්තිය වැඩි කිරීමට සහ වෙළඳ නාමය මිලදී ගැනීමට හේතු සපයයි. වෙළඳ නාමය තෝරා ගැනීමට ඒවා අත්‍යවශ්‍යය නොවුවද ඒවා සහතික කිරීමට සහ වෙනත් වෙළඳ නාමයක් අත්හදා බැලීමේ අවස්ථාව අඩු කිරීමට උපකාරී වේ (Aaker, 1991).

වෙළඳ නාම පිළිබඳ දැනුවත්භාවය යනු විවිධ තත්ත්වයන් යටතේ වෙළඳ නාමය හඳුනාගැනීමට ඇති හැකියාවත් එහි නම, රූපය, සංකේතය සහ ආයතනය යනාදිය මතකයෙන් එකිනෙකට සම්බන්ධ කිරීමටත් ඒවා හඳුනාගැනීමටත් ඇති හැකියාවයි (Keller, 2008). වෙළඳ නාම ඇසුරු කිරීමට පෙර වෙළඳ නාම පිළිබඳ අවබෝධයක් තිබිය යුතුය (Aaker, 1991). එයට හේතුව නම් වෙළඳ නාම ඇසුරු කිරීම වැඩිදියුණු කිරිමට පෙර වෙළඳ නාමය පිළිබඳව පාරිභෝගිකයාට අවබෝධයක් තිබිය යුතු බැවිනි. වෙළඳ නාම ඇසුරු කිරීමෙන් නිරූපණය වන්නේ වෙළඳ නාමයට ඇති පක්ෂපාතීත්වය සහ මිලදී ගැනුම් තීරණය සඳහා වන මූලධර්මයයි (Aaker, 1991).

මිනිසුන්ගේ අවශ්‍යතා විවිධාකාර වන අතර එක් එක් පුද්ගලයාට ස්වාධීන වූ විනිශ්චයන් පවතියි. එම නිසා විවිධාකාර වූ පාරිභෝගිකයන් පිළිබඳවත් ඔවුන්ගේ පෞරුෂත්වයන්, අවශ්‍යතා සහ කැමැත්ත පිළිබඳවත් දැනුවත්ව සිටීම ඉතා වැදගත් වේ. ස්ථිර ගුණාත්මකභාවය යනු අපේක්ෂිත අරමුණට සාපේක්ෂව නිෂ්පාදිතයක් හෝ සේවාවක් පිළිබඳ සමස්ත ගුණත්වය හෝ සුපිරිබව පිළිබඳ පාරිභෝගිකයන්ගේ දෘෂ්ටියයි (Aaker, 1991). වෙළඳනාම පක්ෂපාතිත්වය යනු ප්‍රතිවාදී වෙළඳ නාමයන් විසින් නිර්මාණය කරන ලද අලෙවිකරණ ආතතිය නොසලකා ඔවුන්ගේ අනුරූප මිලදී ගැනීම මගින් ප්‍රකාශිත විශේෂිත වෙළඳනාමයක් සමඟ සේවාදායකයාගේ සමීපභාවයයි. සමාගමක් නව නිෂ්පාදනයක් හෝ නව වෙළඳපලක් සංවර්ධනය කරන්නේ නම්, හොඳම ප්‍රතිඵලය ලබා ගැනීම සඳහා ඔවුන් තම වෙළඳ නාම පිළිබඳ දැනුවත්භාවය ප්‍රවර්ධනය කළ යුතුය. එයට හේතුව නම් සන්නාම පිළිබඳ දැනුවත්භාවය සන්නාම පක්ෂපාතීත්වයට ධනාත්මකව සම්බන්ධ වන බැවිනි (Aaker, 1991).

## 3. පර්යේෂණ ක්‍රමවේදය


ලකී ලංකා කිරි සැකසුම් පුද්ගලික සමාගමෙහි පාරිභෝගිකයන් පදනම් කරගත් වෙළඳ නාම කොටස් අධ්‍යයනය කිරීම සඳහා තෝරාගත් ජනගහනය වූයේ කොළඹ දිස්ත්‍රික්කයේ වාසය කරන ලකී ලංකා කිරි සැකසුම් පුද්ගලික සමාගමේ පාරිභෝගිකයින්ය. ලකී යෝගට් මිලදී ගන්නා නිශ්චිත ගනුදෙනුකරුවන් සංඛ්‍යාවක් ඔවුන් සතුව නොමැති බැවින් අධ්‍යයනය සඳහා ජනගහනය නොදන්නා ජනගහනයක් ලෙස සැලකිය හැක. කොළඹ ප්‍රදේශයේ ගනුදෙනුකරුවන් වෙත සෘජුවම අරමුණු කර ඇති හෙයින් මුළු දිස්ත්‍රික්කයම සළකා නොබැලූ අතර පහසු නියැදි ක්‍රමය මඟින් කොළඹ ප්‍රදේශයේ පාරිභෝගිකයන් 50 දෙනෙකු තෝරා ගන්නා ලදී. එහි දී ප්‍රශ්නාවලී ක්‍රමය මඟින් ප්‍රාථමික දත්ත රැස් කර ගන්නා ලදී. ද්විතික දත්ත ලෙස ලකී ලංකා කිරි නිෂ්පාදන ආයතනයේ සඟරා වාර්ෂික වාර්තා අභ්‍යන්තර වාර්තා සහ පාරිභෝගිකයා පදනම් කරගත් වෙළඳ නාම කොටස් හා විකුණුම් කාර්යය සාධනය සම්බන්ධ ප්‍රකාශිත වාර්තා පොත් සඟරා අන්තර්ජාලය මඟින් දත්ත එක්රැස් කරගන්නා ලදී. එසේ රැස්කරගත් දත්ත SPSS සහ Excel පරිගණක මෘදුකාංග මඟින් දත්ත විශ්ලේෂණය සිදුකරන ලදී. ස්වායත්ත හා පරායත්ත විචල්‍යයන්ගේ මට්ටම හඳුනා ගැනීම සඳහා විස්තරාත්මක විශ්ලේෂණයක් සිදුකරන ලදී. එමෙන්ම දත්ත ඉදිරිපත් කිරීම නිරීක්ෂණය කරන ලද දත්ත SPSS මෘදුකාංගය භාවිතයෙන් උක්ත ගැටලුවේ තත්ත්වය පහසුවෙන් හඳුනාගත හැකි පරිදි ඉදිරිපත් කිරීම සිදුවේ.

## 4. දත්ත විශ්ලේෂණය

අධ්‍යයනය මෙහෙයවීමට ලකී යෝගට් මිලදී ගනු ලබන පාරිභෝගිකයන් 50 දෙනෙකුගෙන් යුත් නියැදියට අදාළ තොරතුරු ප්‍රශ්නාවලියක් ආශ්‍රයෙන් රැස් කරගන්නා ලදී. එම දත්තවලට අනුව සංඛ්‍යාත්මක දත්ත පහත පරිදි වට ප්‍රස්තාර ආධාරයෙන් දක්වා ඇත.

### *4.1 පාරිභෝගිකයන්ගේ වයස් සංයුතිය*

රූප සටහන 1 : පාරිභෝගිකයන්ගේ වයස් සංයුතිය





*මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය (2019)*

ඉහත ප්‍රස්තාරයෙහි නියැදියේ වයස් සංයුතිය පෙන්වයි. එහි පෙන්නුම් කරන ආකාරයට පාරිභෝගිකයන් වයස් කාණ්ඩ හතරකට වර්ග කර ඇත. මේ අනුව වැඩිම පාරිභෝගිකයන් ප්‍රමාණයක් නියෝජනය වන වයස් කාණ්ඩ දෙකක් ඇත. එනම් වයස අවුරුදු 25ට අඩු සහ වයස අවුරුදු 26-35 අතර වන අතර එක් එක් කාණ්ඩය මුළු නියැදියෙන් 41% ක් නියෝජනය කරයි. එම නිසා එම කාණ්ඩ දෙක මුළු නියැදියෙන් 82% ක් නියෝජනය කරයි. මුළු නියැදියෙන් 13% ක් වයස 36-45 කාණ්ඩ නියෝජනය කරන අතර වයස අවුරුදු 45 ට වැඩි මුළු නියැදියෙන් 5% ක් ඇතුළත් වන අතර එය අවම සංඛ්‍යාව වේ.

***4.2 පාරිභෝගිකයන්ගේ ආදායම් ව්‍යාප්තිය***

රූප සටහන 2 : පාරිභෝගිකයන්ගේ ආදායම් ව්‍යාප්තිය





*මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය (2019)*

ඉහත ප්‍රස්තාරය මගින් නියැදියේ ආදායම් මට්ටමේ ව්‍යාප්තිය පෙන්නුම් කරයි. නියැදියෙන් 36% ක් රු.20,001-40,000 ත් අතර ආදායම් කාණ්ඩය වන අතර මෙය වැඩිම සංඛ්‍යාතය සහිත ආදායම් කාණ්ඩය වේ. නියැදියෙන් 29% ක් රු. 40,000-60,000 ආදායම් කාණ්ඩය සහ 20,000 ට අඩු ආදායම් කාණ්ඩය වන අතර 5% ක් නියෝජනය කරනු ලබන්නේ රු. 60,001-80,000 කාණ්ඩය වේ. රු. 100,000 ට වැඩි ආදායම් කාණ්ඩය නියෝජනය කරන්නේ 1% ක් පමණි. නමුත් ආදායම 80,001-100,000 නියෝජනය කරන කිසිදු පාරිභෝගිකයෙකු නොමැත.

***4.3 පාරිභෝගිකයන්ගේ අධ්‍යාපන සුදුසුකම්***

රූප සටහන 3: පාරිභෝගිකයන්ගේ අධ්‍යාපන සුදුසුකම්




*මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය (2019)*

ඉහත ප්‍රස්තාරයේ දැක්වෙන ආකාරයට ප්‍රතිචාර දැක්වූවන්ගේ අධ්‍යාපන මට්ටම පෙන්වයි. නියැදියෙන් 52% ක් උසස් පෙළ සමත් කාණ්ඩය නියෝජනය කරන අතර 27% ක් උපාධිධාරී කාණ්ඩය නියෝජනය කරයි. සා/පෙළ සමත් වූ සහ සා/පෙළ දක්වා කාණ්ඩය නියැදියෙන් 13% සහ 7% නියෝජනය වන අතර පශ්චාත් උපාධි කාණ්ඩයට අයත් වන්නේ 1% ක් පමණි.

මෙහිදී ස්වායත්ත විචල්‍ය 4ක් සහ එක් පරායත්ත විචල්‍යයක් සහිතව ප්‍රධාන විචල්‍යයන් පහක් ඇත. වෙළඳ නාම පිළිබඳ දැනුවත්භාවය, වෙළඳ නාම ඇසුරු කිරීම, අවබෝධකරගත් ගුණාත්මක බව, සන්නාම පක්ෂපාතීත්වය ස්වායත්ත විචල්‍යයන් වන අතර විකුණුම් කාර්යය සාධනය රඳා පවත්න විචල්‍යය වේ. වෙළඳ නාම පිළිබඳ දැනුවත්භාවය, සන්නාම ඇසුරු කිරීම, අවබෝධකරගත් ගුණාත්මක බව, සන්නාම පක්ෂපාතීත්වය පාරිභෝගිකයා පදනම් කරගත් වෙළඳ නාම කොටස් වල සාධක වේ. ඒ අනුව ප්‍රශ්නාවලියෙන් ලබාගත් දත්ත ස්වායත්ත හා පරායත්ත විචල්‍යයන්ගේ මට්ටම හඳුනා ගැනීම සඳහා විස්තරාත්මක විශ්ලේෂණයක් සිදු කරන ලදී. එක් එක් විචල්‍යයේ මධ්‍යන්‍යය අගය විචලන මට්ටම නියෝජනය කරයි. ස්වායත්ත විචල්‍යයන් හතරක් සහ පරායත්ත විචල්‍යය සඳහා ගණනය කරන ලද විස්තරාත්මක සංඛ්‍යාලේඛන පහත වගුවේ දැක්වේ. පාරිභෝගිකයන්ට ඔවුන්ගේ පිළිතුරු ලකුණු (5) ක සමාන පරිමාණයකින් දැක්වීමට ඉල්ලා සිටින අතර එක් එක් විචල්‍යවල වත්මන් මට්ටම අවබෝධ කර ගැනීම සඳහා මධ්‍යය අගය සහ සම්මත අපගමනය ගණනය කරනු ලැබේ.

වගු අංක 04: විස්තරාත්මක දත්ත

| Variable | N | Mean | Std |
|---|---|---|---|
| වෙළඳනාම පිළිබඳ දැනුවත්භාවය | 50 | 3.092 | 0.54091 |
| වෙළඳනාම ඇසුරුකිරීම | 50 | 3.722 | 0.45756 |
| ප්‍රත්‍යක්ෂ ගුණාත්මකභාවය | 50 | 3.913 | 0.49422 |
| වෙළඳනාම පක්ෂපාතීත්වය | 50 | 3.535 | 0.60422 |
| විකුණුම් කාර්යය සාධනය | 50 | 3.605 | 0.70703 |

*මූලාශ්‍රයː නියැදි සමීක්ෂණය (2019)*

ඉහත වගුවට අනුව, ප්‍රත්‍යක්ෂිත ගුණාත්මකභාවය 0.49422ක සම්මත අපගමනය සමඟ 3.9ක ඉහළම මධ්‍යයන්‍යය අගය ඇති අතර වෙළඳනාම පිළිබඳ දැනුවත්භාවය අවම මධ්‍යයන්‍යය අගය 3.092 හා 0.64091 සම්මත අපගමනය සමඟ ඇත. සන්නාම සංගමයේ සහ වෙළඳ නාමයේ පක්ෂපාතීත්වයේ මධ්‍යයන්‍යය අගයන් පිළිවෙලින් 3.722 සහ 3.535 ක් වන අතර පාරිභෝගික විකුණුම් කාර්යය සාධනය 3.605 මධ්‍යයන්‍යය අගයක් පෙන්වා ඇත. සමස්තයක් ලෙස, විචල්‍යය සඳහා වන සියලු මධ්‍යයන්‍යය අගයන් 4 ට වඩා අඩුය. එයින් පෙන්නුම් කරන්නේ මෙම විචල්‍යයන් කිසිවක් එනම්, ස්වායත්ත සහ පරායත්ත විචල්‍යයන් කිසිවක් සතුටුදායක මට්ටමක ක්‍රියාත්මක නොවන බවයි. 3.605 පාරිභෝගික විකුණුම් කාර්යය සාධනයේ මධ්‍යයන්‍යය අගය පෙන්නුම් කරන්නේ මූලික අධ්‍යයනයේදී සොයාගෙන ඇති පරිදි ලකී යෝගට් හි පාරිභෝගික විකුණුම් කාර්යයසාධනයේ මට්ටම ඉතා අඩු බවයි.

### 4.4 සහසම්බන්ධතා විශ්ලේෂණය

ස්වායත්ත විචල්‍යයන් සහ පරායත්ත විචල්‍යය අතර සම්බන්ධතාවය තේරුම් ගැනීමට සහ සම්බන්ධතා විශ්ලේෂණයක් සිදුකරන ලදී.

| Variable | |
|---|---|
| වෙළඳනාම පිළිබඳ දැනුවත්භාවය | 0.69655 |
| වෙළඳනාම ඇසුරුකිරීම | -0.3968 |
| ප්‍රත්‍යයක්ෂ ගුණාත්මකභාවය | -0.42014 |
| වෙළඳනාම පක්ෂපාතීත්වය | 0.99703 |

*මූලාශ්‍රයː නියැදි සමීක්ෂණය (2019)*

ඉහත වගුවට අනුව, වෙළඳනාම පක්ෂපාතීත්වය ප්‍රබල ධන සහ සම්බන්ධයක් පෙන්නුම් කරන අතර සහ සම්බන්ධතා අගය 0.99703 වේ. ඒ අනුව වෙළඳනාම පක්ෂපාතිත්වය වැඩි වන විට විකුණුම් කාර්යය සාධනය වැඩි වේ. මෙහිදී ස්වායත්ත විචල්‍යය හා පරායත්ත විචල්‍යය අතර ධන සහ සම්බන්ධයක් පවතී. වෙළඳනාම දැනුවත්භාවය දුබල ධන සහ සම්බන්ධයක් පෙන්නුම් කරන අතර සහ සම්බන්ධතා අගය 0.69655 වේ. ඒ අනුව වෙළඳනාම දැනුවත්භාවය සහ විකුණුම් කාර්යය සාධනය අතර දුබල ධන සහ සම්බන්ධතාවයත් පවතියි. වෙළඳනාම ඇසුරුකිරීම සහ ප්‍රත්‍යයක්ෂ ගුණාත්මකභාවය දුබල සෘණ සහ සම්බන්ධතාවක් පෙන්නුම් කරන අතර එහි සහ සම්බන්ධතා අගයන් පිළිවෙලින් -0.3968 සහ -0.42014 ලෙස දැක්වෙයි.

**5. සමාලෝචනය**

බොහෝ රටවල ආර්ථිකයට කිරි කර්මාන්තය සක්‍රීයව දායක වේ. එය ලෝක ජනගහනයේ විශාල කොටසකට ආර්ථික පෝෂණ සහ සමාජ ප්‍රතිලාභ ලබා දෙමින් ගෝලීය ආර්ථික පද්ධතියේ වැදගත් අංගයක් වන අතර කළමනාකරුවන්ට තම සේවාදායකයින් තෘප්තිමත් ගනුදෙනුකරුවන් ලෙස තබා ගැනීම අභියෝගයකි. පොදුවේ සළකා බැලීමේදී මෙම අධ්‍යයනයේ අරමුණ සාක්ෂාත් කරගෙන ඇත. කොළඹ ප්‍රදේශයේ ගනුදෙනුකරුවන් පදනම් කරගත් වෙළඳනාම කොටස් සහ විකුණුම් කාර්යය අතර සම්බන්ධතාව පරීක්ෂා කිරීමේ අරමුණින් මෙම අධ්‍යයනය සිදුකරන ලදී. මෙහිදී ස්වායත්ත විචල්‍යයන් වන්නේ වෙළඳ නාම පිළිබඳ දැනුවත්භාවය, වෙළඳ නාම ඇසුරු කිරිම, ස්ථිර ගුණාත්මකභාවය සහ වෙළඳ නාම පක්ෂපාතීත්වයයි. විකුණුම් කාර්යයය පරායත්ත විචල්‍යයි.

මෙම අධ්‍යයනයේ සොයා ගැනිම් මගින් මෙම ස්වායත්ත විචල්‍යයන් පාරිභෝගිකයා පදනම් කරගත් වෙළඳ නාම කොටස් හා සම්බන්ධ වන අතර පාරිභෝගිකයා පදනම් කරගත් වෙළඳ නාම කොටස් පාරිභෝගික විකුණුම් කාර්යය සමග සැලකිය යුතු ලෙස සම්බන්ධ වන බව පෙන්වා දිය හැක. මෙම අධ්‍යයනයෙන් පෙනී යන්නේ වෙළඳ නාම පක්ෂපාතිත්වය අනෙකුත් විචල්‍යයන්ට වඩා ලකී යෝගට් හි විකුණුම් කාර්යය කෙරෙහි වැඩි බලපෑමක් කරන බවයි. මෙම අධ්‍යයනයේදී සිදුකරන ලද සහ සම්බන්ධතා විශ්ලේෂණයේදී වෙළඳනාම පිළිබඳ දැනුවත්භාවය හා පක්ෂපාතීත්වය ප්‍රබල ධන සහ සම්බන්ධයක් පෙන්නුම් කරන අතර ඉහළ බලපෑමක් පෙන්නුම් කරයි. වෙළඳනාම ඇසුරුකිරිම සහ ප්‍රත්‍යක්ෂ ගුණාත්මකභාවය දුබල සෘණ සහ සම්බන්ධතාවක් පෙන්නුම් කරන අතර අඩු බලපෑමක් පෙන්නුම් කරයි. වෙළඳ නාම පක්ෂපාතීත්වය සහ වෙළඳනාම පිළිබඳ දැනුවත්භාවය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරිම තුළින් විකුණුම් කාර්යය සාර්ථක කරගත හැකි බව මෙම අධ්‍යයනය තුළින් පෙන්වා දිය හැක.

එසේම විකුණුම් කාර්යය කෙරෙහි ස්වාධීන විචල්‍යයන් හතරම අඩු වැඩි වශයෙන් යම් බලපෑමක් සිදු කරන බව පෙන්වා දිය හැක. අධ්‍යයනය තුළින් සොයා ගනු ලබන මෙම සාධක පිළිබඳ සලකා බැලුව හොත් දිගු කාලීනව තරඟකාරී වාසි අත්කර ගැනිමෙන් සහ වෙළඳපල ස්ථානය දිනා ගැනිමෙන් සමාගමට ඔවුන්ගේ තරඟකරුවන්ට වඩා තරඟකාරී විය හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


Aaker, D. (1991) *Managing Brand Equity. Capitalizing on the Value of a Brand Name.* Free Press: New york

Cobb-Walgren, C. J., Ruble C. A., & Donthu N. (1995) Brand equity, brand preference, and purchase intent, *Journal of Advertising*, 24, 25-40

De Chernatony, L. and McDonald, M. (2003), *Creating Powerful Brands*, Fourth Edition, Butterworth – Heinemann.

Farquhar, P. H. (1989), Managing Brand Equity, *Marketing Research*, 1, 24-34.

Kotler, P., & Armstrong, G. (2009). *Principles of marketing* (7th ed.). New Jersey: Prentice-Hall International Inc.

Keller, K. L. (2008). *Strategic Brand Management*. 3rd edition. Upper Saddle River, NJ: Prentice Hall.

Leuthesser, L. (1988). Defining, measuring and managing brand equity. *A conference summary*, Marketing Science Institute, Cambridge MA.

Rios, R. E. (2007). Sources and antecedents of brand equity for online companies. *PhD Interdisciplinary Journal, 3,* 1-240.

## කර්තෘ නාමාවලිය


| | |
|---|---|
| ගුණරත්න, ඩි. ඩි. ඩබ්. එන්. | 13 |
| ගුණරත්න, ඩි. ඩි. වයි. එන්. | 13 |
| චතුරංගනි, ඩී. ඒ. කේ. | 39 |
| චන්ද්‍රසේන, ඩබ්. එච්. ඩී. එස්. | 81 |
| ඩයස්, කේ. එම්. ජී. එම්. | 1, 13 |
| දිසනායක, ආර්. පී. එස්. එස්. | 49 |
| බණ්ඩාර, බී. ජී. ටී. ඩී. | 69 |
| රණතුංග, ආර්. ආර්. ඒ. එල්. ඩබ්. | 13 |
| ලියනගේ, කේ. ඩී. | 13 |
| සමරකෝන්, එස්. එම්. එම්. එච්. | 69 |


## Author Index


| | |
|---|---|
| Malagala, D. K. M. | 25 |
| Pathirana, P. T. | 25 |
| Perera, A. P. D. N. | 25 |
| Ranathunga, R. R. A. L. W. | 25 |
| Rasanjalee, M. | 25 |
| Ubesekara, K. K. S. U. I. | 59 |